ISSN 1391 - 1031
2012 මැයි
18 වෙළුම 02 කලාපය
ආධාරය රු 30/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

''විප්ලවවාදියෙකු වීම සහ සාමාන්‍යයෙන් සමාජවාදයට හෝ කොමියුනිට්වාදයට පක්ෂවීම ප්‍රමාණවත් නොවේ. මුළු දම්වැලම අල්ලා ගැනීම සඳහා සහ ඊළඟ පුරුක වෙත සංක්‍රමණය වීමට දැඩිසේ සූදානම් වීම සඳහා, එක් එක් විශේෂ අවස්ථාවේදී ඔබ ඔබගේ මුළුවැරයොදා අල්ලාගත යුත්තේ දම්වැලෙහි කුමන පුරුකද යන්න සොයා ගැනීමට ඔබට පුළුවන් විය යුතුය.''

(ලෙනින් තෝරාගත් කෘති - 8 වෙළුම, 26 පිටුව)




3 ආණ්ඩුව මංමුලා වීම...




අරමුණක් නැතිව අයාලේ යන යන්නේ කොහේද? යන්නේ කෙසේද? යන්නේ කා සමගද? නොදැන ඉබාගාතේ වල්මත්ව ඇවිදින හා ජනතාවද වල්මත් කර ඇති...

5 සංවාදය



මේ නිසා ලංකාවට එරෙහි අධිරාජ්‍යවාදී මැදිහත්වීම් අහම්බයක් හෝ සරල හේතුවක් නිසා සිදුවන දෙයක් නොවේ. එය ඔවුන්ගේ උපායමාර්ගික වුවමනාව නිසා...

8-9 විශේෂ



පාලකයන්ගේ පීඩනය ඉවසා දරාගෙන එයට එරෙහිව කිසිවක් නොකොට සිටීමට පීඩිත ජනතාව දරන ලද උත්සාහයන් තවදුරටත් වලංගු නොවන බව...

11 ආණ්ඩුවේ ජීවන වියදම..



1977 දී හඳුන්වා දුන් විවෘත ආර්ථික මොඩලය පැවැති රාජ්‍ය ඒකාධිකාරී ධනවාදයට සාපේක්ෂව වඩා ඉහළ වර්ධනයක් ඉලක්කම්වලින් ...

සිත්තම................. 06
කාලීන.................... 07
දැනුම..................... 10
කාන්තා.................. 12
ජාත්‍යන්තර............. 13
විශේෂාංග............. 14




# අධිරාජ්‍යවාදයත් ධනවාදයත් එක්ව පැරදවීමට

# අධිරාජ්‍යවිරෝධී පුළුල් පෙරමුණක්!

**ආර්ථික, දේශපාලන හා සමාජීය ක්ෂේත්‍රයන්හි වේගයෙන් ඉහළ යමින් ඇති අධිරාජ්‍යවාදී මැදිහත්වීම් සහ කොල්ලකාරී නව ලිබරල් ධනවාදය එක්ව පරාජය කිරීමට ජනතාව පෙළගස්වන අධිරාජ්‍යවිරෝධී පුළුල් පෙරමුණක් බිහිවීමට නියමිත බව වාර්තා වේ.**

අධිරාජ්‍යවාදයේ ගෝලීය අර්බුදයට සාපේක්ෂව ලංකාව ඇතුළු පරිධියේ පිහිටි රටවලට කෙරෙන අධිරාජ්‍යවාදී මැදිහත්වීම් වේගවත් වෙමින් ඇති අතර රාජපක්ෂ ආණ්ඩුව ඒ අනුව යමින් එයට අවශ්‍ය පහසුකම් සලසමින් සිටී. අධිරාජ්‍යවාදයෙන් හා නව ලිබරල් ධනවාදයෙන් පරිපීඩිත ජනතාව ඊට එරෙහිව පෙළගැසෙද්දී තම පැවැත්ම තකා අධිරාජ්‍යවාදයට එරෙහි ඊනියා සටන්පාඨවලට මුවාවීමට ආණ්ඩුව උත්සාහ කළද අධිරාජ්‍යවාදය හා නව ලිබරල් ධනවාදය සමඟ වන ආණ්ඩුවේ එකඟතාව තවදුරටත් රටට සැඟවිය හැකි නොවේ.

මේ තත්වය තුළ ජනතා විමුක්ති පෙරමුණ මෙවර මැයි දින තේමාව ලෙසින්ද තෝරා ගෙන ඇත්තේ, 'අධිරාජ්‍යවිරෝධී පෙරමුණක්! සමාජවාදී පාලනයක්!!' යන්නය. පවතින සමාජ, ආර්ථික, දේශපාලන කොන්දේසිවලින් වැඩියෙන්ම බැටකන හා ඊට එරෙහිව නොසැලී සටන් වැදීමේ හැකියාව ඇති වැඩ කරන ජනතා බලවේගයට අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරයේ පෙරමුණු කාර්යභාරය පැවරෙනු ඇති බව සඳහන්ය.

අධිරාජ්‍යවාදයෙන් හා නව ලිබරල් ධනවාදයෙන් පීඩාවට පත් වැඩකරන ජනතාව ප්‍රමුඛ කරගත් සමාජයේ සියලු කොටස් ඒකරාශී කර ගනිමින් ගොඩනැගෙන මෙම අධිරාජ්‍යවිරෝධී පෙරමුණ, රටට හා ජනතාවට ආදරය කරන සියලු දෙනාට විවෘත වනු ඇත. අධිරාජ්‍යවාදයත් අධිරාජ්‍යගැති ධනපති පාලනයත් පෙරළා දමා සමාජ සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික සමගිය, ආර්ථික සංවර්ධනය ගොඩනගන සමාජවාදී පාලනයක් ස්ථාපිත කිරීම මෙහි අවසන් අරමුණය.

මෙම පෙරමුණ ගොඩනැගීම ඉලක්ක කර ගනිමින් ජනතා විමුක්ති පෙරමුණ පසුගිය කාලය තුළ වෘත්තීය සමිති, ගොවි හා ධීවර සංවිධාන, අධිරාජ්‍යවිරෝධී බහුජන සංවිධාන හා විවිධ පුද්ගලයින් සමග සංවාදයක් ආරම්භ කර තිබූ අතර එයට ලැබුණු ඉහළ ප්‍රතිචාර හේතුවෙන් මැයි මාසයේ අග භාගය වන විට එය සංවිධානයක් ලෙස එළිදැක්වෙනු ඇත.

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**



# වැඩ බිම



# බදු බරේ සැබෑ හේතුව ආණ්ඩුවේ මූල්‍ය අර්බුදයයි!

**ජනතා විමුක්ති පෙරමුණ**

බදු වැඩි කිරීම්වල සැබෑ හේතුව ආණ්ඩුව මුහුණදී ඇති විසඳිය නොහැකි මූල්‍ය අර්බුදය මිස අන් යමක් නොවන බව ජනතා විමුක්ති පෙරමුණ පවසයි. මේ බව සඳහන් වූයේ, ආණ්ඩුව විසින් එකවර විශාල ප්‍රමාණයකින් බදු ඉහළ දැමීමට විරෝධය පළ කරමින් ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය විසින් පසුගිය 02වැනි දින නිකුත් කරන ලද නිවේදනයකය.

වහාම ක්‍රියාත්මක වන පරිදි ආණ්ඩුව විසින් භාණ්ඩ රැසක් සඳහා එකවර බදු ප්‍රමාණයන් විශාල ලෙස වැඩිකර තිබේ. ඉන්ධන මිල ඉහළ දැමීම නිසා, බස් ගාස්තු හා විදුලි ගාස්තු ඉහළ දැමීම නිසා, පීඩාවට පත්ව සහනයක් ඉල්ලා සිටින ජනතාව මත මෙලෙස යළි බදුබර පැනවීම ගහෙන් වැටුණු මිනිහාට ගොනා පැන පැන අනිනවා වැනි දෙයකි. මෙවර බදු ඉහළ දමා භාණ්ඩ මිල වැඩිකිරීමේදී ආණ්ඩුව එය සිදුකර ඇත්තේ ජනතා විරෝධය ඇති නොවන ලෙස උපක්‍රමශීලීවය. සිගරට් හා මත්පැන් බදු වැඩි කොට ඉන් රුපියල් කෝටි ගණනක් ආදයම් ලබා ගන්නා ආණ්ඩුව පවසනු ඇත්තේ දුම්වැටි හා මත්පැන්වලින් ජනතාව මුදාගැනීම සඳහා මෙලෙස කළ බවය. මෙයට කිසිවකු විරෝධය පාන්නේද නැත. එහෙත් ආණ්ඩුව මේ මගින් උදුරාගන්නේ සාමාන්‍ය ජනතාව ඇති තුට්ටු දෙකය.

අනෙක් අතට මෝටර් සයිකල්, ත්‍රීවිලර් ඇතුළු වාහන ආනයන බදු මහා පරිමාණයෙන් වැඩිකර තිබේ. ඒ සඳහා දැනටමත් ආණ්ඩුව පවසා ඇත්තේ, අධික ඉන්ධන පරිභෝජනය සීමා කිරීම සඳහාත් වාහන ආනයනය වෙනුවෙන් රටින් ඉවතට යන මුදල් (ඩොලර්) ප්‍රමාණය අඩුකර ගැනීම සඳහාත් මෙම පියවර ගත් බවය. එපමණක් නොව ඉන්දියානු බඩු ගෙන්වීම සීමාකොට ඉන්දියාවට පාඩමක් ඉගැන්වීම සඳහා මෙය කළ බවද දේශප්‍රේමී විකට ඇමැතිවරු කියනු ඇත. මේ කුමන කතා කීවද සිදුව ඇත්තේ, සාමාන්‍ය රැකියා කරන කුඩා ව්‍යාපාර කරන ජන කොටස් මත හා මැද පාන්තික ජන කොටස් මත විශාල බදු බරක් පැටවීමය. මෝටර් සයිකල් මිලදී ගන්නේ, බොහෝ විට රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා කරන පිරිස් නිසා ඔවුන් මත අසීමිතව බරක් පැටවීම වැළැක්විය නොහැක.

මීට අමතරව පාන් පිටි මිල ඉහළ යන බවටද මාධ්‍ය වාර්තා කර තිබේ. පාන් පිට මිල ඉහළ දමන්නේ, එක්සත් ජනපදයට පාඩමක් ඉගැන්වීමට යැයි විකට ඇමැති කීවොත් පුදුමවිය යුතු නැත. එහෙත් සැබෑ ලෙස පාඩම් ඉගැනගැනීමට සිදුවන්නේ, පොදු ජනතාවටය.

මෙම බදු වැඩි කිරීම්වල සැබෑ හේතුව ආණ්ඩුව මුහුණදී ඇති විසඳිය නොහැකි මූල්‍ය අර්බුදය මිස අන් යමක් නොවේ. එක් අතකින් රුපියල කඩා වැටී තිබේ. අනෙක් අතින් ආණ්ඩුවේ (නාස්තිකාර) වියදම් සඳහා මුදල් සොයාගැනීමට ජනතාවගේ එදිනෙදා අවශ්‍ය භාණ්ඩ මත බදු පිට බදු පැනවීමට සිදුව තිබේ. ඉන් කියා පාන්නේ, ලංකාවේ නිෂ්පාදනය කරන වත්කම් උපයන ආර්ථිකයක් නැති බවය. ආණ්ඩුව නිෂ්පාදනය මගින් ආදායම් උපයන්නේ නැති වූවාට ආණ්ඩුවේ වියදම් අඩු වන්නේ නැත. ඒ වෙනුවට ඔවුන්ගේ විසඳුම වන්නේ බදු ගැසීමය.

නැවත නැවතත් බදු ගැසීමය. නව ලිබරල්වාදය කර පින්නා ගෙන බංකොළොත් විවෘත ආර්ථිකය අනුගමනය කරමින් මූල්‍ය අරමුදලේ උපදෙස් මත පවත්වාගෙන යන ආර්ථිකයක් හා එය ප්‍රතිපත්තිය කරගත් ආණ්ඩුවකින් මීට වැඩි දෙයක් බලාපොරොත්තු විය නොහැක. කෙසේ වෙතත් ආණ්ඩුව ජනතාවට අලුත් අවුරුදු ත්‍යාගයක් දී තිබේ. ඒ දරා ගැනීමට නොහැකි බදු බරකි. ආණ්ඩුවේ මෙම ජනතාවිරෝධී ක්‍රියාමාර්ග වැළැක්වීම සඳහා ඊට විරෝධය පෑම සඳහා ජනතාව පෙළ ගැසිය යුතුය. ආණ්ඩුවේ නාස්තිකාර වියදම් වහාම නවත්වන ලෙසත් ජනතාව මත බදුබර පැටවීම නවතා ජනතාව සහන සලසන ලෙසත් අපි ආණ්ඩුවට බල කරමු.

# පොදු ජනතාව ආගමික සීමා ඔස්සේ බේද හින්න කොට පටු අරමුණු ඉටුකරගැනීමට මාන බලන විවිධ කණ්ඩායම්වල උත්සාහයන් පරාජය කරමු

**ජනතා විමුක්ති පෙරමුණ**

පසුගියදා දඹුල්ල ප්‍රදේශයේ උද්ගත වූ නොසන්සුන්කාරී වාතාවරණය පිළිබඳව අනතුරු අඟවමින් ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය පසුගිය 22වැනි දින මාධ්‍ය නිවේදනයක් නිකුත් කළේය. එය සම්පූර්ණයෙන් මෙසේය.

පසුගිය 20වැනි දින දඹුල්ල ප්‍රදේශයේ උද්ගතවී ඇති මහජන කැලඹිලිකාරී තත්වයක් පිළිබඳව ජනමාධ්‍ය විසින් වාර්තා කර තිබේ. දඹුල්ල පූජා භූමියක ඇතැයි කියනු ලබන අනවසර ඉදිකිරීම් ඉවත් කරන ලෙසට බලකරමින් සිදුවී ඇති මෙම උද්ඝෝෂණත් ඒවා කෙරෙහි ආණ්ඩුව විසින් දක්වා ඇති ප්‍රතිචාරත් පිළිබඳව සමාජයේ අවධානය යොමු විය යුතු යැයි අපි විශ්වාස කරමු.

වසර 30කට වැඩි බෙදුම්වාදී යුද්ධයකින් බැට කා හෙම්බත්ව සිටින ලාංකේය සමාජය එබඳුම ව්‍යසනකාරී තත්වයකට පත්විය හැකි ආගම් අතර ගැටුමක් නිර්මාණය වීමට ඉඩ හැරීම ඉතාම හානිකර ප්‍රතිඵල ඇතිවිය හැකි තත්වයකි. මෙවැනි තත්වයක් නිර්මාණයවීම වැළැක්වීමට කටයුතු කරනවා වෙනුවට, එවැනි ගැටලු නිර්මාණය වූ වහාම ඒවා විසඳීමට කටයුතු කරනවා වෙනුවට ආණ්ඩුවත් ආණ්ඩුවේ ඇමතිවරුත් හැසිරෙමින් සිටින්නේ ඇවිලෙන ගින්නට පිදුරු දමන ආකාරයෙනි. ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගේ අනුග්‍රහාත්මක ප්‍රකාශ සහ එම සිදුවීම් ආශ්‍රිත තර්ජනය කිරීම් හමුවේ ආණ්ඩුවේ හැසිරීම මගින් පෙන්නුම් කරන්නේ එයය. ජනතා විරෝධි හා අධිරාජ්‍යගැති ක්‍රියාමාර්ග හමුවේ ගරා වැටෙමින් ඇති තම ජනපදනම ජාතිවාදී ආගම්වාදී රැළි මත පාවී යමින් ආරක්ෂා කර ගත හැකි යැයි ආණ්ඩුව සිතනවා විය හැකිය. එහෙත් දශක 6කට වැඩි ලාංකේය දේශපාලනය පෙන්වා දෙන බරපතළ යථාර්ථය වන්නේ, කෙටිකාලීන එබඳු අමනෝඥ හැසිරීම් ආණ්ඩුවල දේශපාලන සෞඛ්‍යය ආරක්ෂා නොකරනවා පමණක් නොව මුළුමහත් රටද අගාධයකට හෙළා ඇති බවය.

අතීතයේ ජාතිවාදය වැපිරීම නිසා බෙදුම්වාදය පෝෂණය වී වසර 30ක් පුරා පැවැති විනාශකාරී යුද්ධයක් බවටද එය පත්වී ඉන් බැටකා සිටින රටක් තුළ, තවමත් එහි ප්‍රතිවිපාකවලට මුහුණදෙමින් සිටින රටක එවැනිම වර්ගයේ ආගම් අතර ගැටුම් ඇවිලීමට හා ඒවා වර්ධනයවීමට කිසිසේත්ම ඉඩ නොතැබිය යුතුය. සියලු ආගම්වලට අයත් ජනතාව එය තේරුම්ගනු ඇතැයි අපි සිතමු.

අනවසර ඉදිකිරීමක් හෝ එවැනි නීතිවිරෝධී තත්වයන් ඇත්නම් ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවේ අදාල නීතිය ක්‍රියාත්මක කරන අංශ මැදිහත්වී කටයුතු කළ යුතුව තිබේ. එසේ නොකර ජාතිවාදයට ආගම්වාදයට වැඩෙන්නට සරු පසක් නිර්මාණය කිරීමටත් අවසානයේ ඒමත දිගහැරෙන සිදුවීම්වල පටු දේශපාලන වුවමනාකම් ඉටුකරගැනීමටත් ඉඩහරින ආණ්ඩුවේ හැසිරීම පිළිකුල් සහගතය.

හුදෙකලා ලෙස පෙනෙන මෙබඳු සිදුවීම් පිටුපස වන බරපතළ දේශපාලන අවදානම අදාල බරින් තේරුම් ගන්නා ලෙසත් රටත් ජනතාවත් මුහුණපා ඇති සැබෑ ප්‍රශ්නවලින් ජනතා අවධානය වෙන අතකට යොමු කරවන පොදු ජනතාව ආගමික සීමා ඔස්සේ බේද හින්න කොට තම තමන්ගේ පටු අරමුණු ඉටුකරගැනීමට මාන බලන ආණ්ඩුවේත් විවිධ කණ්ඩායම්වලත් උත්සාහයන්ට හසු නොවන ලෙසත් ආගම්වාදී ගැටුමකට ඉඩ නොතබන ලෙසත් සියලුම ආගම්වලට අයත් සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ඇතුලු සියලුම ජනතාවන්ගෙන් අපි මහත් ඕනෑකමින් ඉල්ලා සිටිමු.

# ශ්‍රී ලාංකිකයෙක් හදන්න ධනපතියන්ට කවදාවත් බැහැ!

**ලාල්කාන්ත සහෝදරයා**




මේ රටේ පොදු භාෂාවක් නිර්මාණයවීම 48 ට පෙරත් පසුත් වළක්වාලූ බවත් රටේ සිංහලයකු, දෙමළෙකු වනවාට වඩා විය යුත්තේ, ශ්‍රී ලාංකිකයකු වීම බවත් පෙන්වා දුන් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයා ශ්‍රී ලාංකිකයෙක් බිහිකිරීමට මේ ධනපතියන්ට කිසිදා නොහැකි බවත් එය කළ හැක්කේ, සමාජවාදී විප්ලවයට පමණක් බවත් අවධාරණය කළේය.

ඔහු මෙම අදහස් පළකළේ, පසුගිය 24වැනි දින කටුබැද්ද ජනකලා කේන්ද්‍රයේ පැවති 'අධිරාජ්‍යවාදී කඩාපැනීමට එරෙහි වැඩකරන ජනතා බලය' තේමාව යටතේ පැවැත්වූ සම්මන්ත්‍රණයකට සහභාගි වෙමිනි.

''ජාත්‍යන්තර පාසල් තිබුණට ශ්‍රී ලාංකික පාසල් නැහැ. තියෙන්නෙ සිංහල පාසල්, දෙමළ පාසල්, මුස්ලිම් පාසල්. පොදු භාෂාවක්, පොදු සංස්කෘතියක් ඇති ශ්‍රී ලාංකිකයෙක් හදන්න පුළුවන් සමාජවාදී විප්ලවයට විතරයි. අධිරාජ්‍යවාදීන්ගෙ කඩාපැනීමත් එතකොට ඉවරයි. රනිල් වික්‍රමසිංහගේ සටන් විරාමයෙන් එළියට එන්න නම් රනිල් වික්‍රමසිංහ පරාද කළ යුතු වුණා. ඒ වගේම තමයි අධිරාජ්‍යවාදී කඩා පැනීම් නැවැත්වීමට නම් මහින්ද රාජපක්ෂ පැරදවිය යුතුයි.

වැඩ කරන ජනතාව ප්‍රමුඛ කරගත් බලවේගයකට විතරයි, සැබෑ ලෙස අධිරාජ්‍යවාදය පරාජය කළ හැකි වන්නේ. කම්කරු ව්‍යාපාරය ඒකාබද්ධ කරගත් අධිරාජ්‍ය විරෝධී පෙරමුණක් වටා සියලු දෙනා එකතු විය යුතුයි.'' ලාල්කාන්ත සහෝදරයා වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

# වැටුප් ගැටලු ඉහළට - බැංකු සේවකයෝ සටනට



පවතින ජීවන වියදම හමුවේ බැංකු සේ-වකයින් සඳහා වැටුප් වැඩිකිරීමක් ලබාදෙන ලෙස ආණ්ඩුවට බල කිරීම සඳහා වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ආරම්භ කරන බව සමස්ත ලංකා බැංකු සේවක සංගමය පවසයි. මේ වන විට ආණ්ඩුව විසින් ඉන්ධන, විදුලි, බස් ගාස්තු ඉහළ දැමීම නිසා පවතින ආර්ථික තත්වයට මුහුණ දීමට නම් අනිවාර්ය වැටුප් වැඩිවීමක් ලබා දිය යුතු බව එම සංගමයේ ප්‍රධාන ලේකම් ගාමිණී රත්නසිරි සහෝදරයා පැවසීය. ඔහු මේ බව පැවසුවේ පසුගිය 05වැනිදා එම සංගම් කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවක් අමතමිනි.

රජයට විශාල වශයෙන් ලාභ උපයා දෙන බැංකු සේවකයින්ගේ වැටුප් වැඩිවීම සිදුකළ යුතු බව පවසන ඔහු මේ සඳහා වෘත්තීය ක්‍රියාමාර්ගවලට පිවිසෙන බව කියා සිටියේය. එහි පළමු අදියර ලෙස පසුගිය 04වැනිදා කොළඹදී උද්ඝෝෂණ ව්‍යාපාරයක්ද පැවැත්විණි.

# ඉල්ලීම්වලට විසඳුම් නැහැ. විදුලි සේවකයෝ සටන් මගට



වැටුප් වැඩිකරන ලෙස ඉල්ලා විදුලි බල මණ්ඩල සේවකයින් විසින් කරන ලද ඉල්ලීම් ආණ්ඩුව විසින් නොසලකා හැරීම හේතුවෙන් මණ්ඩලයේ සියලු සේවකයින්ට දැඩි වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට යාමට සිදුවී ඇතැයි ලංවිම ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානය වෙනුවෙන් රංජන් ජයලාල් සහෝදරයා පවසයි.

මෙහි එක් පියවරක් ලෙස පසුගිය අප්‍රේල් 11වැනි දින 15,000කට අධික සේවක පිරිසක් ලෙඩ නිවාඩු දමා සේවයෙන් බැහැර වූ බව සඳහන් කරන ජයලාල් සහෝදරයා, ඉදිරියේදී අනිවාර්යයෙන්ම ඉල්ලීම් දිනා ගැනීම සඳහා වර්ජන ක්‍රියාමාර්ගයකට යා යුතු තත්වයක් ඇති බැවින් ඒ සඳහා තීරණයක් ගැනීමට නියමිත බව පවසයි.

2012 සිට 2015 දක්වා වන වසර 3 ක් සඳහා 45% කින් ලංවිම සේවකයින්ට වැටු-ප් වැඩිකරන ලෙස කරනු ලැබූ වෘත්තීය ක්‍රියාමාර්ගයන් නිසා 2012 ජනවාරි 18 දින 25% කින් වැටුප් වැඩිකරන ලද බව කියා සිටින ඔහු එසේ තිබියෙදී ලංවිම විධායක නිලධාරීන්ට පමණක් 2012 අප්‍රේල් 01 දින සිට 45% ක් ඉක්මවා යන වැටුප් වැඩිවීමක් ලබාදීමට ආණ්ඩුව කටයුතු කර ඇති බව පවසයි. 15,000කට වැඩි ලංවිම පහළම සේවකයාගේ වැටුප 45% කින් වැඩිකර ඉහළට අදාල විෂමතාවය ඉවත් කිරීම හා වැටුප් අතර පරතරය සකස් කිරීම නිසැක ලෙසම කළ යුතු බව ඔහු අවධාරණය කරයි.

# ජ.වි.පෙ. චීන තානාපතිනියට සමුදෙයි

සිය ධූර කාලය අවසන් කර රටින් පිටත්ව යෑමට නියමිත ශ්‍රී ලංකාවේ චීන තානාපතිවරිය යැංග් ෂියු පිං මහත්මිය සහ ජනතා විමුක්ති පෙරමුණ අතර විශේෂ හමුවක් පසුගිය 19වැනි දින පෙරවරුවේ පැලවත්ත ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ මූලස්ථානයේදී පැවැත්විණි.

ජ.වි.පෙ. නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා සහ විජිත හේරත් සහෝදරයා හමුවූ ඇය එහිදී චීන ආණ්ඩුව සහ චීන කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් තම රාජකාරී කිරීමේදී දැක්වූ සහයෝගය සහ මිත්‍රත්වය පිළිබඳ ජනතා විමුක්ති පෙරමුණට සිය සිතුතිය පළ කළාය.

මෙම හමුවේදී ජ.වි.පෙ. නායක සෝමවංශ අමරසිංහ සහෝදරයා විසින් චීන තානාපතිවරිය ශ්‍රී ලංකාවේදී සිදුකළ සේවය වෙනුවෙන් ස්තූතිය පළ කරන ලදී. එමෙන්ම ජ.වි.පෙ. සහ චීන කොමියුනිස්ට් පක්ෂය අතර පවතින මිත්‍රත්වය සහ සහයෝගිතාවට අඛණ්ඩව ශක්තිමත්ව ඉදිරියට යනු ඇති බවට විශ්වාසය පළ කළ සෝමවංශ සහෝදරයා, චීනයේ ආර්ථික ශක්තිය සහ විශේෂයෙන්ම විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව සතුටුවන බව කියා සිටියේය.



# ආණ්ඩුව මංමුලාවීම හා ජනතාව මුලා කිරීම

මේ වනවිට ලංකාවත් ලාංකේය ජනතාවත් බරපතළ සමාජ, ආර්ථික, දේශපාලන අර්බුද රැසකට මුහුණ දෙමින් සිටී. එහෙත් රට මුහුණ පා සිටින සත්‍ය අර්බුදය ජනතාවගෙන් වසං කරමින්, ඔවුන් මුළා කරමින් කටයුතු කරන රාජපක්ෂ ආණ්ඩුව මේ ප්‍රශ්න හමුවේ තමන්ද මංමුලාවී වල්මත්ව අඳුරේ අතපතගාමින් රටත් ජනතාවත් ව්‍යසනයක් වෙත රැගෙන යමින් සිටී. 1978 දී රෝහණ විජේවීර සහෝදරයා විසින් පැවැත්වූ 'රතු ඔක්තෝබරයේ පාඩම්' නම් දේශනයේ එක් තැනක ලංකාවේ පෙන්වූ චිත්‍රපටයක් ගැන සඳහන් වේ. එහි නම 'කෙමාඩා' ය. එහි ප්‍රධාන නළුවා එක් තැනකදී මෙසේ පවසන බව රෝහණ සහෝදරයා සඳහන් කරයි. ඒ, ''යන්නෙ කොහෙද කියල දන්නෙ නැතිව යායුතු ආකාරය දැනගෙන සිටීම යන්නෙ කොහෙද කියල දැනගෙන යා යුතු ආකාරය නොදැන සිටීමට වඩා භයානකය.'' යන්නය. ඒ අනුව රටක් ජයග්‍රහණය වෙත යාමට නම් ඒ රටේ ආණ්ඩුව තමන් යන්නේ කොහාටද යන්නත්, යන්නේ කෙසේද යන්නත්, දැන සිටිය යුතුය. අඩුම ගණනේ යන්නේ කෙසේද යන්න නැතත්, යන්නේ කොහේටද යන්න ගැනවත් දැන සිටිය යුතුය. එහෙත් ලංකාවේ දුබල පසුගාමී ධනවාදය නව ලිබරල්වාදයට අනුව පවත්වා ගෙන යන රාජපක්ෂ ආණ්ඩුව යන්නේ කෙසේද යන්න පමණක් නොව, යන්නේ කොහේද යන්න පවා නොදැන ඉබාගාතේ ගමන්කරන බව පැහැදිලිය.

ආර්ථික වශයෙන් ගත්කළ ආණ්ඩුව කතා කරන්නේ ජාතික ආර්ථිකයක් ගැනය. එහෙත් ක්‍රියාත්මක කරන්නේ නව ලිබරල්වාදයට අනුව විවෘත ආර්ථිකයය. එයද තමන්ගේ සැලසුමකට අනුව නොව අධිරාජ්‍යවාදයේ උපදෙස් පිට, හා එන එන ප්‍රශ්නවලට එදිනෙදා කුමක් හෝ උත්තරයක් සොයමින් දවස ගෙවා ගනිමිනි. එහි අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ, ලංකාව විශාල මූල්‍ය අර්බුදයකට ලක්වීමත් විදේශ වත්කම බරපතළ ලෙස බිඳ වැටීමත්, ඒ නිසාම ආනයන සීමා කිරීම් හා අධික ලෙස බදු පැනවීමට ආණ්ඩුව පියවර ගැනීමත්ය. එවිට එය විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සමග ප්‍රතිවිරෝධී වේ. විටෙක පටු දේශපාලන අරමුණු වෙනුවෙන් පාර්ලිමේන්තුවේ පනතක් සම්මත කොට, පාඩු ලබන්නේ යයි නම්කරන පෞද්ගලික ව්‍යාපාර කීපයක් රජයට පවරා ගන්නා ආණ්ඩුව, ඊළඟ මොහොතේ පාඩු ලබන්නේ යයි කියමින්ම රාජ්‍ය ආයතන විකුණා දැමීමද කරයි. ඒ සඳහා මෑතම උදාහරණය කඩදාසි කර්මාන්ත ශාලාවය. ආණ්ඩුවේ 'මග නොදැන යන ගමන' කොතරම් බරපතළ දැයි පැහැදිලි වන්නේ එවිටය.

දේශපාලනයේදීද ආණ්ඩුව කටයුතු කරමින් සිටින්නේ, 'යන්නෙ කොහෙද මල්ලෙ පොල්' ප්‍රතිපත්තියට අනුවය. බටහිර රටවල් 'දේශප්‍රේමී රාජපක්ෂ පාලනය' පෙරළා දැමීමට කුමන්ත්‍රණය කරනවා යයි හඬ නගමින් ජනතාවගේ අනුකම්පාව සඳහා කටයුතු කරන ආණ්ඩුව ඒ අතරම අධිරාජ්‍යවාදීන් සමග එක්ව, හා ඔවුන්ට අවශ්‍ය ලෙස තීරණ ගනිමින් ජනතාව පීඩාවටද පත්කරමින් සිටී. ආර්ථික ක්ෂේත්‍රයේදී රුපියල බාල්දුකිරීම හා බදුබර වැඩිකිරීම, රජයේ වියදම් කපාහැරීම, අධිරාජ්‍යවාදී උපදෙස්වලට අනුව ගන්නා තීරණයන්ය. අධිරාජ්‍යවාදී උපදෙස්වලට අනුව තීරණ ගෙන ඒවා මගින් පොදු ජනතාව පීඩාවට පත්කරන ආණ්ඩුව, අධිරාජ්‍යවාදයෙන් තමන් බේරා ගන්න යයි ජනතාවගෙන්ම යළි ඉල්ලා සිටී. ආණ්ඩුවේ මේ ප්‍රතිවිරෝධය අපේ රටේ ජනතාව තේරුම් නොගැනීමද ගැටලුවක්ව පවතී.

මේ වනවිට ලංකාවේ තෙල් බෙදාහැරීමේ කාර්යයද මුළුමණින්ම ඉන්දියානු තෙල් සමාගම් වෙත ලබා දීමේ සූදානමක් පවතී. එම තීරණයද ගැටගැසී ඇත්තේ, අධිරාජ්‍යවාදයේ මැදහත්වීම් සමගය. මේ වනවිට එක්සත් ජනපදය ඉරානයට ආර්ථික සම්බාධක පනවමින් සිටී. ඩොලර් මගින් ඉරානයෙන් බොරතෙල් මිලදී ගන්නා රටවල් ඉන් වැළැක්වීමට එක්සත් ජනපදය බලපෑම් කළ අතර, පහුගිය කාලයේ ලංකාවට පැමිණි එක්සත් ජනපද නිලධාරියෙක් ලංකාවට බලකළේ ඉරානයෙන් බොරතෙල් නොගන්නා ලෙසය. මෙම ඉල්ලීමට අවසානයේ ලංකාව එකඟ වී තිබේ. ඒ අනුව මේ වනවිට ඇනවුම් කර ඇති තෙල් ප්‍රමාණය ගෙන්වීමෙන් පසු ඉරාන බොරතෙල් මිලදී ගැනීමට ලංකාවට නොහැකි වේ. ඊළඟ අර්බුදය වී ඇත්තේ ලංකාවේ තෙල් පිරිපහදු කරන සපුගස්කන්දේ පිරිපහදුවේ පිරිපහදු කළ හැක්කේ ඉරානයේ නිපදවන වර්ගයේ බොරතෙල් පමණක් වීම බවද පැවසේ. මේ නිසා ලොව ඕනෑම රටකින් බොරතෙල් මිලදී ගෙන පිරිපහදු කිරීමට ලංකාවට නොහැකිවී තිබේ. මේ තත්වය මත ලංකාවේ තෙල් ගෙන්වීම හා බෙදාහැරීම මුළුමනින්ම ඉන්දීය තෙල් සමාගම අතට ලබාදීමට ආණ්ඩුව සූදානම් වන බව වාර්තා වේ. මේ වනවිටත් I.O.C. සමාගම සපුගස්කන්ද පිරිපහදුව පරීක්ෂා කිරීමට ගොස් තිබේ. ලංකාවේ තෙල් බෙදාහැරීම ඉන්දියාව අතට පත්වන්නේ කෙසේද? ඩොලර් මගින් ඉරාන බොරතෙල් මිලදී ගැනීමට තහංචි පැනවෙන විට ඉන්දියානු ආණ්ඩුව කළේ ඉන්දියානු රුපියල්වලට ඉරාන බොරතෙල් මිලදී ගැනීමට ඉරානය සමග ගිවිසුමකට ඒමය. ඒ අනුව ඉන්දියාව ඉරාන බොරතෙල් මිලදී ගනී. දැන් ලංකාව හදන්නේ එම බොරතෙල් ඉන්දියාවෙන් මිලදී ගැනීමට එකඟතාවයක් ඇතිකර ගන්නවා වෙනුවට එම බොරතෙල් ලංකාවේදී පිරිපහදු කිරීමේත් ලංකාව තුළ තෙල් බෙදාහැරීමේත් සමස්ත ක්‍රියාදාමය ඉන්දීය තෙල් සමාගම්වලට ලබාදීමය. එහි අවසන් ප්‍රතිඵලය වනු ඇත්තේ ජාතික ආරක්ෂාවටද බලපාන ඉන්ධන බෙදාහැරීමේ ඒකාධිකාරය මුළුමනින්ම ඉන්දියාව අතට පත්වීමය. අධිරාජ්‍යවාදීන් හා ඉන්දියාව එලෙස ලංකාවේ ආර්ථිකයේ මර්මස්ථාන පවා අත්පත් කර ගන්නේ රාජපක්ෂ ආණ්ඩුවේ අරමුණක් හෝ ඉලක්කයක් නැති දේශපාලනයට ස්තුති වන්නටය.

> අරමුණක් නැතිව අයාලේ යන, යන්නේ කොහේද? යන්නේ කෙසේද?යන්නේ කා සමගද? නොදැන වල්මත්ව ඉබාගාතේ ඇවිදින හා ජනතාවද වල්මත් කර ඇති වර්තමාන පාලනය තවදුරටත් රට තුළ පැවතීමට ඉඩහැරීම ඉතාම ඛේදජනක සිදුවීම් සඳහා හේතුවනු ඇත.



මේ වසර අගවන විට පළාත් සභා හතරක ඡන්දය පැවැත්වීමට ආණ්ඩුව සූදානමක සිටින බවටද වාර්තා පළවෙමින් තිබේ. ඉන්දියාවේත් බටහිර රටවලත් බලපෑම නිසා උතුරු පළාතේ පළාත් සභා මැතිවරණය පැවැත්වීමට ආණ්ඩුවට සිදුව තිබේ. ඒ අතර නැගෙනහිර පළාත් සභාවේ නිල කාලයද මේ වසරේ අවසන් වේ. එම පළාත් දෙකේ ඡන්දය පවත්වනවා වෙනුවට ආණ්ඩුව උතුරුමැද හා සබරගමුව පළාත් දෙකද ඇතුළු පළාත් සභා හතරක ඡන්දය පැවැත්වීමට සූදානම් වේ. එහි අරමුණු කීපයක් තිබේ. උතුරේ පළාත් සභාව ජයගැනීමට ආණ්ඩුවට දුෂ්කරය. නැගෙනහිර පළාත් සභාවද මෙවර අභියෝග යක් විය හැකිය. ඒ නිසා එම පළාත් දෙක පරාජයවීම අවාසි නිසා එය මකාගැනීමට තමන්ට ජයගතහැකියයි සිතෙන පළාත් සභා දෙකකද ඡන්දය ඒ සමගම පවත්වා ඒවා ජයගෙන පරාජය වසා ගැනීමට පුළුවන. ඒ එක් කරුණකි. අනෙක මේ මොහොතේ රට තුළ ආණ්ඩු විරෝධයක් ගොඩනැගෙමින් තිබේ. ජනතාව තම අයිතීන් වෙනුවෙන් අරගල කිරීම අරඹා තිබේ. පළාත් සභා කීපයක ඡන්දය පැවැත්වීම මගින් ජනතාවගේ අවධානය ඡන්ද දෙසට යොමු කරවීමට ආණ්ඩුවට හැකියාව ලැබේ. ආණ්ඩුව ජනතාව තුළ අප්‍රසාදයට පත්වෙමින් තිබීම වසන්කර ජනතාව තවමත් ආණ්ඩුව සමග යයි පෙන්වන්ට ආණ්ඩුවට අවශ්‍ය වී තිබේ. තමන්ට වාසිදායක ලෙස පෙනෙන සභා දෙකේද පළාත් සභා ඡන්දය සඳහා ආණ්ඩුව තෝරාගත්තේ ඒ අනුවය.

එපමණක් නොවේ. ජිනීවා යෝජනා පිළිබඳ ජනමත විමසුමක් පැවැත්වීමේ යෝජනාවක් ආණ්ඩුවට ඉදිරිපත්වී තිබේ. මෙම යෝජනාව වීරවංශ ඇමතිවරයා විසින් ප්‍රසිද්ධියේ පවසා තිබුණි. එහි අරමුණ වන්නේද ආණ්ඩුවට එරෙහි ජනතා විරෝධය වෙන අතකට හැරවීම සහ ජනතාව ආණ්ඩුව සමග යැයි පෙන්වීමය. එහෙත් ආණ්ඩුවේ සමහර ඇමතිවරුන් ඊට එකඟ නොවීම නිසාත් එවැනි ජනමත විචාරණයක් පවත්වා එක්සත් ජනපදය අමනාප කරගැනීමට ආණ්ඩුව අකමැති නිසාත් එය ක්‍රියාවට නොනැගී තිබේ. මේ හැම කරුණකින්ම පෙන්වන්නේ, ආණ්ඩුවේ ඇති දෙබිඩි බව, දෙගිඩියාව හා ඉබාගාතේ ගමන්කිරීමය.

ආණ්ඩුවේ මෙම ස්වභාවය වඩාත් නරක ලෙස බලපා තිබෙන්නේ ජාතික ප්‍රශ්නයටය. ධනවාදය තුළ දුර්වල ධනපති ආණ්ඩුවකට ලංකාවේ ජාතික ප්‍රශ්නය විසඳිය නොහැකිය යන්න පිළිබඳ විවාදයක් තිබිය නොහැකිය. එහෙත් ජාතික ප්‍රශ්නය යළි බෙදුම්වාදය ජයග්‍රහණය කිරීමේ දෙසට යාම වැළැක්වීමට, ඊට අධිරාජ්‍යවාදීන් හා ඉන්දියාව කරන මැදිහත්වීම අවම කරගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග රැසක් තිබේ. ඒවා නම් උතුරේ ජනතාව මේ මොහොතේ මුහුණදී සිටින අත්‍යාවශ්‍ය ගැටලුවලට විසඳුම් ලබාදීමය. ආණ්ඩුව එය ඉටු නොකර සිටීම නිසා මෙම ප්‍රශ්නය තම න්‍යායපත්‍රය තුළ තබාගැනීමට හා ඊට අනුව හැසිරවීමට අධිරාජ්‍යවාදීන්ටත් ඉන්දියාවටත් ඉඩ ලැබෙන අතර ජනතාව යළි බෙදුම්වාදය වෙත තල්ලුකිරීමේ ඉඩ විවර වේ. එහෙත් මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ හැසිරීම මුළුමණින්ම අඳබාල එකක් වී තිබේ.

අධිරාජ්‍යවාදී රටවල විවිධ සංවිධාන හා බලධාරීනුත් ඉන්දියාවේ විවිධ පුද්ගලයන් හා බලධාරීනුත් පෙරහැරේ එකා පසුපස එකා ලංකාවට පැමිණෙන්නේ, 'උතුරේ ජනතාව මුහුණදී ඇති ගැටලුවලට' විසඳුම් සෙවීමේ මුවාවෙනි. රාජපක්ෂ ආණ්ඩුව එම ගැටලු විසඳා අධිරාජ්‍යවාදීන්ට ලංකාවට ඇඟිලි ගැසීමේ ඉඩකඩ අහුරනවා වෙනුවට ඒවා පවතින්නට ඉඩහැර තිබේ. එමගින් අධිරාජ්‍යවාදයට හා ඉන්දියාවට ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්ණ වලට මැදිහත්වීමටඉඩ හා අවස්ථා විවර කර දී තිබේ. එලෙස කටයුතු කරන ආණ්ඩුව තමන්ට අවශ්‍ය වූ විට පමණක් 'අධිරාජ්‍යවාදී බිල්ලා' පෙන්වමින් දේශප්‍රේමී රංගනයක් ඉදිරිපත් කරනු පෙනේ.

යුද්ධය නිමාවීමෙන් පසු ලැබුණු අවස්ථාව නිසිලෙස යොදාගෙන උතුරේ ජනතාවගේ

15වැනි පිටුවට



''''සුළු ධනපති පංතියේ පුළුල් කොටස් ධනපති සූරාකන්නන් පසුපස යති. ඔවුන් දිනක නිර්ධන පංතිය පිටුපස ගමන් ගන්නා අතර, ඊළඟ දිනයේ විප්ලවයේ දුෂ්කරතාවයන් දැක, බියවැද, ඒ මේ අත වැනෙන හා පැකිලෙන බව සියලු රටවල දශක ගණන් දීර්ඝ අත්දැකීමෙන් ඔප්පුවේ. කම්කරුවන්ට අත්වන ප්‍රථම පරාජයෙන් නැතහොත් අර්ධ පරාජයෙන් වික්ෂිප්තව ඔවුන් අරමුණක් නැතිව ඒ මේ අත දුවමින්, අඬා වැළපෙමින්, එක පිලක සිට තවත් පිලක් වෙත දුවන බව අත්දැකීමෙන් ඔප්පුවේ.''

**ලෙනින් - තෝරාගත් කෘති 09 වෙළුම 36 පිටුව**






# මේ යහපත් හෙටක් සඳහා වන සටනේ ඇරඹුමයි!

එක්තරා දිනක අසල්වැසි මිතුරියක් ඇය සේවය කරන ඇඟලුම් කර්මාන්ත ශාලාවේදී අසනීප වීම නිසා වේලාසනින්ම සිය නිවසට පැමිණියාය. සවස් යාමමේ ඇයගේ සුව දුක් බැලීමට ගිය මා හට ඒ වන විටත් ඇය අයහපත් සෞඛ්‍ය තත්වයෙන්ම පසු වන අයුරු දක්නට ලැබුණි. පසු දිනද රැකියාවට නොගොස් නිවසට වී විවේක ගන්නා ලෙස මා ඇයට පැවසුයේ එහෙයිනි. නමුත් ඈ පැවසූයේ මෙවන් කථාවකි.

''අනේ නොගිහින් කොහොමද? අද වේලාසන එද්දිම කිව්වා හෙට නිවාඩු ගන්න හිතන්න එපා කියලා.හෙට වැඩට එන්න බැරි නම් දිගටම ගෙදර ඉන්න කියලා බොස් කිව්වා....ඔයාලා නැති වුණාට අපිට වැඩට ගන්න ඕන තරම් ළමයි එළියෙ ඉන්න බව මතක තියා ගන්න කියලත් කිව්වා........''

මේ අපේ රටේ පමණක් නොව ලොව බොහෝ රටවල වැඩ කරන ජනතාව මුහුණ දෙන තවත් එක් ඛේදවාචකයකි. නිරන්තරයෙන්ම අතිරේක ශ්‍රම බලකායක් රැකියා වියුක්තිකයන් ලෙස පවත්වාගෙන යනු ලබන ධනේශ්වර ආර්ථික ක්‍රමය ඕනෑම මොහොතක එම අතිරේක ශ්‍රම පිරිස රැකියා නියුක්තිකයන් සිය අයිතීන් වෙනුවෙන් පෙනී සිටින විට ඊට එරෙහිව කදිම අවියක් ලෙස යොදා ගන්නා ආකාරය ඉහත සිදුවීම මඟින් මොනවට පැහැදිලි කරනු ලබයි. තරුණ තරුණියන්ට රැකියා ලබා දීමට අසමත් ධනේශ්වර ක්‍රමය එම නොහැකියාව පවා ඉතා සූක්ෂම ලෙස තමන්ගේ පැවැත්ම වෙනුවෙන් වාසියට හරවා ගන්නා අයුරු ඉන් පැහැදිලි වේ.
මේ සිදුවීම මගේ මතකයට නැගුණේ මේ මාසය එළැඹෙන්නේම වැඩ කරන ජනතාව ගැන වැඩිපුර කථා බහට ලක් වෙන ජාත්‍යන්තර කම්කරු දිනය සමඟින් වන හෙයිනි. අපේ රටේද එදිනට බලයේ පවතින කවර අණ්ඩුවක් වුවද කම්කරුවන් වීරත්වයේ ලා කථා පවත්වන අයුරුද, මැයි දින පෙළපාලි හා මැයි දින රැලි පැවැත්වෙන අයුරුද අපි ඉතිහාසය පුරාම දැක ඇත්තෙමු. එහෙයින් මැයි පළමු වැනිදාට වැඩ කරන ජනතාව වීරත්වයේ ලා සලකන ආණ්ඩුව සැබෑ ලෙසටම ඔවුන්ට සලකන්නේ කෙසේදැයි බුද්ධිමත්ව විමසා බලන මෙන් මම ඔබට ඇරයුම් කරමි. අපේ රටේ තරුණ තරුණියෝ ලක්ෂ 15ක් විරැකියාවෙන් පෙළෙති. ආණ්ඩුවේ ඉලක්කම් විජ්ජාවන් නම් මෙය ඉතා අඩු කොට පෙන්වනු ඇත. රැකියා කරන්නවුන්ගෙන් බොහෝ දෙනා ඌණ සේවා නියුක්තිකයන්ය. බොහෝ දෙනාගේ සේවක අයිතීන් පවා අහිමිව ගොසිනි. රැකියා සුරක්ෂිතතාවයක්ද නොමැත. ජනතාවට ආශ්චර්යමත් රටක් ගොඩ නැගීමට පාරම්බාන ආණ්ඩුවක සැබෑ ක්‍රියා කලාපය එයයි.

එක් මනුෂ්‍යයෙකුට රුපියල් 2500 කින් මාසයක් යැපීමට හැකි බවට ආණ්ඩුවට පවතින විශ්වාසය නිසාම සේවක වැටුප් වැඩි නොකරනවා වන්නට ඇත. එපමණක්ද නොව පසු ගිය වසරේ පටන් ආණ්ඩුවේ ගිජු දෑස සේවක අර්ථසාධක අරමුදලද ඩැහැ ගැනීමට මාන බලමින් සිටියි. ඊට එරෙහිව නැගී සිටි කම්කරුවන්ට පහර දී රොෂේන් චානක මරා දැමීමට තරම් ආණ්ඩුව සැහැසි විය. මෙසේ කම්කරුවෙක් මරා දැමුණේ කම්කරුවන් පිළිබඳව වීරත්වයෙන් කථා කරන මැයි මාසයේදීමය. එමෙන්ම හිටපු කම්කරු ඇමතිවරයෙක් රාජ්‍ය බලය හොබවද්දීය. ඉන්ධන මිළ ඉහළ යාම නිසා තම රැකියාව අනතුරට ලක් වීමට එරෙහිව නැගී සිටි ධීවර ජනතාවට පහර දී ඇන්තනී නම් ධීවර සොයුරා මරා දැමුණේද හිටපු ධීවර ඇමතිවරයෙකු රාජ්‍ය බලය හොබවන මේ වකවානුවේදීමය.

එබැවින් ආණ්ඩුව පෙළහර පාන මාධ්‍ය සංදර්ශනවලින් දෙඇස් අඳ නොකර ගෙන සැබෑ ලෙසම ලෝකය දකින්න.
සොයුර සොයුරිය, මේ තවත් එක් මැයි දිනයක් නොව, යහපත් හෙටක් සඳහා වන සටනේ ඇරඹුමයි!

# නූතන බැට්යේටස්ලාගේ Man Power(වහල්)Service

රාජගිරියේ සිට බොරැල්ල දෙසට එනවිට කොටා පාර අසල ඉදිකර ඇති විශාල දැන්වීම් පුවරුවකි. එහි මෙසේ සටහන් කොට තිබේ. 'ආරක්ෂක නියාමකයකු සොයා දෙන්නෙකුට රු.2000/-ක් ' මෙය දකින කෙනෙකුට එකවරම තමා හැබෑවටම සිටින්නේ ශ්‍රී ලංකාවේ දැයි ප්‍රශ්නයක් මතු වීමට ඉඩ තිබේ.

කොරියන් රැකියා සඳහා මතු වු උද්ඝෝෂණ , විදෙස් රැකියා සඳහා ඇති පෝලිම්, ජීවිතයම පරදුවට තබා අනාරක්ෂිත බෝට්ටුවලින් මිල්ල සොයා යන තරුණ කණ්ඩයම් රැකියා දියව් යනුවෙන් තරුණ ව්‍යාපාර ගෙන යන උද්ඝෝෂණ ආදී සියල්ලක්ම ප්‍රබන්ධයන්ද? මන්ද යත් රැකියාවකට කෙනෙක් සොයාදෙන කෙනෙකුටත් රු.2000/- ක් ලබා දෙන්නේ නම් ඒ රටේ රැකියා ප්‍රශ්නයක් තිබේ යයි කිව නොහැකිය. පුද්ගලයා සොයා දෙන්නාට එතරම් මුදලක් හිමිවේ නම් රැකියාව හිමිවන්නාටද සුපිරි වැටුපක් හිමිවනු ඇත.

බැලු බැල්මට මෙවැනි සුරංගනා ලොවක් පෙනුනද මෙනහි සැබෑ තත්වය කුමක්දැයි විමසා බැලිය යුතුය. ඉහත සඳහන් කළ දැන්වීම් පුවරුවෙන්ද කියවෙන පරිදි සේවකයින් ඉල්ලා සිටින්නේ මිනිස් බල සමාගම් (Man Power Service) සඳහාය. මේවා කොන්ත්‍රාත් පදනමින් ශ්‍රමිකයින් බඳවා ගත්තා සමාගම්ය. දැනට ලංකාවේ මිනිස් බල සමාගම් 300 කට වඩා තිබෙන අතර ලක්ෂ 10 කට අධික පිරිසක් මේවායේ ලියාපදිංචි වී විවිධාකාරයේ රැකියාවල නිරත වෙති. මොවුන්ගෙන් වැඩි පිරිසක් තරුණ තරුණියන්ය. මෙම රැකියා සාමාන්‍ය රැකියාවලින් වෙනස් වන්නේ කෙසේදැයි විමසා බැලිය යුතුය.

සමාගම් පනත යටතේ ලියාපදිංචි කොට ඕනෑම අයකුට මෙවැනි මිනිස් බල සමාගම් ආරම්භ කළ හැකිය. බඳවගන්නා අයගේ සේවය ස්ථිර එකක් නොවේ. කිසිදු සේවා අයිතිවාසිකමක් හිමි නොවේ. කම්කරු නීති රීති කිසිවක් ඔවුන්ට අදාල නැත. නීති රීති සියල්ල මිනිස් බල සමාගම් අයිතිකරුවන්ගේ අභිමතය පරිදිය. ඉතාම සොච්චම් වැටුප් සඳහා කිසිදු සේවක අයිතිවාසිකමකින් තොරව උපරිම ශ්‍රම සූරාකෑමක් සිදු කිරීම මේ රැකියාවල ඇති වෙනසයි.

පෞද්ගලික ආරක්ෂක සේවා ආයතන, පිරිසිදු කිරීම් කරන ආයතන (Cleaning Service) පැටවීම් හා බෑම් කරන ආයතන (Loading, Unloding) බැංකු, මූල්‍ය ආයතන, සන්නිවේදන සේවා, හෝටල්, ගෑස් සමාගම්, ලිහිසි තෙල්, පශු සම්පත් සම්බන්ද ආයතන ආදී සෑම ක්ෂේත්‍රයකම පාහේ මෙවැනි මිනිස් බල සමාගම්වල ශ්‍රමිකයින් යොදවා ඇත. පෞද්ගලික සමාගම්වලින් 95% කම දැනට මෙම ක්‍රමය භාවිතයට ගනී.

බොහෝ ආයතනවල කොන්ත්‍රාත් ශ්‍රමිකයින් සංඛ්‍යාව ක්‍රමානුකූලව ඉහළ දමමින් තිබෙන පැහැදිලිව දැකගත හැකි කාරණයකි. උදාහරණ ලෙස කැල්ටෙක්ස් සමාගම 1996 පමණ පෞද්ගලීකරණය කරද්දී තිබූ කොන්දේසිය වුයේ ස්ථිර සේවක සංඛ්‍යාව 300 ක් වශයෙන් පවත්වා ගත යුතු බවයි. නමුත් දැන් ඒවාට කොන්ත්‍රාත් සේවකයින් ආදේශ කර ස්ථිර සේවක සංඛ්‍යාව 30 කට පමණ පහළ දමා ඇත. ෂෙල් ගෑස් සමාගමේද මේ අයුරින්ම ගිවිසුම අනුව තබාගත යුතු වන 700 ක ස්ථිර සේවක සංඛ්‍යාව වෙනුවට දැන් 80 ක් පමණ දක්වා අඩු කර තිබේ.

බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේද යතුරු ලේඛක, කාර්යාල කාර්ය සහායක, දේපළ පරීක්ෂක තනතුරු ආදී බොහෝ වගකීම් මිනිස් බල සමාගම්වලින් ගත් ශ්‍රමිකයින් මගින් සිදුකර ගනී. ඔවුන් අස්ථිර සේවකයින් වුවද ඔවුන්ගේ කාර්යභාරයන් නතර වුවහොත් කිසිසේත් ඒ සේවාවන් පවත්වා ගත නොහැකිය.

ත්‍රිකුණාමලයේ ප්‍රිමා සමාගම සම්බන්ද මෙවැනි සිදුවීමකින් කියවුණේ අවුරුදු 25 ක් එක දිගට මෙසේ පිට මිටි කරගහන කම්කරුවන් වැඩ කරන බවය. එවැනි සේවක පිරිසක්ද පසුගියදා හේතු විමසීමකින් තොරව සේවයෙන් නෙරපා දමා තිබුණි. එහි ඇති අපූරු කතාව නම් එකී මිනිස් බල සමාගම් බොහොමයක් පවත්වාගෙන යනු ලබන්නේ විශ්‍රාමික කම්කරු කොමසාරිස්වරුන් කිහිප දෙනෙක් විසින් වීමයි. මේ ගැන පුදුම විය යුතු නැත. වර්තමානයේ කම්කරු දෙපාර්තමේන්තුවේ සේවයට ද (Man Power) සමාගම්වල අය බඳවාගෙන ඇත.


මේ කියන ලද මිනිස් බල සමාගම්වල මසකට ගෙවන වැටුප රු.8300/- ක් තරම් සොච්චම් මුදලකි. මේ තත්වය නිසා අතිකාල සේවා කෙසේ හෝ කර තව කීයක් හෝ වැඩිකර ගැනීමට බොහෝ අය පෙළෙඹෙන අතර අතිශය දරුණු ශ්‍රම සූරාකෑමකට ලක්වේ.


මේ නිසා බොහෝ තරුණ තරුණියන් රැකියා කරන බව පෙන්වුවද, ඇතැම් විට බැංකු වැනි ආයතනවල සේවය කරන බව පෙන්වුවද සැබැවින්ම ඔවුන් කිසියම් හිමිකරුවකු වෙනුවෙන් ශ්‍රමය වගුරන වහලුන්ටත් අන්ත ජීවිතයක් උරුමව සිටිති. වෘත්තිය රැකගැනීම වෙනුවෙන් ආයතන බලධාරීන්ගේ වුවමනා එපාකම් ඉටුකිරීමට පවා සිදුවීම ශෝචනීය තත්වයකි. සේවයේ නියුතු තරුණ තරුණියන්ගේ සමගියක් ඇතිකරගැනීමට පවා ඉතාම දුෂ්කර වී ඇත්තේ, මෙවැනි තත්වයක් නිසාය. ඕනෑම මොහොතක සේවයෙන් දොට්ට දැමීමේ අයිතිය බලධාරීන් සතුවන නිසා මේ අයුක්ති සහගත ක්‍රියාවලිය ප්‍රශ්න කිරීමටවත් කිසිවකුට ඉදිරිපත් විය නොහැකිය.

පවතින තත්වයට අනුව හෝ ඔවුන්ට හිමිවිය යුතු වැටුපෙන් ඔවුන්ට හිමිවන්නේ 50% කට අඩු ප්‍රමාණයකි. බොහෝවිට වැටුප රු.8300/- වන්නේ ඒ අනුවය. ඉතිරි මුදල යන්නේ මිනිස් බල සමාගම වෙතය. සුරාකෑම කොතරම් දැයි ඒ අනුව පෙනී යයි. ආරක්ෂක නියාමකයකු සොයා දෙන්නෙකුට රුපියල් 2000/- ක් ගෙවීම මහ කජ්ජක් නොවන්නේ ඒ නිසාය.

ඒ නිසා මිනිස් බල සමාගම් යනු වහල් හිමි ආයතන යයි හැඳින්වීමේ කිසිදු වරදක් නොපෙනේ. වහල් යුගයේ වහල් වෙළඳම පැවැතුණාක් මෙන් වත්මන් ධනවාදයේ රටාව වී ඇත්තේ පීඩිතයින්ව තව තවත් මිරිකා සාරය උරා ගැනීමය. මතුපිටින් සාකච්ඡා වන කම්කරු අයිතිවාසිකම්, කම්කරු නීති රීති, මානව හිමිකම්, ආදී ව්‍යාජ වදන්වලට සැඟවී පවතින ධනපති කෲරත්වය වටහා ගැනීමට මේ 'නූතන වහල් වෙළඳම' හොඳටම ප්‍රමාණවත්ය.

ඉතින් තාරුණ්‍යයේ සිහින, තාරුණ්‍යයේ බලාපොරොත්තු, තාරුණ්‍යයේ සුන්දරත්වය ආදිය ගැන කතා කිරීමෙන් ඵලක් නැත. ඊට පෙර අඩුම තරමින් වහල්භාවයෙන් නිදහස් වී මිනිසත්භාවය දිනාගත යුතුය. එය මේ දුෂ්ට සමාජ රටාව වෙනස් කිරීමෙන් මෙපිට දිනාගත හැක්කක් නොවේ.





# අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරයේ පෙරමුණු කාර්යභාරය පැවරෙන්නේ, කම්කරු පංතිය ප්‍රමුඛ වැඩකරන ජනතා බලවේගයන්ටයි

## ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

***නියමුවා:-ලංකාව වර්තමානයේ මුහුණ දී සිටින බරපතළ අර්බුදයේ ස්වරූපය කෙබඳුද?***

***ටිල්වින් සහෝදරයා:-*** ඉතාමත් කෙටියෙන් පැහැදිලි කළොත් මේ මොහොතේ ලංකාව එක් අතකින් දැවැන්ත ආර්ථික අර්බුදයකට මුහුණ දී තිබෙනවා. ලංකාවේ පාලකයින් විසින් අනුගමනය කරන නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය මේ මහා අර්බුදයට ප්‍රධාන හේතුව වෙනවා. ඒ වගේම දේශපාලනයේදී ජාතික සමගිය ගොඩනැගීමේ දිශාවට කටයුතු කිරීමට වත්මන් ආණ්ඩුව අපොහොසත් වීම නිසා යළි බෙදුම්වාදී දේශපාලනය හිස ඔසවමින් තිබෙනවා. ලංකාවේ ජාතික ප්‍රශ්නයත් ඒ හා බැඳී ඇති මානව හිමිකම් ප්‍රශ්නත් උපයෝගී කර ගනිමින් අධිරාජ්‍යවාදී මැදිහත්වීමක් හා ඉන්දියානු මැදිහත්වීමක් සිදුවෙමින් තිබෙනවා. එය ඉතා බරපතළයි. පසුගියදා ජිනීවා මානව හිමිකම් කොමිසම තුළ ලංකාවට එරෙහි යෝජනාවක් ඉන්දියාවේ සහාය සහිතව එක්සත් ජනපදය විසින් සම්මත කරගනු ලැබුවා. ලංකාවට එරෙහිව සිදුවන විදේශ මැදිහත්වීමේ බරපතළකම ඉන් තේරුම් ගත හැකියි. ඒ වගේම රට තුළ විරුද්ධ මත දරන්නන් මර්දනය කිරීම, පැහැර ගෙන යාම්, සාමාකාමී විරෝධතාවලට පහරදීම් හා එවැනි විරෝධතාවලදී වෙඩි තබා නිරායුධ පුරවැසියන් ඝාතනය කිරීම් ආදිය විසින් ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය අනතුරට ලක්ව තිබෙනවා. රට තුළ අපරාධ වැඩිවීම නිසා සාමාන්‍ය ජනතාවගේ ජීවිතවලට තර්ජනයක් එල්ලවී තිබෙනවා. මේ ලෙස බැලුවම ලංකාවේ සමාජ ආර්ථික දේශපාලන අර්බුද රැසකට මුහුණ දීල තියෙනවා.

***නියමුවා:-ලංකාවට එරෙහිව එල්ල වී තිබෙන අධිරාජ්‍යවාදී බලපෑම් ඔබ විග්‍රහ කරන්නේ කෙසේද?***

***ටිල්වින් සහෝදරයා:-*** ලංකාව සෘජු යටත්විජිත පාලනයෙන් මිදී නව යටත්විජිත තත්වයට පත්වූ අවස්ථාවේ සිටම අධිරාජ්‍යවාදී බලපෑම් ලංකාවට තිබුණා. එය මෑතකදී එනම් අධිරාජ්‍යවාදීන් නව ලිබරල්වාදී ප්‍රතිපත්තතිය ක්‍රියාවට නගමින් ලෝකය යළි අත්පත් කර ගැනීමට කටයුතු කිරීමට උත්සාහ කළ කාලයේ සිට මේ මැදිහත්වීම වැඩිවුණා. මුලදී ඔවුන් ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක වෙළඳ සංවිධානය මගින් ලංකාව ණය උගුලක හිරකර ගැනීමට හා විවිධ වර්ගයේ ඊනියා ආධාර ව්‍යාපෘති මගින් ලංකාවේ දේශපාලනය ඔවුනට විශේෂයෙන් එක්සත් ජනපදයට අවශ්‍ය ලෙස මෙහෙයවා ගැනීමට කටයුතු කළා. ජයවර්ධන පාලනය තුළ ඔවුන් 'ඇමරිකානු හඬ' ලංකාවේ ස්ථාපිත කළා. ත්‍රිකුණාමලය වරාය හා තෙල් ටැංකි ඔවුන්ගේ පාවිච්චියට ගැනීමට උත්සාහ කළා. එම යුගයේ ඉන්දියාව හා එක්සත් ජනපදය ප්‍රතිවිරෝධී කඳවුරු දෙකක් නියෝජනය කළ නිසා ත්‍රිකුණාමලය වරාය එක්සත් ජනපදය අතට පත්වීම වැළැක්වීමට, ලංකාව ඉන්දීය ආධිපත්‍ය තුළ තබා ගැනීමට ඉන්දියාව උත්සාහ කළා. 1987 ඉන්දු ලංකා ගිවිසුම එහි ප්‍රතිඵලයක්. එහෙත් ඊට පසු 1990 සමාජවාදී කඳවුර බිඳ වැටීමෙන් පසු නිර්මාණය වූ නව ලෝක දේශපාලන තත්වය තුළ එක්සත් ජනපදය හා ඉන්දියාව එකම ප්‍රතිපත්තියක හා උපායමාර්ග යකට සිට ලංකාවට මැදිහත් වුණා. ඊට පෙර මෙන්ම එහිදීත් ඔවුන් ඒ සඳහා යොදාගත්තේ ලංකාවේ ජාතික ගැටලුවයි. උතුරේ පැවති බෙදුම්වාදී දේශපාලනය බෙදුම්වාදී යුද්ධයක් දක්වා වර්ධනය වූයේ ඔවුන්ගෙ ද මැදිහත්වීම මතයි. බෙදුම්වාදී යුද්ධය උපයෝගී කරගනිමින් මැදිහත්වූ ඔවුන් 2002 දී සටන් විරාම ගිවිසුමක් සඳහා රනිල්ගේ ආණ්ඩුව යොමුකරවීමට පවා සමත් වුණා. දැන් යුද්ධය නිමාවීමෙන් පසුද 'මානව හිමිකම්' හා 'වගවීම' යන සංකල්ප යොදාගෙන ලංකාවේ අභ්‍යන්තර දේශපාලනය ඔවුන්ට අවශ්‍ය ලෙස මෙහෙයවීමට කටයුතු කරනවා. ඒ මගින් ලංකාවේ ආර්ථිකය, ලංකාවේ වෙළඳපොළ ආදියත් ඔවුන්ට අවශ්‍ය ලෙස මෙහෙයවනවා. මේ නිසා ලංකාවට එරෙහි අධිරාජ්‍යවාදී මැදිහත්වීම් අහම්බයක් හෝ සරල හේතුවක් නිසා සිදුවන දෙයක් නෙවෙයි. එය ඔවුන්ගේ උපායමාර්ගික වුවමනාව තුළ සිදුවන දෙයක්.

***නියමුවා:-මේ වන විට අධිරාජ්‍යවාදය බරපතළ අර්බුදයකට ලක්වෙලා තිබෙනවා. විශාල ආර්ථික අවපාතයකට ඔවුන් මුහුණ දීලා තියෙනවා. එවැනි තත්වයක් තුළ අධිරාජ්‍යවාදී මැදිහත්වීම් අප වැනි රටවලට වැඩි වෙන්නේ කොහොමද?***

***ටිල්වින් සහෝදරයා:-*** ඇත්තටම අප වැනි රටවලට එරෙහිව සිදුකරන අධිරාජ්‍යවාදී මැදිහත්වීම් වැඩිවෙන්නේම ඔවුන් බරපතළ අර්බුදයක සිටින නිසයි. අධිරාජ්‍යවාදය මුහුණ දී සිටින මේ බරපතළ අර්බුදය විසින් තව තවත් ලොව රටවල් කොල්ලකෑමට, යටපත් කර ගැනීමට, තම ආර්ථික දේශපාලන හා යුදමය වුවමනාවන්ට අනුව හසුරුවා ගැනීමට ඔවුන්ට බලකරනවා. ඒ අනුව ඔවුන් වඩාත් වැඩි වියරුවකින් කටයුතු කරනවා. අධිරාජ්‍යවාදයේ අර්බුදය වැඩිවෙන තරමට එහි ආක්‍රමණකාරිත්වය, ම්ලේච්ඡත්වය හා කෲරත්වය වැඩිවෙනවා. ඒක තමයි සත්‍යය. එහෙම වෙන්නේ, අධිරාජ්‍යවාදීන් මුහුණ දෙන ආර්ථික අවපාතයන්ගෙන් මිදීමට ඔවුන් තෝරාගන්නා එකම මග පරිධියේ රටවල සම්පත් කොල්ලකෑම හා වෙළඳපොළ අත්පත්කර ගැනීම වන නිසයි. අධිරාජ්‍යවාදය පරාජයට පත්කරන තුරු මෙම තත්වය පවතිනවා.

***නියමුවා:-ලංකාවට එරෙහිව අධිරාජ්‍යවාදීන්ගේ මැදිහත්වීම සිදුවන්නේ කුමන ආකරයෙන්ද එහි අරමුණු මොනවාද?***

***ටිල්වින් සහෝදරයා:-*** ලංකාව වැනි බොහෝ රටවලට අධිරාජ්‍යවාදීන් මැදිහත් වෙන ආකාර කිහිපයක් තියෙනවා. එම රටවල අභ්‍යන්තර ප්‍රශ්න උපයෝගී කරගෙන හෝ එවැනි ප්‍රශ්න නිර්මාණය කොට ඊට මැදිහත් වෙනවා. අවශ්‍ය නම් ආක්‍රමණය පවා කරනවා. ඉරාකය, ඇෆ්ගනිස්ථානය, ලිබියාව ඊට උදාහරණ කිහිපයක් පමණයි. ඒ වගේම රටවල් විවිධ සීමා ඔස්සේ බෙදා දුර්වල කොට යටපත් කර ගැනීම සඳහාත් මැදිහත් වෙනවා. කොසෝවෝව වෙන්කිරීමට මැදිහත්වීම, සුඩානය බෙදීම හා ලංකාවේ බෙදුම්වාදී දේශපාලනය මගින් ලංකාවට මැදිහත්වීම ඊට උදාහරණයි. ආර්ථික ක්ෂේත්‍රය ඔස්සේ මෙන්ම හමුදමය ලෙස යුද කඳවුරු පවත්වා ගනිමින් ලොව රටවලට මැදිහත් වීමද දැකිය හැකියි.

ලංකාවේදී ඔවුන් කලක් ණය ලබාදීම හරහාද දැන් ජාතික ප්‍රශ්නය මගින්ද අපේ රටේ අභ්‍යන්තර ප්‍රශ්නවලට මැදිහත් වෙමින් ඉන්නවා. ඔවුන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා එවැනි මූල්‍ය ආයතන හරහා ලංකාවේ ආර්ථික ප්‍රතිපත්තිය තමන්ට අවශ්‍ය ලෙස මෙහෙවනවා. ලංකාවේ රුපියල අවප්‍රමාණය කළේ ඔවුන්ගේ බලපෑමටයි. ඒ වගේම ලංකාව ඉරානයෙන් ඩොලර් හරහා තෙල් මිලදී ගැනීම නතර කිරීමට එක්සත් ජනපදය කටයුතු කළා. ඒ අනුව ඉරානයට එරෙහිව ඔවුන් පනවා ඇති සම්බාධකවලට ලංකාවෙත් අනියමින් හවුල් කරගත්තා. ඊට යටවෙනවා හැර ලංකාවේ ආණ්ඩුවට වෙනත් විකල්පයක් නැහැ. ලංකාව සමඟ එක්සත් ජනපදය ආරක්ෂක ගිවිසුමක් අත්සන් කළා. ඒ 2007 මාර්තුවල. ඒ මගින් ලංකාවේ භූමිය තම යුද කටයුතුවලට අවශ්‍ය විට යොදා ගැනීමේ හා සේවා ලබාගැනීමේ ඉඩකඩ ලබාගෙන තිබෙනවා. එක්සත් ජනපදයේ 'පැසිපික් කමාන්ඩ්' නම් හමුදා ඒකකය ලංකාව තුළ විවිධ සුභසාධනවලට මැදිහත් වන මුවාවෙන් ලංකාව තම වුවමනාවන්ට යොදාග න්නවා. ලංකාවේ ස්වාභාවික සම්පත් ලබා ගැනීම කරනවා. ලංකාව සම්බන්ධයෙන් එක්සත් ජනපදය උපායමාර්ගය වන්නේ, ආසියානු කලාපය තුළ එක්සත් ජනපද ආර්ථික දේශපාලන හා යුදමය කටයුතුවලදී ලංකාව ඔවුන්ගේ න්‍යාය පත්‍රය තුළ තබා ගැනිමටයි. විශේෂයෙන් ආසියාව තුළ සමාජවාදී චීනය බලවත්ව තිබෙන තත්වයක් තුළ ඔවුන්ට මෙය අත්‍යවශ්‍ය වෙනවා.

***නියමුවා:-මෙම ප්‍රශ්නයේදී ඉන්දියාවේ හැසිරීම තේරුම්ගත යුත්තේ කෙසේද?***

***ටිල්වින් සහෝදරයා:-*** කලින් සමාජවාදී කඳවුර පවතිද්දී ඉන්දියාව සෝවියට් හිතවාදී රටක් ලෙස මේ කලාපයේ ඇමරිකා එක්සත් ජනපද මැදිහත්වීම්වලට එරෙහිව ක්‍රියාත්මක වුණා. ඒ අනුව ඇමරිකානු ගැති ලංකාවක් වෙනුවට ඉන්දියානු ගැති ලංකාවක් සඳහා ඔවුන් තම ආධිපත්‍යවාදය අපේ රට මත මුදා හැරියා. බෙදුම්වාදී දේශපාලනය සන්නද්ධ ව්‍යාපාරයක් බවට පත්කිරීමේදී ඔවුන් ඊට දායක වුණා. දැන් සෝවියට් දේශය නැති තත්වය තුළ එක්සත් ජනපදය හා එක්ව සිටින ඉන්දියාව මේ කලාපයේ චීන බලපෑමට එරෙහිව ක්‍රියාත්මක වෙනවා. ලංකාව සම්බන්ධයෙන් දැන් එක්සත් ජනපදය මෙන්ම ඉන්දියාවද එකම න්‍යාය පත්‍රයකට අනුව කටයුතු කරනවා. ජිනීවා මානව හිමිකම් කොමිසමට එක්සත් ජනපදය ගෙනා යෝජනාවට පක්ෂව ඉන්දියාව ඡන්දය පාවිච්චි කරන්නේ ඒ අනුවයි. ලංකාව තුළ උතුරු නැගෙනහිරට බලය බෙදීමක් සඳහා මේ රටවල් දෙකම බලපෑම් කරනවා. පසුගිය අප්‍රේල් 17-18 දිනවල ලංකාවට ඉන්දියානු පාර්ලිමේන්තු කණ්ඩායමේ පැමිණීම තුළ තිබෙන්නේ බලය බෙදීම සඳහා ලංකාවේ ආණ්ඩුවට බලපෑම් කිරීමයි. එපමණක් නොවෙයි පසුගියදා සම්මත වුණු ජිනීවා යෝජනාව යොදාගනිමින් ලංකාවේ ආණ්ඩුව තව තවත් හිරකොට දණ ගස්වා ගැනීමට දැන් අධිරාජ්‍යවාදීන් ක්‍රියාත්මක වෙනවා. ලංකාවට එරෙහිව සිදුවන අධිරාජ්‍යාවදී මැදිහත්වීම්වල සැබෑ තත්වය එයයි.

***නියමුවා:- හොඳයි, මේ අධිරාජ්‍යවාදී මැදිහත්වීම් පරාජයට පත්කළ හැකිද? එසේ නම් ඒ කෙසේද?***


***ටිල්වින් සහෝදරයා:-*** අධිරාජ්‍යාවදය කෙතරම් අර්බුදයකට පත්ව සිටියත් එය සිය කැමැත්තෙන් නිහඬ වන්නේ නැහැ. ලෝකය මත තම ආධිපත්‍යය පවත්වා ගැනීමට හැකි හැම දෙයක්ම කරනවා. ඒ නිසා අධිරාජ්‍යවාදයේ ක්‍රියාකාරිත්වය තේරුම් ගැනීම මෙන්ම එය පැරදවීමද සරල කටයුත්තක් නොවෙයි. වරක් ලෙනින් කියූ ලෙස අධිරාජ්‍යවාදයේ පිටකටුව ශක්තිමත් වානේවලින් නිමවා තිබෙන නිසා එය ඕනෑම කුකුල් පැටියෙකුට බිඳිය හැකි එකක් නෙවෙයි. මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුවේ ඉන්න මැජික් ඇමතිවරුන්ට හෝ රාජපක්ෂ ජනාධිපතිවරයාට අධිරාජ්‍යවාදය පරද්දන්න බැහැ; වුවමනාවකුත් නැහැ. ඒ සඳහා දැවැන්ත ජනතා බලයක් අවශ්‍ය වෙනවා. ජාතිකව මෙන්ම ජාත්‍යන්තරවද එකවිට ක්‍රියාත්මක වන ජනතා බලයකින් තමයි අධිරාජ්‍යවාදය පැරදවිය හැකි වන්නේ. ඒ සඳහා ජාතික

15වැනි පිටුවට



''කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයින් වන අපි බිජුවට වැනිය. ජනතාව පස වැනිය. අප කොහේ ගියත් අපි ජනතාව සමග සමගි විය යුතුයි. ඔවුන් අතර මුල් බැස මල් පිපිය යුතුයි.''

**මාඕ සේතුං**
**උද්ධෘත පාඨ**
**පිටුව 316**



ඉතාලියේ මහා කවි දාන්තේ



ලෝකප්‍රසිද්ධ මොනාලිසා චිත්‍රය

# කලාවේ පුනරුදය ඇරඹෙයි

මධ්‍යතන යුගය තුළ සියවස් දහයකට මදක් වැඩි කාලයක් තිස්සේ පල්ලියේ ආධිපත්‍යයට යටත්කර සිර ගතකොට තිබූ කලාව යළි නිදහස ලබන්නේ ධනවාදයේ බිහිවීමත් සමගය. යුරෝපා වැඩවසම් ක්‍රමය තුළ එහි අගභාගයේදී වෙළඳාමේ යෙදුණ අය අත ප්‍රාග්ධනය සමුච්චගතවීමට පටන්ගත් අතර වෙළඳපළද ප්‍රසාරණය විය. එය දේශසීමා අභිබවා සිදුවන වෙළඳාමක් බවටද පත්විය. පුළුල්වන මෙම වෙළඳපළ සඳහා ප්‍රමාණවත් තරම් භාණ්ඩ නිපදවීමට වැඩවසම් නිෂ්පාදන රටාව අසමත් විය. වැඩවසම් ක්‍රමය තුළ පැවති ශිල්පීය හස්ත කර්මාන්ත වෙනුවට සුළු කර්මාන්ත එම තැන ගන්නා ලදී. වෙළඳුන් හා සුළු කර්මාන්ත හිමියන් අත ප්‍රාග්ධනය සංකේන්ද්‍රණය වූ අතර නව ධනපති පංතියේ කලල බීජය බවට පත්වූයේ ඔවුන්ය. වැඩවසම් ගර්භාෂය තුළ වැඩුණු මෙම ධනවාදයේ කළල බීජය ක්‍රි.ව. 14 වෙනි 15 වෙනි සියවස්වල වර්ධනය වෙමින් පැමිණ වැඩවසම් ක්‍රමය බිඳදමා ධනවාදය නම් නව සමාජ ක්‍රමයට උපත දෙන ලදී.

**පුනරුදය හෙවත් යළි ඉපදීම**

පැරණි වැඩවසම් සම්බන්ධතාවයන්ට එරෙහිව දැඩි අරගලයක නිරතවූ යොවුන් ධනවාදය සිය ධනේශ්වර නිශ්පාදන උවමනාවන් වෙනුවෙන් එතෙක් වැඩවසම් ක්‍රමය විසින් අගුළු දමා තිබූ විද්‍යාවේ, තාක්‍ෂණයේ, දේශපාලන දර්ශනයේ අගුලු බිඳ දමා ඒවාට නිදහසේ වර්ධනය වීමට ඉඩ හළේය.

කාර්මික විප්ලව හා දාර්ශනික ප්‍රබෝධයන් ඇරඹෙන්නේ මේ සමගය. කාර්මික විප්ලවයන් හා තාක්ෂණික දියුණුව මහා පරිමාණ වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා ධනපති ක්‍රමයට අවශ්‍ය වූ අතර පැරණි සමාජය පරදා ගොඩනගන නව සමාජය සාධාරණීකරණය කිරීම සඳහා දාර්ශනික විග්‍රහයන්ද අවශ්‍ය විය. එහෙත් ධනවාදය ඉන් නතර වූයේ නැත. විද්‍යාව හා තාක්ෂණය වැඩවසම් ආධිපත්‍යයෙන් මුදා ගන්නා අතරම ඒ සමගම කලාව හා සාහිත්‍යයද වැඩවසම් ආධිපත්‍යයෙන් නිදහස් කරනු ලැබීය. කලාව මෙම වකවානුව තුළ පොදුවේ හඳුන්වන්නේ, පුනරුද සමය (RENAISSANCE) යන නමිනි. මෙම පදයේ වචනාර්ථය වන්නේ RE- BIRTH හෙවත් නැවත ඉපදීම යන්නය. වැඩවසම් පාලනයේ අඳුරු යුගය තුළ සැඟවී තිබූ හෝ සඟවා ආරක්ෂා කරගෙන සිටි ග්‍රීක රෝම කලා සම්ප්‍රදායයන් යළි ඉපදීම මෙහි විශේෂය විය. කලාව ලෞකික උවමනාවන් සඳහා ආගමික සංස්ථාවන්ගෙන් මුදා නිදහසේ වර්ධනය වීමට ඉඩ හරින ලදී.

**කලාවේ මානවවාදය බිහිවීම**

1450 දී කොන්ස්තන්තිනෝපලය තුර්කි ඔටෝමාන් අධිරාජ්‍යයට යටත් වීමත් සමගම පල්ලියේ කේන්ද්‍රස්ථානය ඉතාලියට මාරුවිය. පුනරුද ව්‍යාපාරයේ ආරම්භය සනිටුහන් වන්නේද පල්ලියේ කේන්ද්‍රස්ථානයවූ ඉතාලිය තුළින්ම පල්ලියේ ආධිපත්‍යයට අභියෝග කරමිනි. මේ වනවිටත් ඉතාලිය තුළ පල්ලියේ ආධිපත්‍යයට එරෙහිව මහා කවි ඩාන්ටේ සටන් අරඹා තිබුණි. ක්‍රි.ව. 1265 -1321 කාලයේ ජීවත්වූ ඩාන්ටේ එංගල්ස් විසින් හඳුන්වනු ලැබුවේ, මධ්‍යතන යුගයේ අවසාන කවියා හා නූතන යුගයේ (ධනවාදයේ ) ප්‍රථම කවියා ලෙසය. වැඩවසම් යුගයේ අවසානයත් නැගී එන ධනවාදයේ ආරම්භයත් ඉතාලියේදී සනිටුහන් කළ කවියා වූයේ ඩාන්ටේය. මෙලෙස ඉතාලියෙන් පැනනැගුණු මුළු යුරෝපයම වෙළාගන්නා ලද පුනරුද ව්‍යාපාරයේ චින්තන සංකල්පය මගින් පිළිඹිබු කරන ලද්දේ, පුද්ගල නිදහස අර්ථවත් කළ 'මානවවාදය'යි. 'Humanism'යන ඉංග්‍රිසි පදයේ අර්ථයෙන් කියවෙන මානවවාදය නැගී එන ධනවාදයේ දේශපාලන ප්‍රකාශනය වූ ලිබරල්වාදයට අනුරූපී සාහිත්‍ය කලා මතවාදය විය. පල්ලියේ ආධිපත්‍යය බිඳ වැටෙමින් වැඩවසම් ක්‍රමය අභාවයට යද්දී කලාව යළි පණ ලබද්දී ඊට සමාන්තරව කලින් පැවති ග්‍රීක හා රෝම කලාවන්ට යළි පණ පොවන ලදී. සම්භාව්‍යවාදය හෙවත් 'Classicism' බිහිවූයේද මෙම ග්‍රීක රෝම කලාවන් යළි ඔසවා තැබීමේ සම්ප්‍රදාය තුළය.

**කලාවේ විප්ලවය හා විප්ලවයේ කලාව**

වැඩවසම් ක්‍රමය අභාවයට යවමින් නව සමාජ ක්‍රමයක් ලෙස ධනවාදයේ බිහිවීම සමාජ විප්ලවයක් විය. එම සමාජ විප්ලවය තුළ ඊට සමගාමීව තවත් විප්ලව රාශියක් සිදුවිය. විද්‍යාවේ, තාක්ෂණයේ ක්ෂේත්‍ර කාර්මික විප්ලවයන් සිදුවෙද්දී මතවාදය හා දර්ශනය තුළ විප්ලවීය වෙනස්කම් සිදුවිය. වැඩවසම් ක්‍රමයට ගැලපෙන ලෙස පැවති ක්‍රිස්තියානියට එරෙහිව නූතන ධනවාදයට ගැලපෙන සේ එහිම විකාශනයක් ලෙස ප්‍රොතෙස්තන්තවාදය බිහිවිය. ඒ අතරම කලාවේ විප්ලවීය වර්ධනයක් සිදුවිය. ධනවාදය කලාවේ විප්ලවය සිදුකළ අතර එම නව කලා සම්ප්‍රදාය අලුත බිහිවෙමින් තිබූ

> *"කලාව මෙන්ම දේශපාලනය, දර්ශනය, මතවාද, ආගම, විද්‍යාව, තාක්ෂණය, නිෂ්පාදනය යන සියලු දේ එකිනෙකට සේවය කරමින් එකිනෙකින් පෝෂණය වෙමින් වර්ධනය විය. මේ සියල්ල පිටුපස සිටි ගාමක බලවේගය වූයේ නැගී එන ධනපති පංතියයි. ධනපති පංතිය අවසානයේ තමන් කැමති ලොවක් නිර්මාණය කළේය. අනෙකුත් සියලු ක්ෂේත්‍ර සමග අතිනත් ගෙන් කලාව වර්ධනය වූයේ ඒ තුළය."*

ධනවාදයට සේවය කරමින් විප්ලවයේ කලාව බවටද පත්විය. මෙම පරිවර්තනීය යුගයේ කලාව පමණක් වියුක්තව ගෙන එහි වර්ධනය තේරුම් ගත නොහැක. කලාව මෙන්ම දේශපාලනය, දර්ශනය, මතවාද, ආගම, විද්‍යාව, තාක්ෂණය, නිෂ්පාදනය යන සියලු දේ එකිනෙකට සේවය කරමින් එකිනෙකින් පෝෂණය වෙමින් වර්ධනය විය. මේ සියල්ල පිටුපස සිටි ගාමක බලවේගය වූයේ නැගී එන ධනපති පංතියයි. ධනපති පංතිය අවසානයේ තමන් කැමති ලොවක් නිර්මාණය කළේය. අනෙකුත් සියලු ක්ෂේත්‍ර සමග අතිනත් ගෙන් කලාව වර්ධනය වූයේ ඒ තුළය.

**පුනරුදයේ කලාකරුවෝ**

ධනවාදයේ ආරම්භයේ ඇතිවූ පුනරුදයත් සමග කලාව මහා වෘක්ෂයක් ලෙස අතු ඉති ලියලා වැඩීමට පටන්ගත්තේය. නවකථාව හා කෙටිකථාව සාහිත්‍ය අංගයන් ලෙස කලාවට එක්වූයේ මේ සමගය. පසු කලෙක සිනමාව නමැති අති ප්‍රබල කලා මාධ්‍යය බිහිවූයේ, ධනවාදය තුළ එහි කාර්මික ජයග්‍රහණද එක්කර ගනිමිනි. පුනරුද සමයේ ආරම්භක කලාකරුවන් රැසක් අපට හඳුනා ගත හැක. මොවුන්ගෙන් සමහර කලාකරුවන් වන අතරම දාර්ශනිකයන් හෝ ආගමික මත දරන්නන්ද විය. පළමු නූතන කවියා ලෙස සැලකෙන්නේ, ඉතාලි ජාතික මානවවාදියෙකු වූ පෙට්‍රාච් (1304-1374) ය. කලිනුත් සඳහන් කළ ඉතාලි ජාතික මහා කවි ඩාන්ටේ (1265-1321) මධ්‍යතන යුගයේ අවසානයත් නව යුගයේ ආරම්භයත් සනිටුහන් කළ කවියා විය. මීට අමතරව පළමු නවකථාව වූ 'ඩි කැමරොන්' ලියූ ඉතාලි ජාතික ගියෝවන්නි බොකාසියෝ (1312-1375) හා ඉංග්‍රිසි ජාතික එඩ්මන්ඩ් ස්පෙන්සර් විලියම් ෂේක්ස්පියර් වැනි කවීන් හා ලේඛකයන් මෙම පුනරුද සමයේ ආරම්භකයන් වේ. එසේම ලියනාඩෝ ඩාවින්සි (1452-1519), මයිකලාන්ජලෝ (1475-1564). ගියෝතේ (1267-1337)වැනි චිත්‍ර ශිල්පීහුද පුනරුද සමයේ කලාකරුවෝ වෙති.

**කලාව හා විද්‍යාව**

අලුත උපන් ධනපති පංතිය විසින් සිය පංති උවමනාවන් සඳහා වැඩවසම් සබඳතා පුපුරුවා හරිද්දී ඒ තුළ 'නිදහස' ලද කලාව යළි ධනවාදය විසින්ම සීමා පමුණුවන තුරු වේගයෙන් වර්ධනය විය. කලාවේ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ වර්ධනය වූ එය ධනේශ්වර මතවාදයන්ගෙන්, දේශපාලනයෙන් මෙන්ම විද්‍යාවෙන්ද පෝෂණය ලැබීය. වර්තමාන ධනවාදයේ වියුක්ත අධ්‍යාපනය තුළ කලාව හා අනෙකුත් ක්ෂේත්‍ර අතර සම්බන්ධයක් ඇති බව වසන් කරන අතර කලාව ස්වාධීන හා සියල්ලට ඉහළින් පවතින නිර්මල පරම පවිත්‍ර දෙයක් ලෙස පෙන්වීමට වෑයම් දරනු දැකිය හැක. එහෙත් සත්‍යය නම් කලාවට තනිව හුදකලාව පැවතීමට හෝ වර්ධනය වීමට නොහැකි වීමය. කලාව හා විද්‍යාව මුළුමණින්ම එකිනෙකට පරස්පර ක්ෂේත්‍ර දෙකක් ලෙස බැලූ බැල්මට පෙනුණද එය එසේ නොවේ. විද්‍යාවේ වර්ධනයට කලාව හෙවත් සෞන්දර්ය සේවය කරන අතර කලාවේ වර්ධනයට විද්‍යාවද ඉමහත් දායකත්වයක් ලබාදෙයි. මේ පිළිබඳව ලියෝ ටෝල්ස්ටෝයි සිය කලාව යනු කුමක්ද නම් කෘතියේ මෙසේ පවසා තිබේ. ''විද්‍යාව හා කලාව පෙණහැලි හා හෘදයවස්තුව මෙන් බෙහෙවින් ඒකාබද්ධව පවතී. මේ එක් ඉන්ද්‍රියක් අකර්මණ්‍ය වුවහොත් අනෙක් ඉන්ද්‍රියට තත්වාකාරයෙන් ක්‍රියාකාරී විය නොහැක.''

''නියම විද්‍යාවෙන් කෙරෙනුයේ යම් සමාජයක ජනතාව විසින් අදාළ යුගයේ අතිශයින් වැදගත් යයි සලකනු ලබන සත්‍යයන් පිළිබඳව පරීක්ෂණ පවත්වමින් ඒ සත්‍යයන් අනාවරණය කිරීමය. කලාවෙන් කෙරෙනුයේ මේ සත්‍යයන් සංජානන ක්ෂේත්‍රයක සිට භාව ක්ෂේත්‍රය වෙත ආරෝපණය කිරීමය.'' ලියෝ ටෝල්ස්ටෝයි 'කලාව යනු කුමක්ද' සිංහල මුද්‍රණය 227 පිටුව

මෙම විග්‍රහය මගින් ටෝල්ස්ටෝයි කලාව හා විද්‍යාව අතර ඇති සම්බන්ධය පමණක් නොව කලාවේ අරමුණ විද්‍යාවෙන් සොයාගත් සත්‍යයන් සංජානන (අධ්‍යයන) ක්ෂේත්‍රයක සිට භාවමය ක්ෂේත්‍රයක් වෙත ආරෝපණය කිරීම බවද පවසයි. එනම් කලාව ජනතාව වෙත ලෝකය පිළිබඳව සත්‍යය ගෙනයන මාධ්‍යයක් විය යුතු බව අඟවයි. දේශපාලනය සහ මතවාද ගත් විටද කලාව හා ඒවා අතර ඇති සම්බන්ධය ඉතා පැහැදිලිය. කලාව මතවාදය ගෙන යන වාහකයක් වනවිට මතවාදය කලාව හසුරුවන කලාවේ අන්තර්ගතය තුළ පවතින දේ බවට පත්වේ. දේශපාලනයද එසේය.

අලුත උපන් ධනවාදය තුළ විප්ලවීය පිම් පනිමින් වර්ධනය වූ කලාව නව කලා මාධ්‍යයන් නිර්මාණය කරමින් නව මානයන් ඔස්සේ නිදහසේ වර්ධනය වූවත් සැබවින්ම එය නිදහස් වූයේ නැත. එය ධනවාදයේ මෙවලමක් බවට පත්විය. වැඩවසම් ආධිපත්‍යයට සාපේක්ෂව බලනවිට කලාව ඉන් මුදා ගැනීම ඉතාම ප්‍රගතිශීලී ඉදිරි පියවරක් වුවද කලාවට එම ප්‍රගතිශීලීත්වය තුළ වැඩි කලක් කටයුතු කිරීමට ධනවාදය ඉඩ දුන්නේ නැත. ධනවාදය කලාව තම ප්‍රාග්ධනයට යටකර ගත් අතර කලාකරුවාද තම ප්‍රාග්ධනයෙන් වැටුප් ලබන ශ්‍රමිකයෙක් බවට පත්කර ගත්තේය. ඒ පිළිබඳව ඓතිහාසික කොමියුනිස්ට් ප්‍රකාශනයේ සඳහන් වන්නේ මෙසේය:

**''මෙතෙක් ගරුත්වයට භාජනයවූ, ගෞරව පූර්වක විශ්මයකින් යුතුව සැලකූ හැම වෘත්තියකටම තිබූ ප්‍රභා මණ්ඩලය ධනපති පංතිය විසින් ඉවත් කෙරිණ. එය වෛද්‍යවරයා, නීතිවේදියා, පූජකයා, කවියා, විද්‍යා කටයුතුවල නිරත වන්නා ආදී හැම කෙනෙක්ම වැටුප් ලබන ශ්‍රමිකයන් බවට පත් කළේය'' (කොමියුනිස්ට් ප්‍රකාශනය, 37 පිටුව)**

එහෙත් ධනවාදයට මෙය කිරීමට සිදුවූයේ කිසිදු ප්‍රතිවිරෝධයකින් තොරව නොවේ. වැඩවසම් බැමිවලින් නිදහස ලත් කලාව ඉන්පසු නිර්මාණය වන ධනේශ්වර සීමාකම්වලට එරෙහිව අරගල කිරීමට පටන් ගත් අතර ඒ හරහා කලාවේ විවිධ ප්‍රවණතා, විවිධ මතවාද, විවිධ ගුරුකුල, විවිධ දෘෂ්ටිවාද නිර්මාණය විය. ධනපති කලාවට එරෙහිව නිර්ධන පංති කලාවක් නිර්මාණය වූයේද මෙම අරගලය තුළය. ධනවාදය තුළ කලාවේ මෙම සංකීර්ණ ගමන්මග පිළිබඳව අපි මීළඟට කථා කරමු.

# ජනතා විමුක්ති පෙරමුණේ මැයි දින යෝජනා

වැඩකරන ජනතාව පැය 8කට සීමා වූ වැඩ දිනයක් දිනාගැනීම සමරන දිනය මැයි දිනයයි. මැයි දිනය ලොව පුරා වැඩකරන ජනතාව සිය සමඟියේ ශක්තිය ගොණු කරන ලෝක කම්කරු දිනයයි.

2012 මැයි දිනය සමරන මේ මොහොත වන විට මහින්ද රාජපක්ෂගේ අධිරාජ්‍යගැති ධනපති පාලනය යටතේ ශ්‍රී ලංකාව මෙතෙක් නොවූ විරූ ආර්ථික, දේශපාලන, සමාජ හා සදාචාර බංකොලොත්භාවයක ගිල්වනු ලැබ ඇත. අධිරාජ්‍යවාදී ''ගෝලීයකරණයේ'' ගොදුරක් බවට පත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකාව මුහුණ දී ඇති වර්තමාන අර්බුදයට ධනවාදය තුළ විසඳුමක් නැත.

ජාත්‍යන්තර ක්ෂේත්‍රය පිළිබඳව සලකා බලන විට අධිරාජ්‍යවාදයේ නූතන ප්‍රකාශනය වන නිදහස් වෙළඳපොළ ධනවාදය නොහොත් නව ලිබරල් ධනවාදය මේ මොහොතේ වේගයෙන් එහි අවසානය කරා ඇදෙමින් තිබේ. 2008 මූල්‍ය අර්බුදයටත් ඊට අමතරව මේ වන විට දැවැන්ත ණය අර්බුදයකටත් මුහුණ දී ඇති ඇමරිකා එක්සත් ජනපදය හා බටහිර යුරෝපයේ අධිරාජ්‍යවාදී රටවල් පවා මේ අර්බුදයට විසඳුම ලෙස ඒවායේ ජනතාව අති දුෂ්කර අරගල හරහා දිනාගත් ආර්ථික හා දේශපාලන අයිතීන් මුලුමණින්ම ආපසු උදුරා ගන්නා තැනට වැටී ඇත. ඊට එරෙහිව එකී රටවල් තුළ ජනතාවෝ දශලක්ෂ ගණනින් සටන් බිමට පැමිණ සිටිති.

අධිරාජ්‍යවාදී ගෝලීයකරණය මානව වර්ගයාත් මහ පොළොවත් විනාශ කරමින් සිදුකරන අපරාධය දෙස කිසිවෙකුටත් නිෂ්ශබ්දව බලා සිටිය නොහැක.

ඉහත සඳහන් ජාතික හා ජාත්‍යන්තර තත්වයන් ගැඹුරින් සැලකිල්ලට ලක් කරන ජනතා විමුක්ති පෙරමුණ පහත සඳහන් යෝජනා මෙම රතු මැයි රැලිය ඉදිරියේ තබයි.

## ජාතික ක්ෂේත්‍රය

1. මහින්ද රාජපක්ෂ පාලනය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හවුල ජනතාවට කිසිසේත්ම දරා ගත නොහැකි පරිදි සාහසික ලෙස ජීවන වියදම වැඩිකර ඇත. එබැවින් ජනතාව මත පටවා ඇති ජීවන බර අඩුකිරීමට වහාම පියවර ගන්නා ලෙසත් ලාංකේය වැඩකරන ජනතාවට, ධීවර ජනතාවට, ගොවි ජනතාව ඇතුළු සියලු ජනතාවන්ට වහාම සහන සලසන ලෙසත් මෙම රතු මැයි රැලිය මහින්ද රාජපක්ෂ පාලනයට බලකර සිටී.
2. අධිරාජ්‍යවාදී වුවමනාවන්ට අනුව කටයුතු කරමින් නිදහස් අධ්‍යාපනය හා නිදහස් සෞඛ්‍ය සේවාව අහෝසි කිරීමට රාජපක්ෂ පාලනය ගනිමින් තිබෙන උත්සාහය දැඩි පිළිකුළෙන් යුතුව හෙළා දකින මෙම රතු මැයි රැලිය, නිදහස් සෞඛ්‍ය සේවාවට අත නොතබන ලෙසත් පෞද්ගලික විශ්ව විද්‍යාල පිහිටුවීම ඇතුළු නිදහස් අධ්‍යාපනය අහෝසි කරන සියලු ක්‍රියාමාර්ග වහාම නතර කරන ලෙසත් ආණ්ඩුවට බලකර සිටී.
3. උතුරු හා නැගෙනහිර පළාත් තුළ පවත්වාගෙන යනු ලබන අර්ධ හමුදා පාලනය අවසන් කිරීමටත්, සිවිල් පාලනය ස්ථාපිත කිරීමටත්, සාමාන්‍ය ජන ජීවිතය සහතික කිරීමටත් වහාම පියවර ගන්නා ලෙස මෙම මැයි රැලිය මහින්ද රාජපක්ෂ පාලනයට බලකර සිටී.
4. ජෙනරාල් සරත් ෆොන්සේකා ඇතුළු සියලු දේශපාලන සිරකරුවන් වහාම නිදහස් කරන ලෙස ජනතා විමුක්ති පෙරමුණේ මෙම රතු මැයි රැලිය ආණ්ඩුවට බලකර සිටී.
5. පැහැරගෙන යාම්, අතුරුදහන් කිරීම්, ඇතුළු රට පුරා පැතිරෙන අපරාධ වහාම නතර කරන ලෙසත්, බියෙන් හා සැකෙන් තොරව ජීවත්වීමට හැකි වටපිටාවක් තහවුරු කරන ලෙසත් ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් හා මානව අයිතීන් තහවුරු කිරීමට වහාම පියවර ගන්නා ලෙසත් මහින්ද රාජපක්ෂ පාලනයට මෙම රතු මැයි රැලිය බලකර සිටී.
6. මහින්ද රාජපක්ෂගේ අධිරාජ්‍යගැති, ධනපති පාලනය ශ්‍රී ලංකාව ආර්ථික-දේශපාලන-සමාජ-සදාචාර වශයෙන් බංකොළොත්භාවයට පත්කර ඇත. අධිරාජ්‍යවාදී බලපෑම්වලට රට ගොදුරුකර ඇත. මේ බංකොලොත්භාවයෙන් රටත්, ජනතාවත් මුදාගත හැක්කේ අධිරාජ්‍යවිරෝධී, ධනේශ්වරවිරෝධී අරගලයේ ජයග්‍රහණය තුළින් යයි දැඩිව විශ්වාස කරන මෙම රතු මැයි රැලිය, ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් ගොඩනැගෙන අධිරාජ්‍යවිරෝධී-ධනේශ්වරවිරෝධී පුළුල් ජනතා ව්‍යාපාරය වටා මතවාදීමය වශයෙන් හා සංවිධානමය වශයෙන් වහාම පෙළ ගැසෙන ලෙසත් ජයග්‍රහණය දක්වා සටන්වදින ලෙසත් ශ්‍රී ලංකාවේ වැඩකරන ජනතාවට, ගොවි ජනතාවට, ධීවර ජනතාවට, කාන්තාවන්ට, තරුණයන්ට, ශිෂ්‍යයන්ට, වෘත්තීයවේදීන්ට හා තාක්ෂණවේදීන්ට, සාහිත්‍ය-කලා සූරීන්ට, මාධ්‍යවේදීන්ට, ප්‍රගතිශීලීන්ට, ප්‍රජාතන්ත්‍රවාදීන්ට, මානව හිතවාදීන්ට, පරිසර හිතවාදීන්ට ආයාචනය කර සිටී.

## ජාත්‍යන්තර ක්ෂේත්‍රය

1. අධිරාජ්‍යවාදය මුහුණ දී ඇති මරණීය අර්බුදයේ ගොදුරු බවට පත්වී ඇති ලොව පුරා දශලක්ෂ සංඛ්‍යාත ජනතාවන් විසින් දියත් කරනු ලැබ ඇති අධිරාජ්‍යවිරෝධී ධනේශ්වරවිරෝධී අරගලයට ජනතා විමුක්ති පෙරමුණේ මෙම රතු මැයි රැලිය කොන්දේසි විරහිතව සහයෝගය පළකර සිටී.
2. ඇමරිකා එක්සත් ජනපදය විසින් උතුරු කොරියාවට, ඉරානයට එරෙහිව සිදුකරන බියවැද්දීම් තර්ජනයන් හා සම්බාධක පැනවීම් දැඩි පිළිකුලෙන් හෙළා දකින මෙම රතු මැයි රැලිය මෙම රටවලට එරෙහි අසාධාරණ මැදිහත්වීම් වහා නතර කරන ලෙස එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදී රටවලට බලකර සිටී.
3. සමාජවාදී කියුබාවට එරෙහිව වසර 50ක් තිස්සේ සම්බාධක පවත්වාගෙන යමින් එක්සත් ජනපදය සිදුකරන මානවවිරෝධී ක්‍රියාමාර්ග හා කුමන්ත්‍රණ දැඩි පිළිකුළෙන් යුතුව හෙළා දකින මෙම රතු මැයි රැලිය කියුබාවට අත නොතබන ලෙසත් අසාධාරණ ලෙස සිරගතකොට සිටින කියුබානුවන් පස් දෙනා වහා නිදහස් කරන ලෙසත් එක්සත් ජනදයට බලකර සිටී.
4. ලොව පුරා වෙසෙන දශලක්ෂ සංඛ්‍යාත අධිරාජ්‍යවිරෝධී, ධනවාදවිරෝධී ජනතා අරගල ඒකරාශී කිරීම සඳහා අධිරාජ්‍යවිරෝධී ධනවාදවිරෝධී ජාත්‍යන්තර මධ්‍යස්ථානය ගොඩනැගීමටත් අධිරාජ්‍යවාදී ගෝලීයකරණය පරදවා සමාජවාදී ගෝලීයකරණය ජයග්‍රහණය කරවීමටත් පෙරට එන ලෙස ලොව පුරා සිටින සමාජවාදීන්ට හා සමාජවාදී සංවිධානවලට ජනතා විමුක්ති පෙරමුණේ මෙම රතු මැයි රැලිය අයාචනය කර සිටී.

ජනතා විමුක්ති පෙරමුණ - 2012 මැයි 01 දා



''අප එල්ලා මරා දැමීමෙන් දුක්ඛිත කාලකණ්ණිභාවයට ඇද දමන ලද පීඩිත දශ ලක්ෂ සංඛ්‍යාත ජනතාවකගේ බලාපොරොත්තුව වූ කම්කරු ව්‍යාපාරය සහමුලින් නැතිකර දැමිය හැකි යැයි ඔබ සිතන්නේනම් අප එල්ලා මරන්න! මෙහිදී ඔබ පාගා දමනු ඇත්තේ, ගිනි පුපුරකි. එහෙත් සෑම තැනකම, ඔබ පිටුපසද ඔබ ඉදිරිපසද සෑම තැනකම ගිනිදලු නැගෙනු ඇත. එය පොළොව අභ්‍යන්තරයෙන් නැගෙන්නා වූ ගින්නකි. ඔබට එය නිවිය නොහැකිය.''

**ඔගස්ට් ස්පයිස්**
**-පැය 8 වැඩ දිනය ඉල්ලා අරගල කිරීමේ හේතුවෙන්1886දී මරණ දඬුවම නියමවීමෙන් පසු අධිකරණය අමතමින්-**

# ජනතා විමුක්ති පෙරමුණේ මැයි දින පණිවුඩය

අද මැයි දිනයයි. මැයි දිනයේ ඉතිහාසය යනු පැය 8කට සීමාවූ වැඩ දිනයක් දිනා ගැනීම සඳහා වැඩකරන ජනතාව ජීවිත, ලේ, දහඩිය, අසීමිත ලෙස පරිත්‍යාග කරමින් දිගු කලක් තිස්සේ නොනැවතී ජයග්‍රහණය තෙක් පෙරට ගෙන ගිය කටුක අරගලයේ ඉතිහාසයයි. එම අරගලයේදී මිල කළ නොහැකි පරිත්‍යාග කරමින් සටන් කළ වීරවරියන් වීරවරුන් සැමරීම සඳහා වෙන් වුණු මැයි දිනයේදී ලොව පුරා ජනතාව සිය ශක්තිය ඒකරාශී කරති; ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් ශ්‍රී ලාංකේය වැඩකරන ජනතාව මැයි දිනය සමරන ලොව පුරා ජනතාව සමඟ අත්වැල් බැඳගනී.

මහින්ද රාජපක්ෂගේ අධිරාජ්‍යගැති ධනපති පාලනය යටතේ මේ වන විට ශ්‍රී ලංකාව විශාල සමාජ ආර්ථික, දේශපාලන අර්බුද රැසකට මුහුණ දී සිටී. රට ආර්ථික වශයෙන් දැවැන්ත විදේශ ආදායම් හිඟයකට මුහුණ දී ඇත. එනිසා මේ රට විදේශ ණය උගුලකට හසුවී ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි අධිරාජ්‍යවාදී ආයතනවලින් ණය ගන්නා ආණ්ඩුව දැන් කල් පිරෙන ණය හා ණය සඳහා වූ පොලියද ගෙවීම සඳහා තවත් ණය ගන්නා තැනට වැටී ඇත. ඒ සඳහා වූ කොන්දේසි අනුව ශ්‍රී ලංකා රුපියලේ අගය එක්සත් ජනපද ඩොලරය ඇතුළු විදේශ මුදල් ඉදිරියේ පහත දමනු ලැබේ. මේ අතර දේශීය කර්මාන්ත., ව්‍යාපාර, කෘෂිකර්මාන්තය සේවා වේගයෙන් කඩා වැටේ. ජාතික ආදායම පහත වැටේ . මේ තත්වය තුළ ආණ්ඩුව එහි ආදායම වැඩි කරගන්නේ ජනතාවට දරන්නට බැරි අන්දමට බදු වැඩි කිරීමෙන්ය. වැඩි වැඩියෙන් දඩ පැනවීමෙන්ය. ඒ හැරුණු විට කෝටි ගණනින් රුපියල් මුද්‍රණය කිරීමෙන්ය.

වේගයෙන් වැඩිවන ජීවන වියදම තව දුරටත් දරා ගන්නට නොහැකි තත්වයට ජනතාව මුහුණ දී ඇත. මුළු ජනගහනයෙන් 53%ක් අද උපයන්නේ දුප්පත් කෑම වේලක් පමණක් සරි කරගන්නට තරම් වූ සුළු මුදලකි.

ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය හා අභිමානය ආරක්ෂා කිරීමට අසමත් වී ඇති මහින්ද රාජපක්ෂ පාලනය විශේෂයෙන්ම ඇමරිකානු එක්සත් ජනපද අධිරාජ්‍යවාදය හා ඉන්දීය ආධිපත්‍යයවාදය ඉදිරියේ ශ්‍රී ලංකාව බාල්දු කර ඇත. අධිරාජ්‍යවාදීන්ට ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට අතපෙවීමට අවශ්‍ය ඉඩකඩ නිර්මාණය කර දී ඇත. ඒ තුළ ලංකාව අධිරාජ්‍යවාදයේ ගොදුරක් වීමේ අවදානම මතුවී තිබේ.

ලාංකේය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්, මානව අයිතීන්, උදුරා ගන්නා මහින්ද රාජපක්ෂ පාලනය රාජපක්ෂ පවුලේ ඒකාධිපතිත්වයකට රටත් ජනතාවත් යට කරමින් තිබේ.

උතුරු නැගෙනහිර ජනතාවගේ මූලික වුවමනා ඉටු කරමින් ජාතික සමගිය, සමානාත්මතාවය හා ප්‍රතිසන්ධානය ස්ථාපිත කිරීමට අසමත් වූ ආණ්ඩුව ජාතිවාදය හා බෙදුම්වාදය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පරිසරය සකස් කර ඇත.

ජනතාවගේ මූලික අවශ්‍යතා වන කෑම බීම, ඉඳුම් හිටුම්, ඇඳුම් පැළඳුම්, බෙත් හේත්, අධ්‍යාපනය රැකී රක්ෂා ආදිය සැපයීමට මහින්ද රාජපක්ෂ පාලනයට නොහැකි නිසා සමාජ ප්‍රශ්න උග්‍ර වී තිබේ; අපරාධ වැඩිවී තිබේ.

ජනතාවට බියෙන් සැකෙන් තොරව ජීවත් විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමට අසමත්ව ඇති රාජපක්ෂ පාලනය රට තුළ උත්සන්න වන අපාරාධ වැළැක්වීමට අසමත්ව සදාචාරමය වශයෙන් රට ප්‍රපාතයකට හෙළා තිබේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා තවත් එවැනි අධිරාජ්‍යවාදී ආයතන හා එක්ව හවුලේ ශ්‍රී ලංකාව ආර්ථික, දේශපාලන, සමාජමය හා සදාචාරමය වශයෙන් බංකොලොත්භාවයට පත්කරනු ලැබූ අධිරාජ්‍යගැති ධනපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු එක්සත් ජනතා නිදහස් සන්ධානයත්, එක්සත් ජාතික පක්ෂයේ බෙදී ගිය පාර්ශව දෙකත් ශ්‍රී ලංකාව මේ වැටී ඇති බංකොලොත්භාවයෙන් මුදා ගැනීමට සමත් නොවන බව සහතිකය. ලංකාව මුහුණ දී ඇති අර්බුදයන්ගෙන් හා අධිරාජ්‍යවාදී මැදිහත්වීම්වලින් මුදාගැනීම සාක්ෂාත් කිරීමට හැක්කේ, අධිරාජ්‍යවිරෝධී ධනවාදවිරෝධී අරගලයේ ජයග්‍රහයණය තුළින් පමණි. ඒ සඳහා පුළුල්තම අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරයක් නිර්මාණය කිරීම සඳහා ලාංකේය කම්කරු පංතිය ප්‍රමුඛ වැඩකරන ජනතාව පෙරමුණ ගත යුතුව ඇත. මෙම මැයි දිනයේදී වැඩකරන ජනතාවගේ අධිෂ්ඨානය විය යුතුව ඇත්තේ එයයි.

එම නිසා ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් ගොඩනැගෙන අධිරාජ්‍යවිරෝධී, ධනවාදීවිරෝධී පළල් පෙරමුණ වටා මතවාදීමය වශයෙන් හා සංවිධානමය වශයෙන් වහාම පෙළ ගැසෙන ලෙසත් ජයග්‍රහණය දක්වා සටන් වදින ලෙසත් ශ්‍රී ලංකාවේ වැඩකරන ජනතාවට, ගොවි ජනතාවට, ධීවර ජනතාවට, කාන්තාවන්ට, තරුණයන්ට, ශිෂ්‍යයන්ට, වෘත්තීයවේදීන්ට, තාක්ෂණවේදීන්ට, සාහිත්‍ය කලාසූරීන්ට, ප්‍රජාතන්ත්‍රවාදීන්ට, මානව හිතවාදීන්ට, පරිසර හිතවාදීන්ට ජනතා විමුක්ති පෙරමුණ ආරාධනය කරයි.

**අධිරාජ්‍යවාදයට විනාශය - ජනතාවට විමුක්තිය!**
**ධනවාදයට විනාශය - සමාජවාදයට විජයග්‍රහණය!!**

**දේශපාලන මණ්ඩලය**
**ජනතා විමුක්ති පෙරමුණ**
**2012 මැයි 01 දා**

# සැබෑ ජයග්‍රහණයන්ගේ දිශාවට රට හැරවිය යුතුයි!

## ලාල්කාන්ත සහෝදරයා - ජාතික සංවිධායක සමාජවාදී කම්කරු සංගමය සභාපති - ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය



අද වන විට අපේ රට ආර්ථික, දේශපාලනික හා සමාජීය වශයෙන් බරපතළ අර්බුද ගණනාවකට මුහුණ දී තිබෙනවා. ආණ්ඩුව සංඛ්‍යා ලේඛන කොළවල අච්චු ගසමින් රටට කුමක් ප්‍රකාශ කළත් දෛනිකව තම ජීවිතය පවත්වාගෙන යාමේ අතිශය අමාරුකමකට අපේ රටේ සාතිශය බහුතර ජනතාවක් පත්වී සිටින බවට විවාදයක් නැහැ. විශේෂයෙන් රාජපක්ෂ ආණ්ඩුවේ අදූරදර්ශී ආර්ථික ප්‍රතිපත්තිය නිසාවෙන් ඉතා දරුණු ආර්ථික අවපාතයකට අපේ රට පත්වෙමින් තියෙනවා. වසර ගණනාවක සිට අපේ රටේ නිශ්පාදන ක්‍රියාවලියේ වර්ධනයක් අත්පත් කරගෙන නැහැ. ඒ වෙනුවට සේවා ආර්ථිකය ඉදිරියට ගෙන ඒමට ආණ්ඩුව උත්සාහ දරමින් සිටිනවා. එය කිසිසේත්ම රටක ආර්ථික තත්වය ස්ථාවර කිරීමට යොදා ගනු ලබන්නක් නොවෙයි. විශේෂයෙන් සේවා ආර්ථිකය රදා පවතින්නේ අදාළ රටේ ක්‍රියාවලියට පමණක් නොවන නිසා එහි විචල්‍යතාවය අවදානමක පවතිනවා. උදාහරණයක් ලෙස ගත්තොත් සංචාරක ව්‍යාපාරය පදනම් කරගෙන අපේ රටේ ආර්ථික ශක්තිමත් කිරීම ආණ්ඩුවේ දැක්ම බවට පත්වී තිබෙනවා. සංචාරකයන් අපේ රටට පැමිණීම මෙහිදී තීරණාත්මක සාධකය බවට පත්වෙනවා. නමුත් සංචාරකයන් අපේ රටට පැමිණීම තීරණය වන්නේ අපේ රට මත පමණක් නොවෙයි. සමහර විට එය රටක ප්‍රශ්නයක් වගේම කලාපයට අදාළ ප්‍රශ්නයක් වන්නටත් පුළුවන්. එවිට සංචාරක ව්‍යාපාරයෙන් උපයා ගැනීමට ඉලක්ක කරන ආදායම අහිමිවී යනවා පමණක් නොව යටිතල පහසුකම් නඩත්තු කිරීම වෙනුවෙන් වියදම් දැරීමටද සිදුවනවා. සේවා ආර්ථිකයේ ස්වභාවය අවිනිශ්චිතකමයි. එවැනි ක්‍රමයක් රටක ප්‍රධාන ආර්ථික ඉපැයීමක් ලෙස යොදා ගන්නේ නැහැ. නමුත් රාජපක්ෂ ආණ්ඩුවේ දැක්ම වී තිබෙන්නේ එයයි. එම නිසාම ඉතිහාසයේ අන් කවරදාකටත් වඩා වැඩියෙන් ණය ගැනීම සඳහා රාජපක්ෂ ආණ්ඩුව යොමු වී තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි අධිරාජ්‍යවාදීන්ගේ ප්‍රධාන මූල්‍ය මධ්‍යස්ථානවල සිරකරුවන් බවට රාජපක්ෂ ආණ්ඩුව පත්වී තිබෙනවා. අනෙක් පැත්තෙන් යුද්ධයේ නිමාවත් සමඟ රට තුළ අලුත් දේශපාලන කතිකාවක් ගොඩ නැගිය යුතුව තිබුණා. නමුත් රජපක්ෂ පාලනය ඒ වෙනුවට සිදුකරමින් තිබෙන්නේ එදා බෙදුම්වාදීන් සන්නද්ධ පෙරමුණ මගින් සම්පූර්ණ කර ගැනීමට උත්සාහ දරන ලද ක්‍රියාවම සංහිදියාව පෙන්වමින් සම්පූර්ණ කිරීමටයි. ඒ වෙනුවෙන් විවිධ උපක්‍රම අනුගමනය කිරීමට රාජපක්ෂ ආණ්ඩුව කටයුතු කරමින් තිබෙනවා. LLRC වාර්තාව එය එළියට විවෘත කරන ලද එක් ප්‍රකාශනයක් පමණයි. තවත් එවැනි ප්‍රකාශන, ක්‍රියාකාරකම් ඉදිරියේදිත් දකින්නට පුළුවන්කම ලැබේවි. එයින් පැහැදිලි වන්නේ රාජපක්ෂ ආණ්ඩුවට ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් නිසි දැක්මක් හෝ එය විසඳීම සඳහා වන නිසි වැඩපිළිවෙළක් හෝ නොමැති බවයි. අනෙක් පැත්තෙන් ඔවුන්ගේ ආර්ථික උපායමාර්ගයට සරිලන ආකාරයට සමාජ සංස්කෘතිය පෙළ ගැස්වීමට අදාළ කටයුතුද මේ වන විට සිදුකරමින් තිබෙනවා. ඒ අනුව අධිරාජ්‍යවාදීන්ගේ උපායමාර්ගික සැලැස්මට අනුව ආර්ථිකයත් දේශපාලනයත් සංස්කෘතියත් හැඩගැස්සවීම සඳහා වන ක්‍රියාකාරීත්වයක රාජපක්ෂ ආණ්ඩුව සිටින බව පැහැදිලියි. මේ අනුව රටක් ලෙස තවදුරටත් ඉදිරියට යා නොහැකි තරමට සෑම පැත්තකින්ම අපව සිරකිරීමට අධිරාජ්‍යවාදීන්ට ඉඩ හදමින් රාජපක්ෂ ආණ්ඩුව කටයුතු කරන බව පැහැදිලියි. අපට අනන්‍යවූ මාවතක ඉදිරියට ගමන් කිරීමේ ධෛර්යයක් හෝ අධිෂ්ඨානයක් රාජපක්ෂ ආණ්ඩුවට නොමැතිවීම නිසා රට මෙවැනි ගැඹුරු අර්බුදයකට ලක්වෙමින් තිබෙනවා. එම නිසා පරණ මතකයන් යළි යළිත් මතකයට ගනිමින් අප මුහුණදෙන සංකීර්ණ ගැටලුවලට පිළිතුරු ලබා ගැනීමට නොහැකියි. අපේ රටට එරෙහිව ගොඩනැගෙමින් තිබෙන අධිරාජ්‍යවාදී බලපෑමට එරෙහිව මුහුණ දීම සඳහා සූදානම් වනවා වෙනුවට රාජපක්ෂ ආණ්ඩුව එය ඉදිරියේ දණ ගසා ඇති බව දැන් ඉතා පැහැදිලියි. අධිරාජ්‍යවාදීන් ඉදිරියේ දණ ගසන කිසිදු පාලකයකුට රටේ ජනතාවට සැබෑ ජයග්‍රහණ ලබාදිය නොහැකි බව ලෝකයේ රටවල් ගණනාවක අත්දැකීම් වලින් තේරුම්ගත හැකියි.

එසේම ඔවුන් ඉදිරියේ දණ නොගැසූ පාලකයන් රටේ ජනතාවට සැබෑ ජයග්‍රහණ ලබාදී ඇති බවද ලෝකයේ රටවල් වල අත්දැකීම්වලින්ම අපට වටහා ගත හැකියි. එම නිසා ලිහලා බලපු මල්ල ඔබල බැලීමේ අවශ්‍යතාවයක් නැති නිසා දැන් රටට අලුත් මාවතක් අවශ්‍ය බව ඉතාමත් පැහැදිලියි. ඒ මාවතේ ගමන් කිරීමට කැමති බොහෝ පිරිසක් රට තුළ සිටින බවත් අපි දන්නවා. අධිරාජ්‍යවාදී බලපෑමට එරෙහි සැබෑවටම රටට ආදරය කරන බලවේග රාශියක් අප රට තුළ සිටින බව සත්‍යයක්. විශේෂයෙන් අපේ රටේ වැඩකරන ජනතාව තමන්ගේ ජීවිතවලට සැබෑවටම නිදහස ලැබෙන නව මාවතක ගමන් කිරීම සඳහා පෙරමුණ ගත යුතුව තිබෙනවා. ඒ සඳහා ඔවුන් සූදානම් බව ඉතා පැහැදිලියි. ඒ නිසාම මෙවරත් අපි වෘත්තීය සමිති ව්‍යාපාරය ලෙස වැඩකරන ජනතාවගේ එකම පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුණේ රතු මැයි රැලියට එකතු වීමට තීරණය කර තිබෙනවා. මෙවර අපේ පක්ෂයේ මැයි දින තේමාව වන්නේ ''අධිරාජ්‍ය විරෝධී පෙරමුණක්, සමාජවාදී පාලනයක් වෙනුවෙන් ජනතාව පෙළගස්වන රතු මැයි රැලිය'' යන්නයි. දැන් රටට අවශ්‍ය කරන්නේ එවැනි දැක්මක් සහිත පාලන ක්‍රමයක් බව ඉතා පැහැදිලියි. සැබෑවටම අධිරාජ්‍යවාදය පැරදවිය හැක්කේත් එවැනි පාලන ක්‍රමයකට පමණක්මයි. එම නිසා අපි හිතනවා මෙවර මැයි දිනය සැබෑ ජයග්‍රහණයන්ගේ දිශාවට රට හරවන මැයි දිනයක් කරගත යුතුයි කියලා.

# ආණ්ඩුවේ පැවැත්ම අභියෝග යට ලක්වී අවසන්

## චන්දන සූරියආරච්චි - ප්‍රධාන ලේකම්, රැකියාලාභී උපාධිධාරී සංගමය

මේ ආණ්ඩුව හැමදාම කළේ විවිධ ප්‍රකාශ නිකුත් කරමින් රටේ ජනතාව රැවටීමට ලක්කිරීමයි. කාලයක් තිස්සේ ජනතාව අවබෝධයෙන් නමුත් ඒ රැවටීමට ලක් වුණා කියන එක අවිවාදිතයි. නමුත් මේ මොහොත වන විට ආණ්ඩුවේ වසන්ත සමය අවසන්වී තිබෙනවා. එක පැත්තකින් දිනෙන් දින ඉහළ යන ජීවන වියදම හමුවේ වැඩකරන ජනතාව ඇතුළු රටේ සියලුම ජනතාව දැඩි දුෂ්කරතාවයකට ලක්වී තියෙනවා. අනෙක් පැත්තෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි ආයතන ඉදිරියේ වැඳවැටීම නිසා ඔවුන්ගේ ග්‍රහණයට රට නතුකරමින් තිබෙනවා. මේ සියල්ල හමුවේ අපේ රටේ වැඩකරන ජනතාව පුළුල් උවමනාවක් වෙනුවෙන් ඒකරාශී කිරීම සඳහා වූ අධිරාජ්‍යවිරෝධී සැබෑ ජනතා ව්‍යාපාරයක ආරම්භයත් සිදුවෙමින් තිබෙනවා. මේ සියල්ලෙන්ම තහවුරු වන්නේ ආණ්ඩුවේ පැවැත්ම අභියෝගයට ලක්වී තිබෙන බවයි.

# වැඩකරන ජනතාවගේ බෙදීම් අවසන් කළ යුතුයි

## මහින්ද ජයසිංහ - ප්‍රධාන ලේකම්, ලංකා ගුරු සේවා සංගමය

අපේ රටේ වැඩකරන ජනතාව විවිධ බෙදීම්වලට ලක්කිරීම පාලකයන්ගේ වුවමනාව බව ඉතා පැහැදිලියි. විවිධ ක්ෂේත්‍රවල රැකියාවන්හි නියුතු වැඩකරන ජනතාව එක් එක් ක්ෂේත්‍රය තුළත් බෙදීම්වලට ලක්කොට තිබෙනවා. ඒ නිසාම පාලකයන්ට තම වුවමනාවන් ඉටුකර ගැනීමේ පහසුවක් ලැබී තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තොත් උපාධිධාරී, පුහුණු, ඩිප්ලෝමාධාරී, ශ්‍රේණිධාරී ආදී වශයෙන් බෙදීම්වලට ලක්කොට තිබෙනවා. ඒ වගේම සම්පත් බෙදීයාමේ විෂමතාවය නිසා වර්ගීකරණයට ලක්කර තිබෙන පාසල්වල සේවයට යොමු වන ගුරුවරුන් තුළත් එකී පාසල් පදනම් කරගෙන බෙදීම් ඇතිකොට තිබෙනවා. නමුත් අපි සියල්ලෝම වැටුප් ශ්‍රමිකයන් බව වටහා ගතහොත් පාලකයන්ට ඔවුන්ගේ අපේක්ෂාවන් මුදුන්පත් කරගත නොහැකි වෙනවා. එම නිසා අපේ රටේ වැඩකරන ජනතාව පාලකයන්ගේ වුවමනාවන් වෙනුවෙන් ඇතිකොට තිබෙන මෙම බෙදීම් අවසන් කළ යුතුයි. එකී බෙදීම් කිසිසේත්ම වැඩකරන ජනතාවට ජයග්‍රහණ ගෙනදෙන්නේ නැහැ.

# වෘත්තී... සටන්ක...

වසරකට දින 365 කි. එයින් බොහෝ දිනයන් කුමක් හෝ සිදුවීමක් වෙනුවෙන් නැතහොත් යම් නිශ්චිත කරුණක් වෙනුවෙන් හෝ යම් දෙයක් වෙනුවෙන් වෙන්කර තිබේ. එසේ වුවද මුළු මහත් ලෝකයක් පුරා වැඩකරන ජනතාව වෙනුවෙන් වෙන් කරන ලද දිනය අන් සෑම දිනයකටම වඩා සුවිශේෂී දිනයක් වන්නේ එම දිනය තමන්ගේ වෘත්තීය අයිතීන් ඉක්මවා ගිය දිනයක් ලෙස ලෝක ඉතිහාසය තුළ නොමැකෙන මෙන්ම මකා දැමිය නොහැකි සටහනක්ව තිබෙන නිසාය.

පාලකයන්ගේ පීඩනය ඉවසා දරාගෙන එයට එරෙහිව කිසිවක් නොකොට සිටීමට පීඩිත ජනතාව දරන ලද උත්සාහයන් තවදුරටත් වලංගු නොවන බව ඒත්තු ගිය පසු ඇමරිකාවේ චිකාගෝ නුවර වැඩකරන ජනතාව 1886 මැයි 01 දින පීඩකයන්ට එරෙහිව පාරට බසින ලදී. අද මෙන්ම එදත් පීඩකයන්ගේ පිළිතුර වූයේ මර්දනය මුදා හැරීමයි. හතරවටින් එල්ල වූ වෙඩි ප්‍රහාරයන් හේතුවෙන් සුදු කොඩි අතින් ගෙන නිරායුධ බව ප්‍රදර්ශනය කරමින් තම ජීවත්වීමේ අයිතිය වෙනුවෙන් පාරට බට වැඩකරන ජනතාව පාලකයන්ගේ වෙඩි උණ්ඩයට ගොදුරුව දහස් ගණන් මරණයට පත්විය. එදා ඇමරිකානු පාලකයෝ ජය අත්කර ගත්හ. එහෙත් ජීවිත පරිත්‍යාගයෙන් ඇරඹි සටන එතෙකින් කෙළවර නොවීය. 1889 එංගල්ස්ගේ නායකත්වයෙන් රැස් වූ දෙවන ජාත්‍යන්තරයේ පළමු සමුළුවේදී එදා 1886 කම්කරුවන් මරා දැමීම ප්‍රධාන මාතෘකාවක් බවට පත් විය. එහිදී යෝජනා වූයේ ජීවිත පරිත්‍යාගයෙන් ඇරඹි සටන ඉදිරියට ගෙන යාම අරමුණු කර ගනිමින් මැයි 01 ලෝකය පුරා වැඩකරන ජනතාවගේ සටන්කාමීත්වය සමරන දිනය විය යුතු බවය. එතැන් පටන් අඛණ්ඩව වසර 122 ක් පුරාවට ලොව පුරා වැඩකරන ජනතාව මෙම දිනය තමන්ගේ දිනය ලෙස සලකමින් පාලකයන්ට එරෙහිව පාරට බැසීමට යොදා ගන්නා ලදී. මෙවර එළඹ ඇත්තේ එහි 123 වන වසරයි. මැයි 01 1889 දී වැඩකරන ජනතාවගේ දිනය ලෙසින් මූලිකව යොදාගනු ලැබූවද 1893 දෙවන ජාත්‍යන්තරයේ 03 වන සමුළුවේදී යෝජනාවක් සම්මත කරමින් තීරණය කරනු ලැබුවේ එම දිනය හුදු සැමරුම් දිනයක් ලෙස යොදා ගන්නවා වෙනුවට සමාජ පරිවර්තනයක් උදෙසා සටන් කරන, උද්ඝෝෂණය කරන සටන්කාමීන්ගේ දිනයක් බවට එය පත්කර ගත යුතු බවය. එම යෝජනාවට ඉහළම වටිනාකමක් ලබා දෙමින් එයින් වසර 07 කට පසු 1900 දී ලෙනින් විසින් මැයි දිනය වෙනුවෙන් සිය පක්ෂ සාමාජිකයන්ට යවන ලද ලිපියක මෙලෙස සඳහන් වෙයි.

''මෙවර අපි හැකි තරම් මැයි දින උත්සව සංවිධානය කළ යුතුය. කම්කරුවන්ගේ වැඩබිම් හැම එකකම සංවිධාන කටයුතු කළ යුතුය. මෙවැනි කටයුතු වලදී කම්කරුවන් සමහර විට පසුබසින්නටද පුළුවන එසේ වන්නේ පාලකයන්ගෙන් එල්ලවන විරෝධය නිසාත්, කම්කරුවන් තමන් හුදකලාවී උදව්කරුවන් නොමැති බව සිතීම

# අරගලය පොදු කළ යුතුයි

## සුමතිපාල මානවඩු- ප්‍රධාන ලේකම්, සමස්ත ලංකා දුම්රිය සේවකයින්ගේ පොදු සේවක සංගමය

වසර 122 කට පෙර චිකාගෝ නුවර හේමාකට් චතුරශ්‍රයේදී පැය 08 වැඩ දිනයක් ඉල්ලා සටන් කරපු නිරායුධ මිනිසුන්ව මරා දැමීමට එදා පාලකයන් කටයුතු කළා සේම අදත් අපේ ඉල්ලීම් හමුවේ පාලකයෝ අනුගමනය කරන්නේ මර්දනකාරී පිළිවෙතක් බව ඉතා පැහැදිලියි. මර්දනයට ඇති එකම පිළිතුර වන්නේ අරගලය පොදු කිරීමයි. අද ගත්තොත් වැඩකරන ජනතාව දැඩි පීඩාවකට ලක්වී තියෙනවා. දිනෙන් දින ඉහළ යන බඩු මිල හමුවේ ඔවුන්ගේ මාසික වැටුප දෛනික අවශ්‍යතාවයන් සම්පූර්ණ කරගත නොහැකි තත්වයකට පත්වී තිබෙනවා. ඒ නිසාම සේවා කාලය දීර්ග කර ගැනීමට හෝ අමතර කාර්යයක නියැලීමට හෝ අපේ රටේ වැඩකරන ජනතාවට සිදුවී තිබෙනවා. මෙහි ඇති ඛේදනීයම තත්වයක් වන්නේ වසර 55 කින් පසු විශ්‍රාම යන සේවකයා යළිත් ජීවත්වීම වෙනුවෙන් රැකියාවක නියුතු වීමයි. මේ තත්වය වෙනස් කළ යුතුමයි. එනිසා මේ රටේ සියලු වැඩකරන ජනතාවට අපි ආරාධනා කරනවා මේ පාලකයන්ගේ උවමනාව වෙනුවෙන් බෙදීමට ලක්කොට ඇති සීමා මායිම් බිඳදමා සැබෑ ජයග්‍රහණ වෙනුවෙන් ඒකරාශී වන ලෙස.

# ය අයිතීන් අබිබැවූ
# ාමීන්ගේ දිනය



නිසාත්ය. එවැනි වැඩබිම් තෝර්ගෙන ඒවාට විශේෂ මැදිහත්වීමක් කළ යුතු අතර දේශපාලන නිදහස දිනාගැනීමේ අරගලය සඳහා සියලු කම්කරුවන් ධෛර්යමත් කළ යුතුය. රුසියානු ජනතාව වෙනුවෙන් හා කම්කරු පංතියේ ජයග්‍රහණය වෙනුවෙන් සමාජවාදය දිනා ගැනීම සඳහා තම අධිෂ්ඨානය අත් නොහැර කටයුතු කිරීමට කම්කරු පංතිය පෙළඹවිය යුතුය.'' මෙයින් තහවුරු වන්නේ මැයි දිනය එහි සැබෑ අයිතිකරුවන් විසින් තමන්ගේ අයිතීන් දිනා ගැනීම සඳහා යොදා ගත යුතු බවයි. ලෝකය පුරාවට පීඩක පංතියද මැයි දිනය ඔවුන්ගේ වුවමනාවන් වෙනුවෙන් යොදා ගැනීමද මෙහිදී විශේෂ අවධානයට ගත යුතුව ඇත. තමන් විසින් මුදාහරින ලද පීඩනයට එරෙහිව පාරට බට පීඩිත ජනතාව මරා දමූ දිනය පාලකයින් විසින් සමරන්නේ ඇයිද යන්න ගැඹුරින් සිතාබැලීමේ වගකීමක් ලොවපුරා සියලු පීඩිත ජනතාවට තිබේ.

අපේ රටේ පළමු මැයි දිනයම වැඩකරන ජනතා අයිතියට අවමන් කළ මැයි දිනයක් බව ඉතිහාසය සාක්ෂි දරයි. 1933 ජූනි මාසයේ නිකුත් වූ ''ස්වදේශ මිත්‍රයා'' නම් පුවත්පතට අනුව එම වසරේ ඊ.ඒ. ගුණසිංහගේ නායකත්වයෙන් මැයි දිනය පවත්වා ඇති අතර එහි තේමාව වී ඇත්තේ ''ජාතිය රකිමු. රාජපාක්ෂික වෙමු. උත්සාහ වඩමු'' යන්නයි. එසේම එම මැයි දින සමරුව සඳහා කිසිදු කම්කරුවෙකුට අවස්ථාවක් ලබානොදීමද එහි විශේෂයෙන් සඳහන්ව ඇත. එයින් ගම්‍යවන්නේ වැඩකරන ජනතාව වෙනුවෙන් වෙන්වූ දිනය පාලකයන් තම වුවමනාවන් ඉටුකර ගැනීම සඳහා වන්දිභට්ටයන් යොදවා ගෙන සැමරීමට කටයුතු කර ඇති බවයි. එහෙත් 1934 දී ''පූර්ණ ජාතික නිදහසක් දිනා ගනිමු'' යන තේමාව යටතේ තරුණ මාක්ස්වාදියෝ විසින් පවත්වනු ලැබූ මැයි දිනය දේශපාලන අර්ථයක් එක්කළ අපේ රටේ පළමු මැයි දින සමරුව ලෙස ඉතිහාසයට එක්වී තිබේ. එවරද ගුණසිංහ වික්ටෝරියා උද්‍යානයේදී තම හාම්පුතුන්ගේ ආශිර්වාදය යටතේ මැයි දිනය පවත්වා තිබේ. එදා මෙදා තුර වසර 77 පුරාවට පාලකයන්ට එරෙහිවද, පාලකයන්ට ආශිර්වාද කරමින් ධාරාවන් දෙකක මැයි දින සැමරුම් පවත්වා ඇති අතර මැයි දිනයේ සැබෑ අරුත නම් ලෙනින් කීවා සේම දේශපාලන නිදහස දිනාගැනීමේ අරගලය සඳහා සියලු කම්කරුවන් ධෛර්යමත් කිරීමට මෙම දිනය යොදා ගත යුතුය. එය මිස අන් යමක් මැයි දිනයේදී ප්‍රකාශයට පත්විය යුතු නැත. ලාංකීය වැඩකරන ජනතාව එම ගැඹුරු අර්ථයෙන් මැයි දිනය හා ඒකාබද්ධ වන්නේ නම් එය අපේ රටේ සැබෑ ජයග්‍රහණයන්ගේ ආරම්භක පියවර වනු නොඅනුමානය.

## මේ ආණ්ඩුව ලුණුත් නැති කිරිත් නැති කිරිහොද්දක් වගේ

### රංජන් ජයලාල් - ප්‍රධාන ලේකම්, ලංකා විදුලි සේවක සංගමය

පසුගිය කාලයේදී අපි දැවැන්ත අරගලයක් සිද්ද කරලා පාලකයන්ගෙන් වැටුප් වැඩිවීමක් උදුරා ගත්තා. එහෙම කරන්න පුළුවන්කම ලැබුණේ අපේ සේවකයන් සියලු දෙනා එකාවන්ව එම අරගලය සමඟ එකතු වූ නිසයි. දැනුත් විදුලිබල මණ්ඩලය තුළ සටනක් දියත් වෙමින් තිබෙනවා. අපි විශ්වාස කරනවා එම සටනත් ජයග්‍රහණයෙන් කෙළවර කළ හැකියි කියා. ආණ්ඩුව උත්සාහ දරමින් සිටිනවා, විවිධ බොරු ප්‍රචාර පතුරවමින් සේවකයන්ගේ සාධාරණ ඉල්ලීම් යට ගසන්නට. නමුත් ඒ වංචාව සිදු කරන්නට අපි ඉඩතියන්නේ නැහැ. දැන් මේ ආණ්ඩුවේ ඇතුලේ ඉන්න බොහෝ දෙනෙක් ඉන්නේ කොයි වෙලාවෙද එළියට එන්නේ කියලා. ඒක ඔවුන් අපත් සමඟ විවෘතවම කියනවා. එනිසා ආණ්ඩුවේ පැවැත්ම දැන් අභියෝගයට ලක්වී හමාරයි. මේ ආණ්ඩුව හරියට ලැණුත් නැති, කිරිත් නැති කිරිහොද්දක් වගේ. නමට පමණක් ආණ්ඩුව වුණාට එහි කිසිම ගුණයක් හෝ රසයක් නැහැ.

## අනාගතය සුභ වෙනතෙක් නොඉඳ සුභ කරගමු

### රාමලිංගම් චන්ද්‍රසේකර් - සභාපති සමාජවාදී වතු කම්කරු සංගමය

අපේ රටේ ලක්ෂ 05 කට ආසන්න වතු කම්කරුවන් හැමදාමත් විවිධ පොරොන්දු හරහා සිරකර තබා ගන්නට පාලකයන්ට හැකිවී තිබෙනවා. පසුගිය වසරේදිත් වතු කම්කරුවන් ජීවත් වීම උදෙසා අරගල මාවතට පිවිසෙන විට අවස්ථාවදී නායකයන් ආණ්ඩුව සමඟ එකතු වෙලා එම සටන නතර කළේ ඔවුන් තුළ විවිධ බලාපොරොත්තු ඇති කරමින්. නමුත් මේ වන තෙක් ඒ කිසිදු බලාපොරොත්තුවක් ඉටුකර ගන්නට ඔවුන්ට හැකිවී නැහැ. පොරොන්දු වුණ පාලකයින් දැන් වතුවල පෙනෙන්නවත් නැහැ. ඔවුන් ඉන්දියාවේ සුපිරි හෝටල්වල, එහෙත් නැත්නම් යුරෝපයේ සමාජ ශාලාවල විවිධ අනතුරුවලට ලක්වී ඇති බව මාධ්‍ය මගින් හෙළිදරව් කරන නිසා ජීවත්ව සිටින බව පමණක් තහවුරු කරගත හැකියි. එයින් පැහැදිලි වන්නේ ඔවුන්ට අපේ රටේ වතු කම්කරු ජනතාවගේ ජීවිත නගා සිටුවීම පිළිබඳ කිසිදු වුවමනාවක් නොමති බවයි. මෙවර මැයි දිනය එළඹෙන්නේ ඉතිහාසයේ පළමු වතාවට සම්ප්‍රදායික වෘත්තීය සමිති නායකත්වයට වතු කම්කරු ජනතාව අභියෝග කරමිනුයි. ආණ්ඩුවේ වුවමනාව වෙනුවෙන් පසුගිය කාලයේ අපේ වතු කම්කරු ජනතාව යොදා ගන්නට අවස්ථාවාදී වෘත්තීය සමිති දරපු උත්සාහයන් සාර්ථක වුණේ නැහැ. ඒ නිසා අපි අපේ රටේ වතු කම්කරු ජනතාවගෙන් එක ඉල්ලීමක් කරන්න කැමතියි. ඒ තමයි අනාගතය සුභ වෙයි කියා සිහින දකිමින් සිටිනවා වෙනුවට එය සුභ කර ගැනීම සඳහා ධෛර්යවන්තව කටයුතු කළ යුතුයි යන්නයි. එවැනි ධෛර්ය සම්පන්න ක්‍රියාකාරීත්වයකට අපේ රටේ වතු කම්කරු ජනතාව ඒකරාශී වුවහොත් එයම මේ පාලකයන්ට බරපතළ තර්ජනයක් වනු නොඅනුමානයි.

## ජයග්‍රහණ උදෙසා සටන් කරමු!

### වසන්ත සමරසිංහ - සභාපති, අන්තර් සමාගම් සේවක සංගමය



ගෙවුණු වසරේ මැයි දිනය එළඹෙන කොට ආණ්ඩුව පෞද්ගලික අංශයේ සේවකයන්ගේ ඈප්ල ඈඹ් අරමුදල් කොල්ලකෑම අරමුණු කරගෙන විශ්‍රාම වැටුපට මුවා වෙමින් ගේන්න උත්සාහ කරපු ඊනියා විශ්‍රාම වැටුප් පනත අහෝසි කරන්නට අපේ රටේ පෞද්ගලික අංශයේ සේවකයින් සමත් වුණා. ඒ කියන්නේ ආණ්ඩුව කොහොම හරි කරනවා කියලා ගෙනාපු පනත සේවක බලය හමුවේ ආපසු ගන්නට ආණ්ඩුවට සිද්ධ වුණා. එහෙම වුණේ අපි මේ රටේ වැඩකරන ජනතාව සමඟ එක්ව අරගල මාවතක එළඹුණු නිසයි. ඒ වගේම අපේ රටේ ආර්ථිකයේ ප්‍රධානම මෙවලම හෙවත් එංජිම ලෙස හඳුන්වන පෞද්ගලික අංශයේ සේවකයින්ට ජීවත්වීම සඳහා 40% ක වැටුප් වැඩිවීමක් වෙනුවෙන් අපි අරගලයක් දියත් කරමින් තිබෙනවා. ඊට අමතරව ආණ්ඩුව බොරු කරලා මඟ හරින්න හදපු විශ්‍රාම වැටුප් හිමිකම පෞද්ගලික අංශයේ සේවකයන්ට ලබා ගැනීම වෙනුවෙන් අපි මේ වන විටත් විවිධ මැදිහත්වීම් කරමින් තිබෙනවා. විශේෂයෙන් ජාතික කම්කරු උපදේශක සභාව තුළ මෙම වුවමනාව තහවුරු කරන්න අපි සමත් වුණා. ඒ නිසා මේ වසර තුළ පෞද්ගලික අංශයේ සේවකයන්ට තමන්ගේ සේවා අයිතිය වෙනුවෙන් සටන් කිහිපයකටම එක විට මුහුණ දීමට සිදුවී තිබෙනවා. මේක එක පැත්තකින් හොඳ තත්වයක්. මොකද වැඩකරන ජනතාව තමන්ගේ අයිතිවාසිම් පිළිබඳ සවිඥාණික විය යුතුයි. එවිට තම අයිතීන් වෙනුවෙන් සටන් කරන්න ඔවුන් යොමු වෙනවා. ඒ මගින් අයිතීන් දිනා ගැනීමට නම් මේ පාලකයන්ට එරෙහිව සටන් කළ යුතුයි යන දේශපාලන පාඩමක් ඔවුන් ඉගෙන ගන්නවා. ඒ අධ්‍යාපනය වැඩකරන ජනතාවට අවශ්‍යයි. මොකද ඒ මගින් තමයි ඔවුන් අපේ රටේ සැබෑ පංති බලවේගයක් බවට පත්වන්නේ.

අද රට මුහුණදී තියන තත්වය ගත්තොත් ඉතාමත් භයානකයි. ආර්ථික වශයෙන් රට බංකොලොත්භාවයට පත්කොට අවසන්. මේක හරියට රෝද හතරම කොට උඩ තියපු වාහනයක් වගේ. පෙණුමට හොඳට තිබුණට දුවන්නේ නැහැ. ඒ නිසාම විදේශීය බලපෑම්වලට රට ක්‍රමයෙන් නතු කරමින් තිබෙනවා. මේ සියල්ල එකට ගෙන සලකා බලන විට ඉතාමත් පැහැදිලියි වැඩකරන ජනතාවගේ මැදිහත්වීමක් රටට අත්‍යාවශ්‍ය වී තිබෙන බව. එමගින් හැර වෙනත් මඟකින් රටට ජයග්‍රහණ ගෙනදිය නොහැකියි. ඒ නිසා ජයග්‍රහණ අපේක්ෂා කරන අපේ රටේ සියලු ජනතාව සටනට අවතීර්ණ විය යුතුව තිබෙනවා.

## ධීවර ජනතාව ජ.වි.පෙ. මැයි පෙළපාලියට

### රත්න ගමගේ - ජාතික සංවිධායක, සමස්ත ලංකා ධීවර සමිති සම්මේලනය

අපේ රටේ ධීවරයා සම්ප්‍රදායික ජීවන රටාවකට උරුමකම් කියන්නෙක් කිවහොත් වඩාත් නිවැරදියි. නමුත් ඔවුන් වඩාත් සංවේදී පිරිසක් වීමත් විශේෂයෙන් සඳහන් කළ යුතුයි. මේ වන විට ධීවර කර්මාන්තය අභියෝග රැසකට මුහුණ දෙමින් තිබෙනවා. නමුත් ඒ වෙනුවෙන් සාධාරණ මැදිහත්වීමක් ආණ්ඩුව පැත්තෙන් සිදු නොවන බව ඉතා පැහැදිලියි. මුහුදු ප්‍රදේශවල වගේම කුඩා ජලාශ ආශ්‍රිතවත් ධීවර කර්මාන්තය ව්‍යාප්ත වී තියෙනවා. නමුත් රාජපක්ෂ ආණ්ඩුව ධීවරයන්ගේ ගැටලුවලට පිළිතුරු ලබා දෙනවා වෙනුවට තෙල් මිල වැඩියි, බෝට්ටුවේ ගොස් මාලු ඇල්ලීම අවාසියි. එම නිසා තෙල් මිල ටිකක් අඩුකරන්න යැයි ඉල්ලා සිටි ධීවරයන්ට අමානුෂික ලෙස පහරදුන්නා පමණක් නොව එක් ධීවරයකු මරා දමන්නට රාජපක්ෂ පාලනය කටයුතු කර අවසන්. දැන් ධීවර ජනතාව නිශ්චිත තීන්දුවකට ඇවිත් තිබෙන බව පැහැදිලියි. එම නිසා මෑත ඉතිහාසයේ පළමු වතාවට අපේ සමස්ත ලංකා ධීවර සමිති සම්මෙලනය ජනතා විමුක්ති පෙරමුණේ මැයි දින පෙළපාලියට හා රතු මැයි රැලියට එක්වීමට තීරණය කර තිබෙනවා. ධීවර ජනතාවගේ අයිතීන් වෙනුවෙන් සටන් වදින ජවිපෙ රතු මැයි රැළියට එක්වන ලෙස අපි සියලු ධීවර ජනතාවගෙන් ඉල්ලා සිටිනවා.

# රාජ්‍යය යනු කුමක්ද?

ප්‍රසුගිය කලාප තුළින් රජය බිහිවීම දෙවියන් හෝ සමාජ සම්මුතීන් විසින් නොව පන්ති ප්‍රතිවිරෝධතාවයන්ගේ ප්‍රතිඵලයක් බව අපි සාකච්ඡා කළෙමු. නමුත් එසේ බිහිවූ රජය පිළිබඳවද ඉතිහාසයේ පටන්ම විවිධ මත පැවතුණි. එනම් රාජ්‍ය සදාකාලික බවද, එය පන්ති අතර අසමගිය දුරු කිරීමට පැමිණි එකක් බවද නැතහොත් රජය යනු පන්ති පීඩක උපකරණයක් බවද යනුවෙනි.

නමුත් රාජ්‍ය සදාකාලිකය යන මතය මාක්ස්වාදයේ නිර්මාතෘවරු විසින් රජය බිහිවීම හා එහි යාන්ත්‍රණය පිළිබඳව සිදු කරන ලද විද්‍යාත්මක හැදෑරීම මගින් නිවැරදි නොවන බව තහවුරු කරන ලදී. රාජ්‍යයක් නොමැති කල මිනිස් සමාජයේ හැසිරීම් පිළිබඳව ලෙනින් තම අදහස් ඉදිරිපත් කළේ මෙසේය. (1919 ජූලි 11 දින ස්වර්ද්ලොව් විශ්ව විද්‍යාලයේ ඉදිරිපත් කළ දේශනයකි)

''එකල පොදු බැඳීම් හා මුළු ප්‍රජාවත්, විනය හා වැඩකටයුතුවල ක්‍රමවත් කමත්, පවත්වා ගන්නා ලද්දේ සිරිතෙහි හා සම්ප්‍රදායෙහි බලයද, වංශයේ වැඩිහිටියන්, නැතහොත්, ස්ත්‍රීන් (එකල ස්ත්‍රීන් පුරුෂයන් සමග සමාන තත්වයන් ගත් අවස්ථා බොහෝ වූවා පමණක් නොව, ස්ත්‍රීන් පුරුෂයින්ට වඩා උසස් තත්වයන් ගත් අවස්ථාද දුලබ නොවීය). සතුව තිබූ අධිකාරිය, නැතහොත්, ගරුත්වයද මගිනි''

එසේම එහිදී රාජ්‍යයේ බිහිවීමේ පදනමද ඔහු මෙසේ පැහැදිලි කරයි. ''**සමාජය පන්තිවලට බෙදීමක්, එනම්, එක්කොටසක් අන්‍යයන්ගේ ශ්‍රමය අත්පත් කර ගැනීමේ ස්ථිර හැකියාවක් ලබන පරිදි, සමහරු අන්‍යයන් සූරාකෑමෙහි යෙදෙන පරිදි, ජනතාව කණ්ඩායම්වලට බෙදීමක් දක්නා ලද සෑම විටකම සහ සෑම තැනකම, ජනතාවට බල කිරීම සඳහා වූ විශේෂ යන්ත්‍රයක් ලෙසින් රාජ්‍ය උද්ගත විය.**''

රජය බිහිවූයේ පන්ති ප්‍රතිවිරෝධයන්ගේ ප්‍රතිඵලයක් නිසා බව තාර්කිකව පැරදවිය නොහැකි වූ ධනපති බුද්ධිමතුන් හා දේශපාලඥයන් රජය පන්තිවල අසමගියේ ප්‍රතිඵලයක් වුවත් එය බිහිවූයේ එම අසමගිය සමනය කිරීමට බව පවසති. එහෙත් මාක්ස්වාදීන් පවසන්නේ රජය බිහිවීමේ අරමුණ එය නම් රජය බිහි වූ විට පන්ති අතර ගැටුම අහෝසි වී යා යුතු බවයි. එහෙත් සිදුවූයේ එමගින් පන්ති අතර ගැටුම වඩාත් තීව්‍ර වීම බවද අවසානයේ රජය එක් පන්තියක් මර්දනය කිරීමට තවත් පන්තියක් භාවිතයට ගන්නා උපකරණයක් වූ බවද ඔවුන් පෙන්වා දේ. රජයේ මෙම හැසිරීම ඉතිහාසයේ පැවති සමාජ ක්‍රම අධ්‍යයනය කිරීමෙන් අපට තේරුම් ගත හැක.

ඉතිහාසයේ වසර දහස් ගණනක් මිනිසුන් විවිධ සමාජ ක්‍රම තුළ ජීවත් විය. මිනිසාගේ ආරම්භක සමාජය හෙවත් ප්‍රාථමික සාමූහික සමාජය තුළ පන්ති නොතිබුණ බැවින් එහි රාජ්‍යයක් නොවීය. නමුත් එම සමාජය තුළ පැවති ප්‍රාථමික මට්ටමේ නිෂ්පාදන උපකරණවල සංවර්ධනය හේතුවෙන් එදිනෙදා ජීවිතයේ පරිභෝජනයට වඩා යම් අතිරික්තයක් නිෂ්පාදනය කිරීමේ හැකියාවක් ඇති විය. මෙම අතිරික්ත නිෂ්පාදනයත් සමගම සමාජය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වෙන් විය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ සමාජයේ ප්‍රථම වැදගත් පන්ති බෙදීම වූ වහල් හිමියන් සහ වහලුන් වශයෙන් පන්ති බෙදීමයි. මෙය වහල් හිමි සමාජ ක්‍රමය ලෙස හැඳින් වූ අතර එකල පැවති සියළුම නිෂ්පාදන මාර්ග ඉඩම් හා ප්‍රාථමික මට්ටමේ පැවති නිෂ්පාදන උපකරණ පමණක් නොව ජනයාද වහල් හිමියන්ට අයත් විය. ඔවුන් සඳහා ශ්‍රමය සැපයූවන් වහළුන් ලෙස හැඳින්විණි. ඒ අනුව එකල සමාජයේ පැවතියේ වහල් හිමියන්ගේ ආඥාදායකත්වයයි. ඉන් පසු නිෂ්පාදන උපකරණවල සංවර්ධනයත් සමග සමාජය වෙනත් ආකෘතියකට පරිවර්තනය වූ අතර එය වැඩවසම් සමාජ ක්‍රමය නම් විය. මෙහි මූලික පන්ති බෙදීම වූයේ වැඩවසම් අධිපතියන් හා ගොවි ප්‍රවේණි දාසයන් යනුවෙනි. වහල් හිමි සමාජයේ මෙන් වැඩවසම් අධිපතීන්ට සමාජයේ සෑම දෙයක්ම අයිතිව පැවතුනත් ගොවි ප්‍රවේණි දාසයන් ඔවුන්ට අයත් භාණ්ඩයක් සේ නොසලකන ලදී. ප්‍රවේණිදාසයා ලක්වූ පීඩනය වහල් හිමියා යටතේ වහලා ලක්වූ පීඩනයට වඩා වැඩි වෙනසක් නොවීය. මෙකල සමාජයේ ආදිපත්‍යය දැරුවේ ඉඩම්හිමි වැඩවසම් අධිපතීන්ගේ පංතියයි.

ඉන් පසු සිදුවූ වෙළඳ භාණ්ඩ හුවමාරුව සහ මුදලේ බලය වර්ධනය වීම නිසා මතු වූ ප්‍රාග්ධනයේ බලය හේතුවෙන් මෙම සමාජය වෙනස් ආකෘතියක් ඉල්ලා සිටි අතර ලෝකය පුරා සිදුවූ විප්ලව හේතුවෙන් වැඩවසම් ක්‍රමය වෙනුවට ධනපති ක්‍රමය ස්ථාපිත විය. මෙහි මූලික පන්ති බෙදීම වූයේ ධනපති හා නිර්ධන යනුවෙනි. ප්‍රධාන වශයෙන් ධනපති පන්තිය වශයෙන් හඳුන්වනු ලැබූයේ සියළු නිෂ්පාදන මාර්ග හිමි ප්‍රාග්ධනය හරහා වැටුප් ශ්‍රමය සූරාකන කොටස වන අතර නිර්ධන පන්තිය හැඳින්වූයේ තමන් සතුව නිෂ්පාදන මාර්ග කිසිවක් නොමැති වූ නිසා වැටුපට තමන්ගේ ශ්‍රමය විකිණීමට පත් වූ කොටසක් ලෙසය.

ඉතිහාසය පැවති මෙම සමාජක්‍රම අධ්‍යයනයේදී පෙනී යන කරුණක් වන්නේ මේ සෑම සමාජයකම ආධිපත්‍යය දැරුවේ එක්තරා කණ්ඩායමක් බවයි. එය සමාජයේ අතලොස්සක් වූ අතර සියළු දේපල හිමිකාරීත්වය තිබුණේ එම කණ්ඩායමටය.

එමෙන්ම මේ සෑම සමාජයකදීම රජය කටයුතු කලේ ද, එම දේපල හිමි කණ්ඩායමේ උවමනා එපාකම් අනුවය. එනම් දේපල හිමි පංතිය විසින් දේපල අහිමි පංතිය පාගා සිටීමේ උපකරණයක් ලෙසය. සමාජය ගත් විට රජය අයත් වන්නේ උත්තර නිර්මිතයටය. උත්තර නිර්මිතය සමාජ ආර්ථික පසු බිම මගින් නිර්මාණය කරන්නක් හෙයින් එය තමන් නිර්මාණය කළ ආර්ථික පදනම ආරක්ෂා කිරීමට බැඳී සිටියි. ඒ නිසා රජයද අනිවාර්යයෙන්ම බැඳී සිටිනුයේ එම ආර්ථික පදනම ආරක්ෂා කරමින් එයට එරෙහිවන්නන් මර්ධනය කිරීමටය.

ඒ අනුව ඉතිහාසයේ වසර දහස් ගණනක් '' රජය '' දේපළ හිමි පංතියේ අවශ්‍යතා ඉටුකරමින් අනෙක් පංතිය මර්ධනය කිරීම සඳහා කටයුතු කලේ කෙසේද ? එංගල්ස් කියන පරිදි රජය යනු සමාජය තුළින්ම පැන නැගි බලයක් වන අතර සමාජයට ඉහළින් සිටගත් එය එන්න එන්නම සමාජයෙන් ඈත්වෙමින් පවතින දෙයකි. තවද එම බලය සෑදී ඇත්තේ නොයෙක් මාදිලියේ බලහත්කාරකම් කරන සංවිධාන හා හිරගෙවල් වැනි අමතර මෙවලම් වලින් බවද, එය පවත්වාගෙන යෑම සඳහා අයබදු සහ රජයේ ණය මුදල්ද අවශ්‍ය බව ඔහු පවසයි. ඒ අනුව රාජ්‍ය නමැති මර්ධන යන්ත්‍රය යටතේ ක්‍රියාත්මක වන ආයතන ලෙස නිල හා නිල නොවන සන්නද්ධ කණ්ඩායම් පොලීසිය, හිර ගෙවල්, අධිකරණය, විධායකය, පාර්ලිමේන්තුව සහ ජනමාධ්‍ය ආදිය සැලකිය හැක.

නිදසුනක් වශයෙන් වහල් හිමි සමාජයේ ඇති වූ වහල් කැරලිද වැඩවසම් යුගයේ ඇති වූ ගොවි ප්‍රවේණි දාසයන්ගේ කැරලිද මර්ධනය කරනු ලැබුවේ මෙම ආයතන හරහායි. එමෙන්ම වත්මන් ධනපති ක්‍රමය තුලද එයට එරෙහිව නැගී එන බලවේගද මර්ධනය කිරීම සඳහා මෙම ආයතන භාවිතා කරන බවට උදාහරණ ඕනෑතරම් තිබේ.

**ගිලී නොපෙනී යන රජය**


සමාජ සංවර්ධනයේ එක්තරා සන්ධිස්ථානයකදී පෞද්ගලික දේපල හා පන්ති බිහි වූ නිසා රජය බිහි වූ බව අප අධ්‍යයනය කළෙමු. දැන් මීලඟ සාකච්ඡාව වන්නේ රජය අහෝසි වී යන්නේද? එසේ වන්නේනම් ඒ කවදාද යන්නයි. මීට පෙරද ඉතිහාසයේ එක් අවදියක රාජ්‍ය නොමැති සමාජයක් තිබූ බව අපි දනිමු. එසේ වූයේ එම සමාජයේ පෞද්ගලික දේපල සහ පන්ති නොතිබූ බැවිනි. ඒ නිසා කවදා හෝ පෞද්ගලික දේපල සහ පන්ති අහෝසි වී යන සමාජයකදී රජයද අහෝසි වී යනු ඇත. එනම් වහල් හිමි, වැඩවසම් සමාජ ක්‍රමය පසු කරමින් අප අද සිටිනුයේ ධනපති සමාජ ක්‍රමයේ අග භාගය තුළය.

මෙය එංගල්ස්ගේ වචනවලින් පවසන්නේ නම් මෙසේය. ''රජය අනාදිමත් කාලයක සිට පැවතෙන්නක් නොවේ. රජය ගැන හෝ රාජ්‍ය බලය ගැන හෝ නොදත් රජය රහිත සමාජයක් තිබුණේය. සමාජය පන්තිවලට බෙදී යාමේ අවශ්‍යතාවය අනිවාර්යයෙන්ම පැන නැගුණු ආර්ථික සංවර්ධනයක් ඇති වූ අවධියකදී ඒ බෙදීම හේතුභූතව රජය පැන නැගුණු. දැන් අප ඉතා ඉක්මණින් නිෂ්පාදනයේ කොතරම් සංවර්ධනාත්මක තත්වයකට පැමිණ සිටින්නේද එම පන්තිවල පැවැත්ම අවශ්‍යතාවයක් නොවී තිබෙනවා පමණක් නොව, එය නිෂ්පාදනයට කෙළින්ම බාධා කරන තත්වයකට පත්ව තිබේ. අතීතයේදී පැන නැගි ආකාරයට එය පන්ති අහෝසිවී යාමත් සමගම වැළැක්විය නොහැකි සේ රජයද අහෝසි වී යනු ඇති. නිදහස හා සම අයිතිය ඇති නිෂ්පාදන සබඳතාවයක් මත නිපදවීම සංවිධානය කරන සමාජය මුළුමහත් රාජ්‍ය යන්ත්‍රයම ඊට සුදුසු තැන දමනු ඇත. ත එය තඹ පොරොව හා කපු කටින යන්ත්‍රය වැනි පැරණි වස්තූන් සමග ඒ අසලින් කෞතුකාගාරයේ තැන්පත් කරනු ඇත.''

එසේ එංගල්ස්ගේ මෙම උදෘත උපුටාගත් අරාජිකවාදීන් රජය අභාවයට යෑමේ මාක්ස්වාදී අදහස විකෘති කොට තිබුණි. ඔවුන්ට අනුව රජය අභාවයට යන්නේ නම් එය විනාශ කිරීමට අවශ්‍ය නොමැති බවත් ඒ නිසා නිර්ධන පන්තියටද ආඥාදායකත්වයක් අවශ්‍ය නොවන බවත් කියා සිටියේය. මෙය පැහැදිලි කළ ලෙනින් පවසා සිටියේ එංගල්ස් කියා සිටින්නේ අභාවයට යන්නේ ධනපති රජය නොව සමාජවාදී රජය බවයි. සූරාකෑම පවත්වාගෙන යාමට ධනපති රජය නිතර උත්සාහ කරන බැවින් එය පරාජය කිරීම සඳහා නිර්ධන පන්තියටද එවැනිම බලයක් අවශ්‍ය වේ. නිර්ධන පන්තිය එවැනි බලයක් ලබා ගන්නේ සමාජවාදී විප්ලවය තුළිනි. එවිට සිදුවනුයේ ධනපති පන්තියේ ආඥාදායකත්වය වෙනුවට නිර්ධන පන්ති ආඥාදායකත්වයක් බිහිවීමයි. පසුව නිර්ධන පන්තිය තම බලය පාවිච්චි කරමින් ධනපති සූරාකෑම අහෝසි කිරීමට කටයුතු කරයි. මෙය කිසිසේත් සාමකාමීව සිදු කළ නොහැකි බැවින් එවැනි බලහත්කාරකමක් අත්‍යවශ්‍යය.

අවසානයේදී නිර්ධන පන්තිය, ධනපති පන්තියේ සූරාකෑම මෙන්ම එම පංතියද අහෝසි කොට නිර්ධන පන්තිය ලෙස තම පැවැත්මද අහෝසි කරගනී. අවසානයේ රාජ්‍යයට අත්වන්නේද මුහුදේ ගිලී ගිය නැවකට අත් වූ ඉරණමය. මෙම පන්ති විරහිත සමාජය කොමියුනිස්ට් සමාජය ලෙස හඳුන්වන අතර ධනපති ක්‍රමයේ සිට කොමියුනිස්ට් ක්‍රමය දක්වා සංක්‍රමණ කාල පරිච්ඡේදය සමාජවාදය වශයෙන් හඳුන්වන බැවින් සමාජවාදී රාජ්‍යද සංක්‍රමණික රාජ්‍යයක් සේ හැඳින්වේ.

''**අපි මෙම යන්ත්‍රය නැතහොත් මුගුර සියලු සූරාකෑම් විනාශ කිරීම සඳහා යොදා ගත්තෙමු. සූරාකෑමේ හැකියාව මුළු ලොවෙහිම කිසිම තැනක තවත් නොපවතින කල ඉඩම් හිමියන් සහ ෆැක්ට්රි හිමියන් තවත් නොමැති කල අප මෙම යන්ත්‍රය කසල ගොඩට දමන්නෙමු. එවිට රාජ්‍ය හා සූරාකෑම තවත් නොපවතිනු ඇත.'' - ලෙනින් - එකතු කළ කෘති - 10 වෙළුම - 28 පිටුව**



# ආණ්ඩුවේ වියදම කැපීම හා ජන ජීවිත කප්පාදුව

වර්තමාන රාජපක්ෂ + IMF හවුල් පාලනය විසින් රට පාලනය කිරීමේ ක්‍රමවේදය ලෙස තෝරාගෙන ඇත්තේ, ජනතාවගේ අත්‍යවශ්‍ය වියදම් පවා කප්පාදු කිරීමෙන් ආර්ථිකයේ වියදම පාලනය කරගෙන පාලනය කිරීමයි. එයට ප්‍රධාන හේතුව, ආර්ථිකය දිගුකාලීන දර්ශනයක් මඟින් කළමනාකරණය කිරීමක් වෙනුවට සංදර්ශන ආර්ථිකයක් නඩත්තු කිරීමේ ඵල විපාකය. ආර්ථිකයේ ප්‍රධාන ආදායම් මාර්ග වී ඇත්තේ ජනතාව මත හෙළන දඩ, බදු හා අසීමිත ලෙස ණය ගැනීමයි. එසේම, ආණ්ඩුවේ ප්‍රධාන වියදමද වී ඇත්තේ, නිෂ්පාදන ක්‍රියාවලිය පණ ගසන මාර්ග යන් තුළ ආයෝජනය කිරීම වෙනුවට ආණ්ඩුවේ පුද්ගල ප්‍රතිරූප පුම්බන 'දැයට කිරුළ' වැනි සෝබන සංදර්ශනයන්ය. සංදර්ශන අවසන් වීමත් සමඟ අඩු තරමේ ඒ ප්‍රදේශවල ජනතාවට ඉතිරි වන්නේ කසළ ගොඩක් පමණි.

විදුලි බල ඇමතිගේ උත්සහය විදුලි පහන් දැල්වීම නවතා දමා විදුලිය ඉතිරි කිරීමය. ඒ, විදුලි බල මණ්ඩලයේ පාඩු පියවා ගැනීමටය. බන්දුල ගුණවර්ධනගේ යෝජනාව නොමැරී ඉන්න පමණක් ජනතාව ආහාර ගැනීම ප්‍රමාණවත් බවටය. පූර්ණ මිනිස් ජීවිතයකට අවශ්‍ය ඇඳුම් පැළඳුම්, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍යය, විනෝදාස්වාදය ඒ අනුව අදාල නොමැති සේය. ජීවත් වීමේ අර්බුදයේ වැටී සිටින ජනතාවට ආණ්ඩුව දෙන විසඳුම එයාකාරය. ඒ අනුව රාජපක්ෂ + IMF පාලනයට අනුව ජනතාව ජීවත් වීම කප්පාදු කර ගැනීමෙන් ජීවත් විය යුතුය. ඊට අමතරව ඉහළ යන විදුලි ගාස්තු, බස්ගාස්තු මෙන්ම ආණ්ඩුව වරින් වර පනවන දඩ ගාස්තු (වාහන සීට් පටි බද්ද, නලා බද්ද වැනි)ආදියෙන් ආණ්ඩුවේ වියදම නඩත්තු කිරීමට ජනතාවම ගෙවිය යුතුය. ජනතාව තමන් ජීවත් වීමටත් අණ්ඩුව ජීවත් කරවීමටත් ගෙවිය යුතුය. ආණ්ඩුව ජනතාව ජීවත් කරවීමේ අර්බුදයට පිළිතුරු සොයන ක්‍රියාමාර්ගයක්වත් අනුගමනය කරනු දැකිය නොහැකිය.



ලෝකය සිය එකදු වැසියකු හෝ නිරාහාරව තබන්නම් අපි ඒ ලෝකය විනාශ කරමු.

**ඉන්දිය මහා කිවි භාරතියාර්**

### නූතන අර්බුදයේ මුල්

ලාංකේය ධනවාදය පවත්වාගෙන ආ පැලැන්තිය විසින් ඉතිහාසය පුරාම එක් එක් යුගවලදී තමන් මුහුණ දුන් අර්බුදයන් හමුවේ විවිධ විසඳුම් සොයා ගත්තද ඒ හැම විසඳුමක්ම කෙරවළ වී ඇත්තේ, යළි අර්බුදයක් නිර්මාණය කරමින්ය. උත්තරාරෝපිත ධනවාදය ස්ථාපිත කිරීමෙන් අනතුරුව ආර්ථිකය නව යටත්විජිත ආකෘතින්ගෙන් අධිරාජ්‍යවාදීන් අතින් සූරා කෑමට ලක් වීමට අමතරව දේශීය ධනපති පංතිය විසින්ද සූරා කනු ලැබීය. එහි ප්‍රතිඵලය ලෙසට ආර්ථිකයේ නිෂ්පාදන ප්‍රතිලාභය එම ප්‍රතිලාභ ජනිත කළ වැඩ කරන හෝ ගොවි ජනතාවට උරුම නොවීය. යළි යළි සූරා කෑමට අවශ්‍ය තරමට හෝ ආර්ථිකය පවත්වාගෙ නයාමේ අර්බුද නිර්මාණය වීමේ ප්‍රතිඵලය වූයේ, 60 දශකයේ අග භාගයේදී රාජ්‍ය ඒකාධිකාරයේ අර්ථික මොඩලය ලෙස ක්‍රියාත්මක කිරීමයි. 1965-70 යුගයේ පැවති විවෘත ආර්ථික මොඩලය රාජ්‍ය මැදිහත් වීම වැඩි නිලධාරී තන්ත්‍රයේ ග්‍රහණයට ලක් වනුයේ එලෙසය.

රාජ්‍ය අනුග්‍රහය ලත් ආයතන පද්ධතියක් 70' දශකයේදී බිහිවුවද, එම රාජ්‍ය යාන්ත්‍රණය වැහැරුණු හා සූරාකෑම රජයන යාන්ත්‍රණයක් වීමත් විශේෂයෙන්ම දේශපාලන අනුග්‍රහය ලත් නිලධාරී තන්ත්‍රයක් ආර්ථිකය මෙහෙයවීමත් නිසා යළිත් නිෂ්පාදනය ක්‍රියාකාරී මට්ටමකින් ආර්ථිකයේ ප්‍රතිලාභ උපයන අංශය බවට පත් නොවීය. රාජ්‍ය ඒකාධිකාරී ධනවාදය අර්බුදයට යාමත් සමග යළි පැරණි විසඳුමට ආපසු යාම හැර අධිරාජ්‍යවාදී ලාංකේය

අද අප සමාජය අත්විඳින්නේ, ඉතිහාසයේ පැළ කළ අර්බුදයේ ප්‍රතිඵලයන්ය. අර්බුදය වී ඇත්තේ, නිෂ්පාදන ක්‍රියාවලිය අක්‍රිය කරන, පවතින නිෂ්පාදනයේ ප්‍රතිලාභ සොච්චමද උරා නාස්තිකාර ආර්ථික උපක්‍රමයක්ය.

වර්තමානයේ මතුපිටින් 8.3% ක ආර්ථික වර්ධනයක් මහා බැංකුවට පෙන්විය හැකි වුවද, මහ පොළොවේ ඉතිරි කර ඇත්තේ, ඊට හාත්පසින්ම වෙනස් ප්‍රතිඵලයක්ය. ආණ්ඩුවේම සංඛ්‍යා දත්ත

ඔහු වගා කර ඇත්තේ වී ද, එළවළු ද යන්න ප්‍රශ්නයක් නැත. වගා කළ වියදමවත් සොයා ගැනීමට නොහැකි ගොවි ණය බර අඩු කර ගැනීමට තම වගාවේ ඵල නෙලා ගැනීමෙන් තොරව පස්යට වළ දැමිය යුතුය. උඩරට හා පහත රට මෙසේ එළවළු ගොවීන් අද වන විට වගා අස්වනු නෙළීම නතර කර ඇත. ඒ වගාවේ නෙළීමේ වියදමවත් වෙළඳපොළේදී ලබා ගත නොහැකි නිසාය. දඹුල්ලේ එළවළු ගොවීන් තම අස්වැන්න ට්‍රැක්ටර් පිටින් විනාශ

කරන ලෙසටය. රු 2500/- කින් නොමැරී ඉන්න කැම කන ලෙසය. ගොවි ජනතාව තම අස්වනු අලෙවි කරගත නොහැකි නිසා එළදාව ගිනි තබන ලෙසය; නැතිනම් පස්යට වළලන ලෙසය. එවිට ආර්ථික ක්‍රියාවලිය කුමක් වනු ඇතිද? ජනතාව වියදම පාලනය කරන විට ධනපති යාන්ත්‍රණයට සිදුවන්නේ කුමක්ද?

ධනපති ක්‍රමය තම අර්බුදය නිසාම යෝජනා කරන්නේ, ධනපති ආර්ථිකය හකුළන ලෙසය. එවිට මිලදී ගැනීමේ

ධනපති පාලකයින්ට විකල්ප විසඳුම් නොවීය. ඒ නිසා යළිත් කලින්ටත් වඩා වැඩියෙන් ආර්ථික මොඩලයක් ලෙසම විවෘත ආර්ථික මොඩලය වැළඳ ගැනීමට එවකට බලය හුවමාරු කරගත් එක්සත් ජාතික පක්ෂ පාලනයට සිදුවිය.

1977දී හඳුන්වා දුන් විවෘත ආර්ථික මොඩලය පැවති රාජ්‍ය ඒකාධිකාරී ධනවාදයට සාපේක්ෂව වඩා ඉහළ වර්ධනයක් ඉලක්කම්වලින් අත්පත් කර ගත්තද ජනතාව අතර ඇති නැති පරතරය, මන්දපෝෂණය, දුප්පත්කම , විරැකියාව, ණය බර, වැඩි කිරීම මැෂිමක් බවට පත්විය. හඳුන්වා දෙන මොහොතේදී සුරබිදෙනක් සේ රටට - ජනතාවට පෙන්වනු ලැබූ නව ලිබරල්



විවෘත ආර්ථිකය ආශ්චර්යක් සේ මවා පෙන්වා

විවෘත ආර්ථිකයයම අද මර උගුලක් සේ පෙනෙන්නේ රටට - ජනතාවට පමණක් නොවේ. හඳුන්වා දුන් ධනපති එජාප නායකයින්ම අද තමන් හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිපත්තිවල විවේචකයින් බවට පත්ව ඇති සේය.

ඒ, නාස්තිකාර ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දෙන මොහොතේම ලෝක ආර්ථිකයේ ආක්‍රමණයට අපගේ දුබල ආර්ථිකය ගොදුරු විය. ඒ, රුපියල 100/- කින් අවප්‍රමාණය කරමින් හා විනිමය පාලන රෙගුලාසි ලිහිල් කරමින්ය. ඒ අනුව රටින් බැහැරට මුදල් ගෙනයාමටත් රට තුළට පාලනයකින් තොරව මුදල් ගෙන ඒමේ ඉඩකඩ විවෘත විය. හඳුන්වා දිය යුතුව තිබූ ආර්ථිකයේ නිෂ්පාදන ඉලක්ක සැපිරීම පසෙකලා හඳුන්වාදෙනු ලැබුවේ ආර්ථිකයේ සේවා ක්ෂේත්‍ර පුළුල් කිරීමය. ඒ නිසා, රක්ෂණ, බැංකු, කොටස් වෙළඳපොළ, මූල්‍ය සමාගම්වල ආර්ථිකයක් බවට ලංකේය ආර්ථිකය පත් කරන ලද්දේය.

අනුව ජනගහනයේ දුප්පත්ම 20% කට උරුම වී ඇත්තේ, ජාතික ආදායමෙන් 4% කටත් අඩු ප්‍රමාණයක්ය. එසේම, ජනගහනයේ පොහොසත්කම 20% ක් දෙනාට ආර්ථිකයේ ප්‍රතිලාභයන්ගේ 53% ක හිමිකාරීත්වයක් ලැබී ඇත. ඒ තරම් ඉහළ අසමානතාවයක් නිර්මාණය කරන ලද ආර්ථික ප්‍රතිඵලයයක් මත තව තවත් බර පැටවී ඇත්තේ, දුප්පත්ම 60% ක පමණ ජනතාවකට වීමෙන් ආණ්ඩුවේ සංඛ්‍යා ලේඛන කුමන තරමේ විහිළුකාරීදැයි තේරුම් ගත හැකිය.

රටට හඳුන්වා දෙන මොහොතේ පැවති කර්මාන්ත, නිෂ්පාදන ක්ෂේත්‍ර හා වතු වැවිලි අංශය යම් තරමකට ශක්තිමත් එකක් විය. ඒ නිසාම මූල්‍ය වෙළඳපොළ හරහා ආයෝජන සූදු කෙළීමට නිෂ්පාදනයක් ජනිත කළ හැකි විය. ආර්ථික විද්‍යාත්මකව දක්වන්නේ නම් පැවති ප්‍රාග්ධන කොටස යොදවා ශ්‍රමය සූරාකෑම මඟින් අතිරික්ත වටිනාකමක් ජනිත කළ හැකි විය.

නමුත්, වර්තමානයේ තත්වය සපුරා වෙනස්ය. අදත් නව ලිබරල් විවෘත ආර්ථික මොඩලයම ක්‍රියාත්මක වුවත් එය තව දුරටත් සූරාකෑමේ ක්‍රියාවලිය හරහා යළි යළිත් ප්‍රාග්ධනය බිහිකළ නොහැකි තත්වයකට පත්ව ඇත. හඳුන්වා දෙන මොහොතේදී ජවාධික අශ්වයෙකු සේ පෙනී ගියත් අද විවෘත ආර්ථිකය කොර ගසන කොටළුවකුගේ තත්වයට ඇද වැටී හමාරය.

අද වැඩ කරන ගොවියාට වගාවෙන් ප්‍රතිලාභ අහිමිය.

කරන ප්‍රවෘත්ති, දැන් එය විවෘත ආර්ථිකයේ පාඩුම වෙළදාම බවට පත්ව ඇති බව පෙන්වා දෙයි. එළවළු ගොවියාට රු 4/ ට වත් එළවළු කිලෝවක් අලෙවි කර ගත නොහැකි ආර්ථිකයක වියදම කප්පාදු කරමින් ජීවත් වන්න යැයි යෝජනා කිරීම කෙතරම් හාස්‍යජනක වනු ඇද්ද? වියදම කප්පාදු කර ගැනීමටවත් අද ගොවියාට, ධීවරයාට ආදායමක් සහතික කිරීමට දුබල ධනපති පංතිය සමත් වී නැත.

### චක්‍රීය අර්බුධද චක්‍රය

ඕනෑම ආර්ථිකයක් ධනවාදී නම්ඡ් ආර්ථිකයේ පදනම ශ්‍රම සූරාකෑම මඟින් ලාභ ඉපැයීම බව විවාදයක් ඇත්තේ නැත. යළි යළි ප්‍රාග්ධනය ජනිත කරන අතිරික්ත වටිනාකම ඉපැයීම එම ආර්ථිකය කවර මොඩලයක් සංයුක්ත වුවත් හරය වනු ඇත.

ධනපතියා ලාභ ලබන්නේ, භාණ්ඩ නිෂ්පාදනයෙන් නොව නිෂ්පාදනය කරන භාණ්ඩ තුළ ඇති සූරා කෑමට ලක් කළ ශ්‍රමයෙන්ය. ශ්‍රමය සූරාකෑමට නම් භාණ්ඩ නිපදවිය යුතුය. භණ්ඩ නිපදවිය හැක්කේ එම භාණ්ඩ විකිණෙන්නේ නම් පමණි. භාණ්ඩ විකිණීමට නම් ජනතාවට මිලදී ගැනීමේ හැකියාව තිබිය යුතුය. රැකියා විරහිත වූවන්ට හෝ ආදායම නොලබන්නවුන්ට මිලදී ගැනීමේ හැකියාව අහිමිය. මිලදී ගැනීමේ හැකියාව අහිමි ජනතාව වෙළඳපොළට කැඳවන්නේ නැත. ඒ අනුව භාණ්ඩ අලෙවි වන්නේ නැත. එවිට ධනපතින්ගේ කර්මාන්ත, ව්‍යාපාර අර්බුදයට යන්නේය. අර්බුද චක්‍රයේ එක් පැත්තක් එලෙසය.

දැන් ලාංකේය සංදර්භය දෙසට හැරෙමු. රාජපක්ෂ - මූල්‍ය අරමුදල් හවුල් පාලනය ජනතාවට යෝජනා කරනන්නේ නොකා, නොබී, වියදම පාලනය

හැකියාව අහිමි ජනතාව නොකා නොබී ධනපති ආණ්ඩුවලට හා සමාජ ක්‍රමයට වෛර කරනවා විතරක් නොවේය. ධනපතියන්ගේ සූරාකෑමේ ක්‍රියාවලියද ඒ තරමට අර්බුදයට පත්වන්නේය. ධනපතියාට තම සූරාකෑම අඛණ්ඩව පවත්වාගත හැක්කේ, යළි යළිත් වෙළඳපොළ සූරාකෑමට ලක් කල හැක්කේ දුප්පත් වැඩකරන ජනයා හා ගොවි - ධීවර ජනයා තමන් සතු මුදල් ආර්ථිකය තුළ කවර හෝ වුවමනාවක් උදෙසා වියදම් කරන්නේ නම් පමණය. වියදම කප්පාදුවෙන්, කප්පාදු වන්නේ ඒ වියදම සීමා වන ජනතාවගේ දෛනික ජීවිතය පමණක් නොවේය; ධනපති ක්‍රමයේ පැවැත්මද සීමා වන්නේය; සූරාකෑමේ ක්‍රියාවලිය පවත්වා ගැනීමද සීමා වන්නේය.

අද ලංකාවේ ධනපති පංතියත් ධනපති ආණ්ඩුත් මුහුණ දෙන්නේ ඉහතින් සඳහන් කළ ආකාරයේ අර්බුද චක්‍රයකටය. ආර්ථිකය තවදුරටත් පවත්වාගෙන යාමට නම් දෙගුණයක පරතරයක් ඇති (100%) ක වෙළඳ ශේෂය අවම කළ යුතුය. අයවැය හිඟය අඩුකළ යුතුය. ණය ගෙවීමට ණය ගන්නා, මොහොතින් මොහොත පොලී පැටව් ගසන ණය උගුලෙන් ගැලවිය යුතුය. නමුත්, එලෙස ධනපති අර්බුදයෙන් ගැලවෙන මඟක් ආණ්ඩුවට ඇත්තේ නැත. ඒ වෙනුවට ඔවුන්ගේ සැලසුම වී ඇත්තේ දිනෙන් දින රටත් ජනතාවත් අර්බුදයේ පතුලට ඇද දැමීමය.

ධනපති ක්‍රමය යම් තත්වයකට හෝ අර්බුදයෙන් ගැලවීමට නම් තම ධනපති නිෂ්පාදන මිලදී ගැනීමේ හැකියාව ජනතාවට ඇති කළ යුතුය. ඒ සඳහා අලුතින් වටිනාකම් නිපදවීමේ ක්‍රියාවලියට ජනතාව ඇතුල් කළ යුතුය. එවිට ධනපති සමාජය අර්බුදය වන්නේ අධි නිෂ්පාදනයේ අර්බුදයයි. යළිත් තම ලාභ කොටස අහිමි වීමේ අර්බුදයට ධනපතියා මුහුණ දේ. එයද කැමැත්තෙන් කළ නොහැකිය. ඒ නිසා ධනපති ආණ්ඩු අද ලොව පුරාත් ලංකාව තුළත් මුහුණ දී ඇත්තේ, එකම

15වැනි පිටුවට

# සාමූහික අරගලයක වැදගත්කම පෙන්වන
# මැයි දිනය

එකම අරමුණක් වෙනුවෙන් ලොව පුරා විසිරී සිටින වැඩ කරන කම්කරු කාන්තාවන් හා පිරිමින් එක්ව එකට හඬ නගන දිනය මැයි 01 වෙනිදාය. ජාත්‍යන්තර කම්කරු දිනය ලෙස නම් කර ඇති එම දිනය, වැඩ කරන ජනතාවගේ අයිතීන් වෙනුවෙන් පමණක් නොව යහපත් සමාජ පරිවර්තනයක් උදෙසාද හඬ නගන දිනයක් බවට පත්වී ඇත. තවද සංවිධානය වීමෙන්, අරගල කිරීමෙන් තොරව ධනපති පාලකයින්ගෙන් කිසිවක් ලබාගත නොහැකි බවත්, වැඩ කරන ජනතාවගේ සාමූහික අරගල තුළින් පමණක් ජයග්‍රහණ ලබාගත හැකි බවත් නැවත නැවතත් කියාදෙන දිනයකි.

ධනේශ්වර ක්‍රමය ආරම්භයේදී දවසේ පැය 24න් පැය 12ක 16ක වැඩ කාලයක් පුරා විවේකයක් පවා නොමැතිව, ඉතා දුෂ්කර තත්වයන් යටතේ, ඉතා සොච්චම් වැටුපකට කම්කරු කාන්තා, පිරිමි දෙපක්ෂයටම වැඩ කිරීමට සිදුවිය. කම්හල් හිමියෝ කාන්තා පිරිමි, ළමා කම්කරු ශ්‍රමය රිසි සේ සූරාකමින් ලාභ තර කර ගත්හ. වැඩ කරන පංතියේ මිනිසුන්ගේ මෙම දුෂ්කරත්වය, දරාගත නොහැකි පීඩාව දෙදරා ගියේ අරගල හරහාය. එදා දීර්ඝ වැඩ කාලය අද පැය 8ක් දක්වා කෙටි කර ගැනීමට හැකිවූයේද සංවිධානාත්මකව සිදු කළ අරගල තුළිනි. කෙසේ වුවද එදා ජීවත් වූ කම්කරු ජනතාවට තම ශ්‍රමයට සරිලන නියම වටිනාකමක් නොලැබුණා සේම අද දවසේත් කම්කරු ජනතාවගේ ශ්‍රමයට සැබෑ වටිනාකම හිමිව නැත. (එය කිසිදිනෙක ධනපති පංතියෙන් බලාපොරොත්තු විය හැකිද නොවේ) එහෙයින් තමාට ලැබෙන වැටුපෙන් ජීවත්වීමට නොහැකි තත්වයකට එදා මෙන්ම අද දවසේද වැඩ කරන ජනතාව පත්ව ඇත.

මෙවන් තත්වයක් තුළ සමාජය තුළත් පවුල තුළත් වඩාත් වැඩි පීඩාවකට පත්වන්නේ කාන්තාවන්ය. (සටහන 1) රට තුළ ආර්ථික ක්‍රියාවලියට විශාල දායකත්වයක් සපයමින් ඇඟලුම් කම්හල්වල සේවයේ නියුතු කම්කරුවන්ගෙන් බහුතරයක් කාන්තාවන්ය. ඔවුන් රටේ ජාතික ආදායමේ සැලකිය යුතු කොටස්කාරියන්

ශ්‍රම බලකා සහභාගිත්වය
(කුටුම්භ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස)

| | 2009 | 2010 | 2011 |
|---|---|---|---|
| ස්ත්‍රී | 32.8 | 31.2 | 31.8 |
| පුරුෂ | 66.6 | 67.1 | 66.5 |

සටහන 1

බවට පත්ව ඇතත්, අඩුම තරමේ කම්කරු අයිතීන් ලබා ගැනීමට වෘත්තීය සමිති පවා පිහිටුවා ගැනීමට බොහෝ ආයතන තුළ නොහැකි වී ඇත. ඔවුන්ගේ එම ශ්‍රම වැගිරීමට සාපේක්ෂව ලැබී ඇති පහසුකම් මොනවාද? ඉතා දුෂ්කර රාත්‍රී වැඩ මුරයන්හි වැඩිපුරම නිරත වන්නේ ඇඟලුම් සේවිකාවන්ය. පහත් වැටුපකට තම ශ්‍රමය විකුණමින්, ඉතා දුෂ්කර, පහසුකම් අඩු නවාතැන්වල දිවි ගෙවමින් දැඩි සූරාකෑමකට ලක්වීමට ඔවුන්ට සිදුව ඇත.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි විශේෂයෙන් තේ, රබර් වැනි අංශයන්හි සේවයේ නියුතු කම්කරු ජනගහනයෙන් බහුතරයක් කාන්තාවන්ය. ඔවුන්ද ඉතා පහත් ජීවන තත්වයක් යටතේ සුළු දෛනික වැටුපක් ලබමින් දුක්බිත ජීවිත ගතකරමින් සිටී. (සටහන 2)

2011 වසරේ ඇ.ඩොලර් මිලියන 5145 ක විදේශ විනිමයක් රටට ගෙන ආ මැදපෙරදිග සේවයේ නියුතු පිරිසෙන් 90% ක්ම ගෘහ සේවිකාවන්ය. (සටහන 3) එහෙත් ඔවුන්ට විදේශයන්හි මුහුණ දීමට සිදුවන ගැටලු සම්බන්ධයෙන් පාලක පංතියේ අවධානය කොතෙක්ද යන්න මෑත කාලීනව මැනවින් ඔප්පු කර ඇත. විශේෂයෙන් ගෘහ සේවය සඳහා යන කාන්තාවන්ට විවිධ අතවරයන්ට, ශාරීරික පීඩාවන්ට, අංගවිකල බවට පත්වීමට පමණක් නොව ජීවිතයෙන් පවා වන්දි ගෙවීමට සිදු වූ අවස්ථාවන් පිළිබඳ දිගින් දිගට වාර්තා වීමෙන්ම වගකිව යුත්තන් ඒ සම්බන්ධව ක්‍රියා කරන ආකාරය පිළිබඳව මනාව තේරුම් ගත හැකිය.

එසේම, පරිපාලන ක්ෂේත්‍රය, තාක්ෂණික ක්ෂේත්‍රය, ලිපිකරු, ගුරු ක්ෂේත්‍රය ආදී මෙකී නොකී සියලු ක්ෂේත්‍රයන්හි සේවයේ නියුතු වූවන් පිළිබඳ සලකා බැලුවද ප්‍රතිඵලය එකමය. එනම් තම ශ්‍රමයට නිසි වටිනාකමක් නොලැබීමය. තම අයිතීන් ක්‍රමානුකූලව අහිමි කිරීමය. තම රැකියාවේ ගරුත්වය පහළ වැටීමය.

මෙවන් වටපිටාවක් තුළ කම්කරු පංතියේ බහුතරයක් කාන්තා මෙන්ම පිරිමි පාර්ශ්වයද එක්රැස්ව ඇත්තේ කුමන දේශපාලන ව්‍යාපාර වටාද? තමන්ගේ ශ්‍රමය සූරාකමින්, තමන් මත යැපෙන ධනපති දේශපාලන පක්ෂ වටාය. මෙසේ ධනපති දේශපාලන පක්ෂ නියෝජනය කරන පාට පාට කොඩි වටා කම්කරු කාන්තා, පිරිමි දෙපාර්ශ්වය පෙළ ගැසෙන්නේ, ඔවුන් සතු අනවබෝධය නිසාය. එම අනවබෝධය නිසා ඔවුන්ව විවිධ සිහින ලෝකවල ගිල්වා තැබීමට ධනපති පාලකයන් සමත්ව ඇත. ධනපති පංතිය දේශපාලන වැදගත්කමක් සහිත දිනයක් වූ මැයි දිනයද යොදාගන්නේ වැඩ කරන ජනතාව රැවටීමටත්, ඔවුන්ගේ පාලනයන් සුජාත යැයි පෙන්වීමටත්ය.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දෛනික වැටුප (රුපියල්)

| ක්ෂේත්‍රය | ස්ත්‍රී/පුරුෂ | 2010 | 2011 |
|---|---|---|---|
| තේ | ස්ත්‍රී | 396 | 438 |
| | පුරුෂ | 545 | 617 |
| රබර් | ස්ත්‍රී | 474 | 490 |
| | පුරුෂ | 588 | 658 |
| වී | ස්ත්‍රී | 454 | 530 |
| | පුරුෂ | 658 | 704 |

සටහන 2

ධනපති දේශපාලන ව්‍යාපාර කම්කරුවන් රැවටීමට ජාත්‍යන්තර කම්කරු දිනය යොදා ගැනුණත් එම දිනය කම්කරුවන් විසින් ලබාගත්තේ අරගල කිරීමෙන්ය. තම ජීවිත පවා පුදදෙමින්ය. එදා 1886 මැයි 01 සිට මැයි 04 දක්වා අමෙරිකාවේ චිකාගෝ නුවර කර්මාන්තශාලා ගණනාවක කම්කරුවන් වැඩ කාලය පැය 8කට සීමා කරන ලෙස ඉල්ලා වීදි බැස අඛණ්ඩව උද්ඝෝෂණය කරද්දී, පාලකයෝ එම නිරායුධ කම්කරුවන්ට පොලීසිය ලවා පහර දෙමින්, වෙඩි තබමින් එම අරගලය මර්දනය කිරීමට පියවර ගත්හ. කම්කරුවන් ඝාතනයට ලක්විය. විශාල පිරිසක් තුවාල ලැබූහ. කම්කරු නායකයින් සිරගත කළහ. ඔවුන්ගෙන් පස් දෙනෙකුට මරණ දඬුවම නියම කළහ. එදා කම්කරුවන් රැගෙන ගිය කොඩි ඔවුන්ගේම රුධිරයෙන් රත් පැහැයට හැරෙද්දී අධිෂ්ඨානශීලීව තම අයිතීන් වෙනුවෙන් එකාමෙන් නැගී සිටියහ. මෙම කම්කරු නැගිටීම, අරගල ඉතිහාසය තුළ විශේෂ සිදුවීමක් වූ අතර විවිධ රටවල වාමාංශික ව්‍යාපාරවල නියෝජිතයින්ගෙන් සැදුම්ලත් කොමියුනිස්ට් දෙවන ජාත්‍යන්තරය විසින් මැයි 01 ජාත්‍යන්තර කම්කරු දිනය ලෙස සැමරීමට තීරණය කළේද, එම දිනය සමාජවාදී පරිවර්තනයක් වෙනුවෙන් වූ පුළුල් අරමුණක් සහිත දිනයක් බවට පත් කිරීමට කටයුතු කළේද එනිසාය.

එවන් අරගල ඉතිහාසයක් ඔස්සේ ලබාගත් කම්කරු දිනය අද ධනපති පංතියේ පාලකයන් විසින් හුදු සංදර්ශනයක් බවට පත් කිරීමට උත්සාහ කරන මොහොතක කම්කරු කාන්තාවන් ලෙස මෙවර කම්කරු දිනයේදී සිතා බැලිය යුතු, අවබෝධ කරගත යුතු වැදගත් කරුණක් ඇත. එනම්, සැබෑ කම්කරු රතු ධජය ඇත්තේ කුමන පංතිය සතුවද? යන්නය. එය අවබෝධ කර නොගෙන අප පෙළගැසිය යුතු, නිවැරදි මාවත සොයා ගැනීමට නොහැකි වනු ඇත. එසේම, රෑ දවල් දෙකෙහිම මංමුලාවේ වැටී, අනාගත පරපුරද මංමුලා කරවීමට අපට අයිතියක් ඇත්තේද යන්න දැඩිව සිතා බැලිය යුතු මොහොතකට අප එළැඹ ඇත.

විදේශ සේවා නියුක්තිය

| | 2010 | 2011 |
|---|---|---|
| ස්ත්‍රී | 48.8% | 48.3% |
| පුරුෂ | 51.2% | 51.7% |
| මුළු ගණන | 267,507 | 262,960 |
| ගෘහ සේවිකා | 112,752 | 107,816 |

සටහන 3





ජාතිවාදයට එක පොදු පදනමක් තිබේ. වැඩකරන ජනතාව සූරාකෑම ධනේශ්වරයට පහසුකිරීම සඳහාත් කම්කරු පංතියේ සමගිය දුර්වල කිරීම සඳහාත් සමාජ, ආර්ථික හා දේශපාලන ක්‍රමය දරන ප්‍රයත්නය එම පදනමයි. 'Whits Only. මෙම සංඥාව මම කවරදාකවත් බ්‍රිතාන්‍යයේ නොදිටීමි. එහෙත් ජාතිවාදයේ ලකුණ මම එහිදී හැමදාම දැක ඇත්තෙමි.

**එඩ්ගාර් වෙපොරොව්**
**නොවොස්ති පුවත් සේවයේ**
**ලන්ඩන් වාර්තාකරු**

# සිරියාව:
## මීළඟ මානුෂවාදී යුධ ඉලක්කය



නැටෝව එනම් අධිරාජ්‍යවාදීන්ගේ යුද සංවිධානයට තමන්ගේ කිසිදු සෙබළෙකුගේ ලේ සෙලවීමක් හෝ නොමැතිව ඉලක්කය සපුරා ගැනීමට සමත් වු සටන් බිම් ඉතිහාසයේ පැවැතියේ නැහැ. වියට්නාමය, ඉරාකය, ඇෆ්ගනිස්ථානය ඔවුන් යුද ගොහොරුවල ගිල්වා දැමූ භූමිභාගයනුයි. එහෙත් වියදම වැඩි වුවත් රට තුළ යුධ විරෝධයන් නිර්මාණය කර නොගෙන යුධ මෙහෙයුම් කරන නව ආකාරයක් අධිරාජ්‍යවාදීන් අත්හදා බැලුවා. ඒ, ලිබියාවේදීයි.

අවම හනියක් සිදු කර ගැනීමට අමතරව ඔවුන් එම ආකාරයෙන් තවත් ප්‍රයෝජනයක් ලැබුවා. ඒ අදාල රට තුළ නිසැක ලෙසම ගොඩනැගිය හැකි බරපතළ අධිරාජ්‍ය විරෝධය සීමා කර ගැනීමයි. මන්ද රට තුළින්ම හටයින් සපයා ගැනීමෙන් ගැටුම්වල විනාශකාරීත්වයේ වගකීම ඔවුන් පිටම පැටවිය හැකි නිසයි. විවිධ පරස්පරතා සහිත විපක්ෂයක් පාලනයට ගෙන එමින්, අස්ථාවර, අධිරාජයවාදයට හොඳින් මෙහෙයවිය හැකි ආණ්ඩුවක් නිර්මාණය කර ගැනිමටද අධිරාජ්‍යවාදීන් ලිබියාවෙදී සමත් වුණා. අත්වල ලේ තවරා නොගෙන ආණ්ඩු පෙරළි ඇති කිරිමේ සාර්ථක ලිබියානු අත්හදා බැලීම තවත් රටකදී ක්‍රියාවේ යොදවන්නට අධිරාජ්‍යවාදීන් සූදානමින් සිටිනවා. ඒ, සිරියාවයි.

### අධිරාජ්‍යවාදයේ උණුසුම සොයා

සිරියාවේ සිදුවීම් පෙළ ගැසෙන ආකාරය සමීපව නිරීක්ෂණය කළහොත් එය හා ගඩාෆිගේ ලිබියාව අතර සමානකම් බොහොමයක් හඳුනා ගත හැකියි. ගඩාෆි පාලනයද අධිරාජ්‍යවාදීන් සමග ආර්ථික හා දේශපාලන වශයෙන් දැඩි බැඳීම් ඇතිකර ගෙන තිබුණා. ජනතාව සමග වූ බැඳීම් ලිහිල් වන්නටත් පදනම් වුයේ, එම බැඳීම්. පසුකාලීනව අධිරාජ්‍යවාදයේ සෘජු මැදිහත්වීම් දියත් වන විට අධිරාජ්‍ය විරෝධයේ සටන් පාඨ තුළ සැඟවෙන්නට ගඩාෆි උත්සාහ කළත් ඒ වන විට ප්‍රමාද වැඩියි. මෙබඳුම පරස්පර හැසිරීමක් සිරියාවේ බෂර් අල් අසාද් පාලනය තුළද දැකිය හැකියි. 2006 දී අසාද් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිර්දේශ වැළඳ ගනිමින් ආර්ථික ප්‍රතිසංස්කරණ රැසක් සිදු කළා. එයට සිරියානු ජනතාවට පටි තද කර ගැනීමේ යෝජනා රැසක්ද ඇතුළත් වුණා. වැටුප් කප්පාදුව, මූල්‍ය ඒකක වෙළඳපොළට අනුව තීරණය වන්නට ඉඩදීම, වෙළඳ ප්‍රතිසංස්කරණ හා පෞද්ගලිකරණය ඉන් කිහිපයක්. මෙම ක්‍රියා මාර්ග හේතුවෙන් මෑත වසරවල විරැකියාව සීඝ්‍ර ලෙස ඉහළ ගිය අතර පොදු ජනතාවගේ සමාජීය ජීවන තත්වයන් බරපතළ ලෙස කඩා වැටී තිබෙනවා. සිරියානු ආණ්ඩු විරෝධයට සරු පසක් සකසන්නේ මෙම ආර්ථික පදනමයි.

විය හැකි ලෙසම මෙම තත්වයන් පෙරළා දේශපාලන වියවුල්ද නිර්මාණය කර තිබෙනවා. කලෙක ශක්තිමත්ව පැවති පාලක බාත් පක්ෂයේ ජනතාවාදී ප්‍රතිපත්ති රාමුව පසුබිමට තල්ලු වීමත් සමග ඉදිරියට පැමිණ ඇත්තේ, පාලක පක්ෂයේ නව ලිබරල්වාදී න්‍යාය පත්‍රය වැළඳගත් කණ්ඩායමයි. පෞද්ගලීකරණය ඇතුළු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වට්ටෝරුව විසින් ඉහත කී කණ්ඩායම ආර්ථික වශයෙන් බලවත් හා ධනවත් කල්ලියක් බවට ඔසවා තිබෙනවා. අපේක්ෂා කළ හැකි ලෙසම ඔවුන්ද ඔවුගේ සහය ලබා නිලධාරි කොටස්ද එක්සත් ජනපද හිතවාදී ලෙස හැසිරෙමින් සිටිනවා. මෙම තත්වය ආණ්ඩුව තුළද විශේෂයෙන් හමුදාව සහ බුද්ධි අංශ තුළද ප්‍රබල බව සඳහන්.

### අප්‍රකාශිත නිල යුද්ධය

මේ තත්වය තුළ බටහිර මාධ්‍යයන්හි ආශීර්වාදාත්මක සහයෝගය මත විපක්ෂයේ ක්‍රියාකාරිත්වය අතිශයෝක්තියට නංවමින් ඉදිරිපත් කෙරෙනවා. අරාබි වසන්තයේම පියවරක් ලෙස හුවා දක්වමින් සාමකාමී ජන විරෝධතා ලෙස පෙන්නුම් කෙරුණද මේ වන විට වඩාත් ඉදිරියට යමින් ඇත්තේ අසාද් පාලනයට එරෙහි සන්නද්ධ ක්‍රියාකාරිත්වයයි. තුර්කිය ප්‍රමුඛ සිරියා විපක්ෂයට සහය දෙන රටවල් කණ්ඩායමේ බලකිරීම මත සිරියා ජතික කවුන්සලය (Syrian National Council) ලෙස ඒකරාශි වී සිටින සිරියා විපක්ෂය මේ වන විට සන්නද්ධ සටන්කාමින්ට වැටුප් ගෙවීම ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයත් රටවල් 83 කින් යුත් සිරියා හිතවාදී රටවල් කණ්ඩායමත් ජාතික කවුන්සලයට ඩොලර් මිලියන 100 ක මුදලක් ලබාදී තිබෙනවා.

පසුගිය දා තුර්කියේ ඉස්තාන්බුල්හිදී හමුවූ සිරියා හිතවාදී රටවල නියෝජිතයින් කැරලිකරුවන්ට යුධමය නොවන සැපයුම් ඉහළ නැන්වීමටද තීරණය කර තිබෙනවා. ඒ, එක්සත් ජනපදය ඔවුනට සන්නිවේදන උපකරණ සැපයීමට කටයුතු කරන අතරතුරයි.

### සිරියාවේ අස්ථාවරත්වය

තියුණු කිරීම සඳහා CIA හා MI 6 රහස් ඔත්තු සේවාවන්හි නියෝජිතයින්ද ප්‍රබල වැඩ කොටසක් ඉටු කරමින් සිටින බව සඳහන්. මෙතෙක් නිල අනුමැතිය ලැබී නොමැති වුවද තමන්ගේ රටවල ආණ්ඩු තීරණය කළ වහාම ලබා දීම සඳහා කැරලිකරුවන්ට අවශ්‍ය ආයුධ හා සන්නිවේදන කට්ටල වර්ග හා ප්‍රමාණ පිළිබඳව ඔවුන් සොයා බලමින් සිටින බව ප්‍රකාශ වෙනවා. නිල තීරණයක් නොමැති වුවද විවිධ ක්‍රම මගින් නිදහස් සිරියානු හමුදාව (FSA) නම් සටන්කාමින්ට අවි ගලා එමින් තිබෙනවා. ඔවුනට ප්‍රධානව අසල්වැසි තුර්කියෙන්, අධිරාජ්‍යවාදී යුධ බිමක් වූ ඉරාකයෙන් ලැබෙමින් ඇති අතර සිරියානු ආණ්ඩුවට ගුවන් තහනමක් පනවා ගැනීමටද ක්‍රියා කෙරෙමින් තිබෙනවා. මෙබඳු යෝජනාවක් චීනයේ හා රුසියාවේ විරෝධය හේතුවේන් ආරක්ෂක මණ්ඩලයෙන් අනුමත කර ගැනීමට මෙතෙක් අධිරාජ්‍යවාදී රටවලට නොහැකි වුවද එය ඔවුගේ න්‍යාය පත්‍රයෙන් තවමත් ගිලිහී නැහැ.

### අශුද්ධ සන්ධානය

සැබවින්ම බාහිර ලෝකයේ මුස්ලිම් සටන්කාමීන් හා බටහිර අධිරාජයවාදී රටවල් අතර පවතින දරුණු ප්‍රතිරෝධය සිරියාව තුළ දක්නට නොමැතියි. සිරියාව දැනට මැදපෙරදිග ඉතිරිවී ඇති එකම අනාගමික රාජ්‍යයයි. එය පෙරළීම සඳහා මුස්ලිම් සටන්කාමින්ට ඇති වුවමනාව නෙටෝව විසින් මනාව ප්‍රයෝජනයට ගන්නවා. ඒ, මුජහිඩීන් ගරිල්ලන් සිරියාවේ ක්ෂ් 'ශුද්ධ යුද්ධය' සඳහා බඳවා ගනිමිනුයි. ලිබියාවේදීද මෙලෙසම ක්‍රියාත්මක කළ ඉස්ලාමීය මූලධර්මවාදය ඉස්මතු කිරීම සිරියාවේදීද සාර්ථක ලෙස ක්‍රියාත්මකයි. එපමණක් නොව ලිබියාවේදීද පාවිච්චියට ගත් අබ්දුල් හකිම්ගේ ලිබියා ඉස්ලාමීය සටන්කමී කණ්ඩායම (LIFG) සිරියාවේ ත්‍රස්ත ක්‍රියා මෙහෙයවීම සඳහා දැනටමත් යොදවනු ලැබ ඇති බව පැවසෙනවා. මුස්ලිම් මූලධර්මවාදයට අධිරාජ්‍යවාදීන් ලබාදී ඇති ඉඟිය විය හැක්කේ, අසාද් බලයෙන් පහ කිරීමෙන් පසු අරාබි ෂේක්වරයකුට (එක්සත් ජනපදය හිතවාදී) සිරියාවේ පාලනය භාර කිරීම විය හැකියි. එහෙත් ඔවුන්ගේ ලිබියානු ආදර්ශය තුළ එවැන්නක් නොවූ හෙයින් එය කොතෙක් දුරට මුස්ලිම් සටන්කාමීන් විශ්වාස කරනු ඇත්ද යන්න ගැටලුවක්. අසාත් පාලනය පෙරළා දැමීම සඳහා වෙහෙසන සිරියානුවන් තවත් කොටසකගේ සටන් පාඨයක් වී ඇත්තේ ඒකාධිපති අසාද් පාලනය පෙරළා දමා සිරියාවේ ප්‍රජාතන්ත්‍රවාදය ඇතිකිරීමයි. එහෙත් අධිරාජ්‍යවාදී නෙටෝව සමග එක්වී රටට ප්‍රජාතන්ත්‍රවාදය ගෙන ආ නොහැකි බවට ඊජිප්තුව, ලිබියාව නිදසුන් නොවන්නේ මන්ද යන්න ඔවුන්ට තේරුම් යා යුතුයි. එහෙත් සැලකිල්ලට ගත යුත්තේ, අධිරාජ්‍යවාදින් තමන්ගේ න්‍යායපත්‍රය සඳහා ප්‍රතිරෝධතා සහිත, විවිධ වුවමනාවන් සහිත කණ්ඩායම් කොතරම් සුක්ෂම ලෙස පාවිච්චි කර ගනිමින් සිටින්නේද යන්නයි. එක්සත් ජනපදයේ අධීක්ෂණය තුළ තුර්කිය විසින් විපක්ෂයේ සියලු කණ්ඩායම් එක විය ගසකට බඳ තබා ගන්නට බලවත් වෙහෙසක් ගන්නේ ඇයිද යන්න පැහැදිලියි. අතේ ලේ තවරා නොගෙන සිරියාව තුළ අපරාධ කිරීමේ අවශ්‍යතාව අධිරාජ්‍යවාදීන්ට ඇති තාක් අකමැත්තෙන් හෝ සිරියානු ජාතික කවුන්සලය තුළ රැදී සිටීමට සිරියා විපක්ෂයට සිදු වනු ඇත.

# කියුබාව:
## යටපත් කළ නොහැකි සමාජවාදයේ ආදර්ශය



ඇමරිකානු රාජ්‍ය නායකයින්ගේ 06වැනි සමුළුව පසුගිය අප්‍රේල් මැදදී කොලොම්බියාවේ කාටර්ජිනා නුවරදී අවසන් වුයේ, ඇමරිකා එක්සත් ජනපදයට බරපතළ ජත්‍යන්තර දේශපාලන යථාර්ථයක් පසක් කරමින්. ඒ, වසර 50ක එක්සත් ජනපදය සම්බාධක මැද ලෝක සිතියමෙන් මකා දැමීමට උත්සහ කළද සමාජවාදී කියුබාව එදා ඇමරිකානු කලාපය තුළ කොතරම් බලපෑමක් කළ හැකි රටක් බවට පත්වි ඇත්ද යන්නයි.

ඇමරිකානු රාජ්‍ය නායකයින්ගේ පළමු සමුළුව එක්සත් ජනපද ජනාධිපති බිල් ක්ලින්ටන්ගේ මැදිහත්විම මත ඇරඹෙන්නේ 1994 වර්ෂයේ මියාමිහිදියි. එය නැගී එන චීන බලපෑම් හමුවේ එක්සත් ජනපද ආධිපත්‍යය රාජතාන්ත්‍රික ලෙස ඇමරිකානු කලාපය මත පැටවීමේ අරමුණින් දියත් කරන ලද්දක්. විශේෂයෙන් 60-70-80 දශකවල යුදමය ආධිපත්‍යය මගින් හා රූකඩ ඒකාධිපතියන් බලයේ පවත්වා ගැනීම මගින් කියුබාව හැරෙන්නට සෙසු දකුණු හා ලතින් ඇමරිකානු කලාපය තමන්ගේ ග්‍රහණයට ගැනීමට එක්සත් ජනපදය සමත් වී තිබුණා. එහෙත් ජනතා අරගල උත්සන්න වෙමින් ඒකාධිපතියන්ගේ යුගය අවසන් වෙමින් යද්දී එකසත් ජනපදය ක්ලින්ටන්ගේ රාජ්‍යතාන්ත්‍රික මුහුණුවරට මාරු වෙමින් ආධිපත්‍යය රැක ගැනීමට වෙර දැරුවා. ඇමරිකානු සමුළුව එහි එක් උත්සාහයක් පමණයි. එහෙත් තම සැලැසුම්වලට බාධාවිය හැකි කියුබාව ඊට ඇතුළත් කර නොගැනීමට එක්සත් ජනපදය වගබලා ගත්තා.

කෙසේ වුවත් කලාපයේ එක්සත් ජනපදවිරෝධී ජන මනසේ පිළිබිඹුව එම සංවිධානය තුළ ඉස්මතු වීම වැළක්විය නොහැකි කරුණක් වුණා. 2001 වසරේ කැනඩාවේ ක්විබෙක් සමුළුවේදී ඇමරිකානු රටවල් සඳහා වු නිඳහස් වෙළඳ කලාප (ෂ්) යෝජනාවක් ඉදිරිපත් වන්නේ එ.ජ නව ලිබරල් ධනවාදයේ ගොදුරු බිම් බවට කලාපීය රටවල් පත් කර ගැනීමේ අරමුණින්. එහෙත් එම යෝජනාව කඩදාසිවල පැවතියෙදීම බහුතර රටවල විරෝධය මත වසර 04 කට පසු අත්හැර දමුණා. 2009 වසරේ ට්‍රිනිඩෑඩ් අගනුවර 'පෝට් ඔෆ් ස්පේන්'හිදී පැවති සමුළුව එක්සත් ජනපදයට බරපතළ සංඥාවක් නිකුත් කරනු ලැබුවා. ඒ, මෙම සමුළුවෙන් කියුබාව පිටමන් කර තැබීමට එරෙහිවයි. කියුබාවට එරෙහිව ඇමරිකා එක්සත් ජනපදය විසින් වසර 50 කට ආසන්න කාලයක් පවත්වාගෙන එන සම්බාධක දැඩිව හෙළා දුටු සමුළු රාජ්‍ය නායකයින් කියුබාව කලාපයෙන් වෙන්කිරීමට උත්සහ දැරීම නීතිවිරෝධි බව කියා සිටියා. ඒ, කියුබාව සමුළුවට එක්කර ගැනීමට එරෙහිව එක්සත් ජනපදය තම නිෂේධ බලය යොදන තරමට අසරණ තත්වයක් ඇති කරමින්.

කොලොම්බියාවේ කාර්ටජිනාහිදී ඇමරිකානු රාජ්‍ය නායකයින් 30කගේ සහභාගිත්වයෙන් 2012 අප්‍රේල් සමුළුව ඇරඹෙන්නේ මෙබඳු තත්වයක් තුළයි. ලතින් ඇමරිකානු කලාපයේ වාමාංශික නායකයින්ගේ දැඩි වාග් ප්‍රහාරයට එක්සත් ජනපදය ලක්වන්නේ, කියුබාවට සමුළුවේ දොර වසා තැබීම හේතුවෙන්. වෙනිසියුලාව, බොලීවියාව හා නිකරගුවාව අවධාරණය කළේ, 2015දී පැනමාවේදී පැවැත්වෙන සමුළුව කියුබාවට විවෘත නොවන්නේනම් තමන් ඊට සහභාගි නොවන බවයි. මෙවර සමුළුවට ඉක්වදෝරයේ රෆායෙල් කොරෙයා සහභාගි නොවන්නේද මෙයට විරෝධය පළ කරමිනුයි. සමුළුවේ අනුග්‍රාහක ජුවාන් මැනුවල් සැන්ටෝස් සමුළුව අවසානයේ පැවැත්වූ මාධ්‍ය හමුවේදී පැවසුවේ, එකඟතාවක් නොවූ බැවින් සමුළු ප්‍රකාශයක් නොමැති බවයි. එක්සත් ජනපදයේ ආධිපත්‍යයේ ප්‍රශ්න නොකර පිළිගනිමින් සිටින ඔහු පවා එහිදී කියාසිටියේ, ඊළඟ සමුළුවට කියුබාව සහභාගි වනු ඇති බවට තමන් අපේක්ෂා කරන බවයි. එය කියුබාව ඇමරිකානු කලාපයට කරනු ලැබ ඇති හා කරමින් සිටින බලපෑමේ ස්වභාවය මනාව කැටිකර දැක්වූවා.

කවුළුව හැරී තබමි

# කම්කරු ඇමති, ධීවර ඇමති සහ ජනපති



''මේ ගහකොළ මේ මහපොළව ඔබගේය, එහෙත් ඒ සියල්ල ඔබගේ පමණක් නොව, මතුපරපුර වෙනුවෙන්ද රැකිය යුතුය. පාලකයා යනු ඔබේ දරුවන්ගේ උරුමයෙහි හිමිකරුවා නොව තාවකාලික භාරකරුවා පමණි.''

ඉහතින් සටහන් කරනු ලැබුවේ, 2005 ජනාධිපතිවරණයේදී වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් එළිදක්වන ලද ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවසන් පිටුවේ සඳහන් ප්‍රකාශයයි.

වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ යනු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිවරියගේ නායකත්වය යටතේ පිහිටුවනු ලැබූ පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුවේ කම්කරු ඇමති ලෙසත් ධීවර ඇමති ලෙසත් කටයුතු කළ කෙනෙකි. කම්කරු අයිතීන් ආරක්ෂා කිරීමට කම්කරු ප්‍රඥප්තියක් පිළිබඳව මහාඝෝෂාවක් කළද කම්කරු ඇමති තනතුරේ සිට ජනපති තනතුර දක්වා පැමිණිය පසු ඒ පිළිබඳව කිසිදු කතා බහක් නොමැත. රාජ්‍ය පාලනය වෙනුවෙන් මුලින්ම ආගම සම්බන්ද කරගත් රාජ්‍ය පාලකයා වූ දේවනම්පියතිස්ස අරහයා මීට වසර 2300 කට පමණ පෙර මිහිඳු හිමියන් ප්‍රකාශ කළ බවට කියැවෙන ප්‍රකාශයද තම ජයග්‍රහණය වෙනුවෙන් යොදාගත් මහින්ද රාජපක්ෂ රටේ ජනාධිපතිවරයා බවට පත්විය. සතා සිව්පාවාගේ ජීවත්වීමේ අයිතිය ගැන කථා කළ මහින්ද රාජපක්ෂ, ජීවත්වීම සඳහා ඉතිරි කරගත් තම අර්ථසාධක මුදල කොල්ලකෑමට එරෙහිව පාරට පැමිණි රොෂේන් චානක වෙඩි තබා ඝාතනය කළේය. රෝෂේන් චානක කම්කරුවාගේ ජීවිතය බිළිගත්තේ කම්කරු ප්‍රඥාප්ති ගැන කථා කළ හිටපු කම්කරු අමාත්‍යවරයාය. තෙල් මිල ඉහළ දැමීමත් සමඟ ජීවත්වීමේ අවදානමකට මුහුණ දුන් ධීවර ජනතාව සමඟ එයට එරෙහි වූ ධීවර කාර්මික ඇන්තනිගේ ජීවිතයද හිටපු ධීවර අමාත්‍ය මහින්ද විසින් උදුරා ගත්තේය. කම්කරුවන්ගේ පාලකයා ලෙස කම්කරුවෙක්ද, ධීවරයින්ගේ පාලකයා ලෙස ධීවර කාර්මිකයෙක්ද, බිලිගෙන මේ මොහොතවන විට ජනතාවගේ පාලකයා වී සමස්ත ජනතාවම පීඩාවට ලක්කරමින් සිටින්නේ එකම පුද්ගලයාය.


# ෂැවොලින් ටෙම්පල්

එය ද්වන්ද සටනකි. දෙදෙනාම එකිනෙකා පරයමින් සටනේ නියැළෙමින් සිටිති. එක් සටන්කරුවෙකු ෂැවොලින් පන්සලේ පුහුණුව ලැබූ සටන්කරුවෙකි. අනෙකා ෂැවොලින් පන්සලේ පුහුණුව නොලැබූවද සටන් ක්‍රම ප්‍රගුණ කරනු ලැබුවෙකි. දෙදෙනා අතර අවසන් සටන සිදුවන්නේ, කණ්නාඩි සවිකළ කාමරයකය. තම ප්‍රතිවාදියාට පහරදීමට ෂැවොලින් සටන්කරුට නොහැකි වන්නේ, සෑම කණ්නාඩියකින්ම ප්‍රතිවාදියාගේ රුව පෙනෙන නිසාය. ''තම ප්‍රතිවාදියා තමාට වඩා ප්‍රබලනම් ප්‍රථමයෙන් සිදු කළ යුත්තේ ඔහුගේ ප්‍රතිරූපයට පහරදීමය'' යන තම ගුරුවරයාගේ උපදෙස ෂැවොලින් සටන්කරුගේ මතකයට එයි. ඒ සමඟම ඔහු සියලුම කණ්නාඩිවලට පහර දී අවසානයේ තම ප්‍රතිවාදියාට පහරදේ. ඉහත සඳහන් වනුයේ ෂාවොලින් සටන් ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා නිෂ්පාදනය කරන ලද සිනමා පටයක කොටසකි.



වර්තමානයේ අධිරාජ්‍යගැති ධනපති පංතිය සහ අධිරාජ්‍යවිරෝධී ජනතා විමුක්ති පෙරමුණ අතර ද්වන්ද සටනක් නිර්මාණය වී ඇත. අධිරාජ්‍යවාදීන් හමුවේ යටත් කර ගනු ලැබීම හෝ අධිරාජ්‍යවාදයෙන් සහ අධිරාජ්‍යවාදී පාලකයින්ගෙන් රට බේරා ගෙන සමානාත්මතාවය සහිත සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීම සටනේ අවසානය විය හැක. ධනපති පංතියේ ප්‍රතිවාදියා වී සිටින්නේ, ජනතා විමුක්ති පෙරමුණය. එහි ක්‍රියාකාරිත්වය සහ ජනතාව තුළ නිරිමාණය කර තිබෙන ප්‍රතිරූපය ඉතා ප්‍රබලය. එහි එක් ප්‍රධාන සාධකයක් වන්නේ ජනතාව තුළ ගොඩනගා තිබෙන දැවැන්ත විශ්වාසය වේ. ''තම ප්‍රතිවාදියා ප්‍රබලනම් ඔහුගේ ප්‍රතිරූපයට පහර දිය යුතුය.'' වත්මන් පාලක පංතිය අභ්‍යන්තර සතුරන්ද, බාහිර සතුරන්ද, ප්‍රයෝජනයට ගනිමින් ජනතාව තුළ නිර්මාණය වි තිබෙන දැවැන්ත ප්‍රතිරූපයට පහර දීමට පටන්ගෙන ඇත. ෂැවොලින් චිත්‍රපටයේ ප්‍රතිවාදියා එක් පුද්ගලයෙකු වුවද වත්මන් අරගලයේදී පාලක පංතියේ ප්‍රතිවාදියා වූ ජනතා විමුක්ති පෙරමුණ යනු එක් පුද්ගලයෙකු නොවන බව පාලක පංතිය නොදන්නවා විය හැක.

# අපායේ ඉන්ටර්වල් එක



ධනපති ක්‍රමය විසින් මිහිපිට නිර්මාණය ඇති අපාය නොදකිනා ජනතාව කටු ඉඹුල් ,ලෝදිය ඇති අපාය පිළිබඳව මිථ්‍යා විශ්වාසයක් ඇති කරගෙන එහි යාමට බියෙන් සිටී. තමන්ට දෙතිස් වදයම ලබාදෙන ධනපති පංතියේ යමපල්ලන් නොදකින ජනතාව අපායේ යමරජු සිතින් මවාගෙන සිටී. මනඃකල්පිතයක් ලෙස නිර්මාණය කොට ඇති අපායට යාමට අකමැති ජනතාව විනෝදාස්වාදය සඳහා වෙසක් කාලයේදී ප්‍රදර්ශනය කරන අපාය දැක ගැනීමට අශා කරයි. විනෝදයක් ලැබීම සඳහා අපාය හොඳ වුවද සැමදා ජීවත්වීමට අපාය හොඳ තැනක් නොවේ.

මෙම මනඃකල්පිත අපායට ලංකාවේ පුද්ගලයෙක් ගියේය. අපායක සිට තවත් අපායකට පැමිණ බැවින් තමන් කැමැති දඬුවමක් තෝරාගන්නා ලෙස යමරජු නියෝග කළේය. කටු ඉඹුලේත්, ලෝදිය හැලියේත් අමාරුකම තේරුම්ගත් ඔහු අසූචි වළක සිගරට්ටුවක් බොමින් සිටින තරුණයෙකු සිටින දඬුවම තෝරාගත්තේය. ඒ සමඟම සීනුව නාද වූ අතර විවේක කාලය අවසන් බැවින් ඔලුවෙන් සිටගන්නා ලෙස අසූචි වලේ සිටි තරුණයාට නියෝග කෙරිණි. අප රටේ ජනතාවටද දේශපාලන ඉන්ටර්වල් එකක් ලැබේ. එය මැතිවරණ කාලයයි. මිහිපිට අපායේ යමරජු සහ වදකයෝ ජනතාවට අරක්කු, සිගරට් සහ දන්සැල්ද, කෝටියක් පොරොන්දුද දෙති. ඉන්ටර්වල් බව තේරුම් නොගන්නා ජනතාව යමරජු සහ යම පල්ලන් තෝරා ගනියි. දැන් ජනතාවට සිදු වී ඇත්තේ දේශපාලන ඉන්ටර්වල් එකෙන් පසුව උදාවන දුෂ්කර තත්වයට මුහුණ දීමටය. කන්කෙදිරිගෑම් එමටය. මරලතෝනි නිමක් නැත. ආඬපාලි නිමක් නැත. දැන් යමපල්ලන් තෝරාගත් කෙනෙකුද නැත. දේශපාලන ඉන්ටර්වල් එකක් ලැබෙන තුරු සිටිනවාද, දේශපාලන ඉන්ටර්වල් එකක් ගන්නවාද යන්න ජනතාව සිතා බැලිය යුතුය.

# පොලිටිකල් පංතිය

අවුරුදු නිවාඩුවෙන් පස්සෙ පංතිය පටන් ගෙන්නා මුල්ම දවස. පොලිටික්කා පංතියට ආවේ වෙනදා මූණෙන් නෙමෙයි. ''ඇයි සර් නැකත වැරදුනාද'' මුලින්ම ප්‍රශ්නය දැම්මේ වසන්තිය. වසන්ති පොලිටික්කාගේ අප්සට් එක එළියට ගන්න බැලුවා.

''ඇයි ළමයෝ එහෙම ඇහුවෙ. කාටද නැකත වැරදුනේ? පොලිටික්කා ඇහුවේ බබා පාට් එකට. ''ඇයි සර් ශිරන්ති නෝනා කවන්න ගිහිල්ලා කිරිබත් කෑල්ල හලා ගත්තේ, බන්දුල 2500යෙන් කන්න ගිහිල්ලා අනා ගත්තා වගේ!''

මම ඔය නැකත් ගණන් ගන්නේ නෑනේ'' පොලිටික්කා ඇහුණා නෑහුණා ගානට දවසේ මාතෘකාවට එන්න උත්සාහ කළා. ''ළමයි අද මාතෘකාව විදේශ ප්‍රතිපත්තියේ නොබැඳි ප්‍රතිපත්තිය''

මාතෘකාව කියන කොටම පංතියට හිනා ගියා.

''කාගෙද නොබැඳිය? ඇමරිකාවෙද? ඉන්දියාවෙද? ලංකාවෙද?'' නක්කලේට වගේ එහෙම ඇහුවේ සමනයා.

'' ඉන්දියාව නම් අවුරුද්දට ආවේ 'නොබැඳි ප්‍රතිපත්තිය' මතක් කරලා යන්න. ඉන්දියාව ඉතිං ලොකු අයියනේ! ලංකාව චූටි නංගි! ඇත්තටම චූටිම නංගි!'' අනුරුද්ධිය කට ඉස්සර කරගත්තා.

''වවුනියාවේ එවුන් ඉන්න හිටින්න තැන් නැතුවට ඉල්ලන්නෙ තර්ටීන් ප්ලස්මනෙ.'' උත්තර බැන්දෙ පොලිටික්කාටම හරියන තුෂාරය.

පොලිටික්කාගෙ මූණ කරවල වගේ බැදුණු වගේ. ''ඇත්තටම සර් මොකක්ද අද අප්සෙට් එක, හරියට හෝන් එක ගහලා අහුවෙලා දඩ කෑවා වගේනේ? සීට් බෙල්ට් නොදා ඇවිත් ඔන්ද ස්පොට් රු. 1000ක් වත් ගෙව්වද? ''වසන්තියා කටු අත්ත වගේය.

''මම හිතන්නේ මෙදාපාර ගනුදෙනුවට බැංකුවට යන්න බැරි වෙලා''කමල් සක්කයක් ගැහුවා.

''දැන් බැංකුවල දෙනු නෑ! තියෙන්නේ ගනු විතරයි! ගනුදෙනු බැරිවෙන පොලී නග්ගලා'' සමනා අහස්කූරක් යවලා බැලුවා.

''අපේ ගෙදර වැඩ අල්ලන නැකතට වැඩ ඇල්ලුවේ කළුවරේ. බුබුලක් හරි නිවලා ඉතිරි කරන්න චම්පික ඇමතිතුමා කියල තිබුණානේ. අනුභවය තිබුණේ මරු වෙලාවට. කවුරුත් අනුභව කළේ 2500ට හරියන විදියට. '' චමියා කිව්වේ පොලිටික්කාව පටලවගන්න.

''පොලිටික්කාගේ මුහුණ අච්චාරු දාල වගේ තියෙන්නේ එනව කියපු සුනාමිය ආපු නැති හින්ද?'' සමනා නව නිපැයුම්කරුවෙක් වුණා.

'' සුනාමිය ආවේ නැති එකට කණගාටු ඇයි?'' වසන්ති ඇහුවේ ඇත්තටම නොදන්නා හින්ද.

''සුනාමි ආවහම, ආයෙත් ආධාර එනවා. මිනිසුන්ට බඩු මිල අමතක වෙනවා. ආයෙත් එන්.ජී.ඕ. එනවා. රුපියලේ අර්බුදේ ගොඩ යනවා. ආණ්ඩුවත් ගොඩ! සරුත් ගොඩ!'' සමනාගේ විග්‍රහය පටන් ගත්තා. ''උත්තර ලැබෙන සුනාමි වස්තුව නාපු එකට මේ මුහුණ අමාවක වෙලා'' සමනයා ආණ්ඩුවේ බඩු මිල එස්.එම්.එස්. එවනවා වගේ එක දිගටම කියවාගෙන ගියා.

කිරි මුට්ටිය උතුරුවා ගන්න බැරි වුණු මහින්ද මහත්තයා මුට්ටිය මාරු කරලා ෂේප් වුණා වගේ පොලිටික්කා මාතෘකාව කළුලෑල්ලෙ ලියලා කොරිඩෝවට පැන්නා, කැන්ටිමට යන්න.

## 3 පිටුවෙන් ආණ්ඩුව මං මුලාවීම...



මූලික ප්‍රශ්න විසඳා ලීමට ආණ්ඩුව කටයුතු නොකිරීමේ ඵලවිපාකවලට මුහුණ දීමට සිදුව ඇත්තේ, ආණ්ඩුවට නොව ජනතාවට හා රටටය. ජිනීවා යෝජනා සම්මත කරගත් අධිරාජ්‍යවාදීන් විසින් මේ ප්‍රශ්නය හැසිරවීම තමන් අතට ගෙන තිබේ. ජිනීවා යෝජනාවට පක්ෂව ඡන්දය දුන් ඉන්දියාව, එක්සත් ජනපදය සමග අත්වැල් බැඳ ගෙන ලංකාව 'බලය බෙදීමේ' තම ඉලක්කයන් වෙතට තල්ලු කරමින් සිටී. මේ පිළිබඳ කිසිම හැඟීමක් නැති ආණ්ඩුව ඉලක්කයක් නැතිව අඳුරේ අතපතගාමින් සතුරන්ගේ අරමුණු ඉටුකර ගැනීමට උදව් කරමින් සිටී. ඉන්දියාව බලය බෙදීම සඳහා ලංකාවට කරන බලපෑම දැන් තීව්‍ර වෙමින් තිබේ. පසුගිය අප්‍රියෙල් 16-18 දිනවල ලංකාවට පැමිණි ඉන්දීය පාර්ලිමේන්තුවේ විපක්ෂ නායිකාව ඇතුළු මන්ත්‍රී කණ්ඩායමේ සංචාරය මගින් කියාපාන්නේද එයයි. ඔවුන්ගේ සංචාරයේ මතුපිට අරමුණ ''දෙමළ ජනයාගේ දුක සැප බැලීම''වුවද සැබෑ අරමුණ එක් අතකින් ලංකාවේ ආණ්ඩුවට 13ට එහා බලය බෙදන ලෙස බලකිරීමය. අනෙක් අරමුණ ඉන්දියාව තුළ ඔවුන්ගේ දේශපාලනයට වාසි ලබාගැනීමය. තමිල්නාඩු දෙමළ ජනයාගේ සහාය තමතමන්ට දිනාගැනීමේ තරඟය විසින් ලංකාවට වන ඉන්දීය මැදිහත්වීම වැඩිකරමින් තිබේ. මැතිවරණ ආසන්න වනවිට මෙය තීව්‍රර වේ. පසුගියදා කරුණානිධි කළ ප්‍රකාශය ඊට උදාහරණයකි. ඔහු පවසා තිබුණේ, ලංකාවේ වෙනම දෙමළ රාජ්‍යයක් පිහිටුවීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට යෝජනාවක් ඉදිරිපත් කොට සම්මත කළ යුතු බවය. මර්වින් සිල්වාගේ වර්ගයේ, වීරවංශ හා චම්පික වර්ගයේ දේශපාලනඥයන් බොහෝ රටවල සිටින බව ඇත්තය. නමුත් කරුණානිධිගේ ප්‍රකාශය එතරම් සරල නොවේ. මේ පිළිබඳව ලංකාවේ ආණ්ඩුව කටයුතු කරන්නේ, 'කුම්බලා මාළු කෑ බළලා' වගේය.

ඉන්දීය පාර්ලිමේන්තුවේ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ ලංකා චාරිකාවේ ඉතාම වැදගත් සිදුවීම වාර්තා වන්නේ ඔවුන් උතුරේ කළ සංචාරයේදීය. එහිදී ඔවුන් මැණික්ෆාම් කඳවුර ඇතුළු අවතැන් කඳවුරුවලට ගොස් දෙමළ ජනයා හමුවී තිබේ. එම හමුවීම්වලදී තිබූ ඉතාම වැදගත්ම විශේෂය වූයේ උතුරේ සාමාන්‍ය දෙමළ ජනයා තමන්ට වෙනම දෙමළ රාජ්‍යයක් හෝ බලය බෙදීමක් හෝ 13 ප්ලස් ඉල්ලා නොසිටීමය. එවැන්නක් කිසිදු මාධ්‍යයක වාර්තා වූයේ නැත. දෙමළ ජනයා ඉල්ලා සිටියේ මොනවාද? ඒ තමන්ගේ අහිමි වූ ඉඩම් තමන්ට නැවත ලබා දෙන ලෙසය. සිරගතවූවන් නිදහස් කර දෙන ලෙසය. තමන්ව තමන්ගේ උපන් ගම්බිම්වල පදිංචි කරවන ලෙසය. ජීවත්වීමට අවශ්‍ය අවම පහසුකම් ටික ලබා දෙන ලෙසය. නිදහසේ ජීවත්වීමට හැකි වටපිටාවක් ලබාදෙන ලෙසය. එනම් සිවිල් පාලනය ස්ථාපිත කරන ලෙසය. මේ ගැන මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව ලජ්ජා විය යුතුය. ඒ මෙලෙස තමන්ට හිමි අයිතිය තමන්ට අවශ්‍ය පහසුකම් ටික ලබාගෙන ලංකාව තුළ සමගියෙන් ජීවත්වීමට බලා සිටින ජනතාවක් අධිරාජ්‍යවාදීන්ගේත් ඉන්දියාවේත් න්‍යායපත්‍රයට තල්ලුකරමින් සිටින්නේත් යළි බෙදුම්වාදය වෙත තල්ලු කරමින් සිටින්නේත් රාජපක්ෂ ආණ්ඩුව වන නිසාය.

සැබවින්ම 'වෙන්වීම' ජනතාවගේ වුවමනාව නොවේ. වෙන්කිරීම අධිරාජ්‍යවාදයේත් ඉන්දියානු ආධිපත්‍යවාදයේත් වුවමනාවය. උතුරේ දෙමළ ජාතික සන්ධානයත් දෙමළ ධනපති පංතියත් කටයුතු කරන්නේ එම වුවමනාව වෙනුවෙනි. නොඑසේම ජනතාවගේ වුවමනාවන් අනුව නොවේ. බේදවාචකය නම් රාජපක්ෂ ආණ්ඩුවද දෙමළ ජාතික සන්ධානයට දොස් තබමින් ඒ අරමුණ වෙනුවෙන්ම ක්‍රියාකිරීමය. දෙමළ ජනයාගේ ඉල්ලීම හඳුනා ගන්නවා වෙනුවට, ඊට ඇහුම්කන් දෙනවා වෙනුවට, එහි අතිශය සාධාරණ ඉල්ලීම් ඉටුකරනවා වෙනුවට රාජපක්ෂ පාලනය ඇහුම්කන් දෙන්නේ අධිරාජ්‍යවාදීන්ට හා ඉන්දියාවටය; ඉටුකරමින් සිටින්නේ ඔවුන්ගේ ඉල්ලීම්ය. බේදවාචකය වන්නේ එයයි.

අරමුණක් නැතිව අයාලේ යන, යන්නේ කොහේද? යන්නේ කෙසේද?යන්නේ කා සමගද? නොදැන වල්මත්ව ඉබාගාතේ ඇවිදින හා ජනතාවද වල්මත් කර ඇති වර්තමාන පාලනය තවදුරටත් රට තුළ පැවතීමට ඉඩහැරීම ඉතාම බේදජනක සිදුවීම් සඳහා හේතුවනු ඇත. අරමුණක් නැතිවීම මංමුලාව මේ ආණ්ඩුවේ ජානගත ලක්ෂණයකි. වත්මන් ධනවාදය තුළ පරාධීන ධනපති ආණ්ඩුවකින් මීට වඩා යමක් බලාපොරොත්තු විය නොහැක. මේ ධනපති ආණ්ඩුවේ ස්වභාවයයි. එබැවින් රාජපක්ෂගේ ධනපති ආණ්ඩුවට 'මගකියාදීමට' කල්පනාකර වැඩක් නැත. රාජපක්ෂ ආණ්ඩුවේ සංදර්ශනවලට, මැජික්වලට තවදුරටත් ජනතාව මෝහනයවීමට ඉඩදිය යුතු නැත. එබැවින් නව මගක් ගැනීමට සියලු අධිරාජ්‍යවිරෝධීන්, දේශප්‍රේමීන්, ප්‍රගතිශීලීන් පියවර ගත යුතුය.

මඟ නොදැන යන ධනපති ආණ්ඩුවේ පාලනයෙන් රටත් ජනතාවත් මුදාගෙන රටත් ජනතාවත් ජයග්‍රහණ වෙත මෙහෙයවිය හැකි සැබෑ ජනතා ව්‍යාපාරයක වුවමනාව මතුව තිබෙන්නේ, මේ තත්ත්වය තුළය. එබැවින් යන්නේ කොහේද යන්නත්, යන්නේ කෙසේද යන්නත් හොඳින්ම වටහා ගෙන සිටින සැබෑ වමේ ව්‍යාපාරය ලාංකේය සමාජය තුළ සිටින සැබෑ අධිරාජ්‍යවිරෝධීන්ට දේශප්‍රේමීන්ට, ප්‍රගතිශීලීන්ට මඟ පෙන්වීමේ වගකීමට උරදිය යුතුය. ඒ සඳහා වන විෂය මූලික තත්වයන් දැන් රට තුළ නිර්මාණය වී තිබේ. එය හොඳින්ම හඳුනාගෙන ඊට අනුව ක්‍රියාමාර්ග ගනිමින් අධිරාජ්‍යවාදයටත් ඉන්දීය ආධිපත්‍යවාදයටත් දුබල දේශීය ධනවාදයටත් එරෙහි සමාජවාදය ඉලක්ක කරගත් පුළුල්තම අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරය වමේ නායකත්වය සහිතව බිහිකිරීම මේ මොහොතේ අත්හළ නොහැකි වගකීම වී තිබේ.

## 11 පිටුවෙන් ආණ්ඩුවේ වියදම ...

වර්ගයේ අර්බුදයන්ටය.

මේ අර්බුදයේ සැබෑ විසඳුම ඇත්තේ, පැහැදිලිවම සමාජ පරිවර්තනයක් සමඟ පමණක් යැයි අප පැහැදිලි කරන්නේද මෙම ධනපති අර්බුද චක්‍රය නිසාමය. ධනපති ආර්ථිකය තුළ කළ නොහැකි දේ නිෂ්පාදනය වැඩි කිරීමය; එසේම, ජනතාවට මිලදී ගැනීමේ හැකියාව ලබා දීමය. ජනතාවට මිලදී ගැනීමේ හැකියාව (ක්‍රය ශක්තිය) ඇති කිරීමට නම් ධනපතියා කම්කරුවාට, නොගෙවා තමන් සන්තක කරගන්නා කොටස කම්කරුවාට, ශ්‍රමය වගුරන ජනතාවට දිය යුතුය. එවිට ඔහුගේ මිලදී ගැනීමේ හැකියාවද, ඒ භාණ්ඩ අලෙවි වන නිසාම යළි යළිත් නිෂ්පාදනයේ යෙදීමේ වුවමනාවද යන කරුණු දෙකම ඉෂ්ඨ වේ. එවිට අගහිඟයකින් තොරව ජනතාවටද ලැබෙන අතර නිෂ්පාදන ක්‍රියාවලියද අඛණ්ඩව හා වේගවත්ව සිදුවේ.

අද අවශ්‍යව ඇත්තේ, ජනතාව කන බොන දේ පවා කප්පාදු කර වියදම පාලනය මගින් පිළියම් සොයන ආර්ථික නොවේය. ඒ වෙනුවට අවශ්‍යව ඇත්තේ ජනතාවද වියදම් කරන, වියදම් කිරීමට ආදායම ජනිත කරන, ඒ අතරම නිෂ්පාදන ක්‍රියාවලියද අද පවතින දුප්පත් මට්ටමට වඩා ඉහළ දැමිය හැකි ආර්ථිකයකි. එය ඉටු කළ හැක්කේ ඔළු ගෙඩි මාරු කිරීමෙන් නොව සැබෑ ලෙසම ආර්ථික දේශපාලන ව්‍යුහයම වෙනස් කරන පරිවර්තනයකින්ය.

අද අවශ්‍යව ඇත්තේ, ජනතාවගේ ආදායම අහිමි කරන හා ජනතාවගේ සොච්චම පවා දඩ, බදු ගැසීම් මඟින් හා උදුරා ගන්නා පාලනයක් නොව, ජනතාවගේ අතට ආදායම ජනිත කරන, මිලදී ගැනීමේ ශක්තිය වර්ධනය කරන ආර්ථිකයකි. ඒ සඳහා ජනතාව නිෂ්පාදන ක්‍රියාදාමයට බද්ධ කළ යුතුය. ජනතාවට නිෂ්පාදනයේ ප්‍රතිලාභ සාධාරණව බෙදී යා යුතුය. ඒ, ජන සහභාගී සංවර්ධනයේ සත්‍ය ප්‍රතිඵලයයි. එය ඉටු කළ හැක්කේ, ඓතිහාසිකව යල් පැන යන දුබල ධනපති ක්‍රමයට නොව නූතන සමාජවාදී ආර්ථිකයක් තුළදී පමණි.

## 5 පිටුවෙන්



වශයෙන් මෙන්ම ලෝක පරිමාණයෙන්ද දැවැන්ත අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරයකින් තමයි අධිරාජ්‍යවාදය පැරදවිය හැකි වන්නේ. ඒ නිසා ජාතික වශයෙන් මෙන්ම ලෝක පරිමාණයෙන්ද දැවැන්ත අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරයක් බිහිකළ යුතු වෙනවා. එහිදී අධිරාජ්‍යවාදය මෙන්ම එහි දේශීය ඒජන්තයින් ලෙස කටයුතු කරන පරාධීන දේශීය ධනපති පාලකයන්ද පරාජයට පත් කිරීම සඳහා වූ දැක්මක් හා අරමුණක් අධිරාජ්‍යවිරෝධී ව්‍යාපාරය සතුවිය යුතු වෙනවා.

***නියමුවා:- ලංකාවේ මහින්ද රාජපක්ෂ පාලනය අධිරාජ්‍යවිරෝධී එකක් බවත් එක්සත් ජනපදය ජිනීවා යෝජනා සම්මත කළේ ඒ නිසා බවත් පවසනවා. මෙය සත්‍යයක්ද?***

***ටිල්වින් සහෝදරයා:-*** කිසිසේත්ම නැහැ. මහින්ද රාජපක්ෂ පාලනය කුමන ආකාරයකින්වත් අධිරාජ්‍යවිරෝධී හෝ එක්සත් ජනපදවිරෝධී නැහැ. එක්සත් ජනපදය ජිනීවා යෝජනාව සම්මත කළේ රාජපක්ෂ පාලනය අධිරාජ්‍යවිරෝධී නිසා නොවෙයි. දැනටමත් අධිරාජ්‍යවාදීන් සමඟ ඔවුන් වෙනුවෙන් කටයුතු කරන ආණ්ඩුව තව තවත් ඔවුන්ට යටකර ගැනීමටයි. ගොනා කරත්තය ඇදගෙන යද්දී සමහර කරත්තකාරයෝ ගොනාට කෙවිටෙන් තලනවා. ඒ ගොනා කරත්ත අයිතිකාරයට විරුද්ධ නිසා නොවෙයි. ගොනාගේ ගමන තව වේගවත් කර ගැනීම සඳහායි. ගොනාගෙන් තවත් වැඩ ගැනීමට ගොනා බියවද්දා ගැනීම සඳහායි. මේකත් ඒ වගේ දෙයක්.

අනෙක් කාරණය මේ වන විටත් රාජපක්ෂ ආණ්ඩුව බොහෝ පැතිවලින් එක්සත් ජනපදය සමඟ එක්ව කටයුතු කරනවා. අපි කලිනුත් සඳහන් කළ පරිදි මේ ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තිය තීරණය කරන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලයි. ඉතින් මේ අය අධිරාජ්‍යවිරෝධී වෙන්නේ කොහොමද? මේ අය අධිරාජ්‍යගැති නිසා තමයි පසුගිය මාසයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලංකාවට වෙන්කළ ණය වාරිකයේ 7වැනි කොටස නිකුත් කළේ. අනෙක් අතට රාජපක්ෂ ආණ්ඩුව 2007 මාර්තුවල එක්සත් ජනපද ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ ආරක්ෂක ගිවිසුමක් අත්සන් කළා. එයට අත්සන් කළේ අරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂයි. එය තවම වලංගුව තියෙනවා. එක්සත් ජනපදය ෆැසිපික් කමාන්ඩ් යන හමුදා ඒකකය නිතර ලංකාවට පැමිණෙනවා. ලංකාව හා එක්ව සමහර කටයුතු කරනවා. ඉතින් මේ ආණ්ඩුව එක්සත් ජනපදවිරෝධී වෙන්නේ කොහොමද? ඒ වගේ ආර්ථිකයේදී ලංකාවේ ලිහිසි තෙල් බෙදාහැරීම සිදුකරන්නේ එක්සත් ජනපද සමාගමක් වුණ කැල්ටෙක්ස් සමාගමයි. එම සමාගම හා ලංකාව අතර තිබූ ගිවිසුම දෙවන වරට අලුත් කළේ රාජපක්ෂ පාලනය තුළයි. ඇමරිකානු ඩෝල් සමාග මට කෙසෙල් වැවීමට පොළොන්නරුවෙන් ඉඩම් අක්කර 5000ක් දීමට තීරණය කළෙත් මේ ආණ්ඩුවමයි.

ඒ නිසා මේ ආණ්ඩුව එක්සත් ජනපදවිරෝධී හෝ අධිරාජ්‍යවිරෝධී එකක් නොවෙයි. එහි ආර්ථික දේශපාලන යුදමය වුවමනාවන්ට අනුව කටයුතු කරන ආණ්ඩුවක්. මේ ආණ්ඩුව හා අධිරාජ්‍යවාදීන් අතර සමහර ප්‍රතිවිරෝධයන් තියෙන්න පුළුවන්. ඒව බරපතළ වෙනස්කම් නොවෙයි. වර්තමාන ආණ්ඩුව වඩා වැඩියෙන් අවනත කර ගැනීම සඳහා අධිරාජ්‍යවාදීන් ක්‍රියාමාර්ග ගැනීමයි මෙහි තිබෙන්නේ.

***නියමුවා:-මේ තත්වය තුළ ලංකාවට එරෙහි අධිරාජ්‍යවාදී මැදිහත්වීම් පරදවීමට ජ.වි.පෙ. යෝජනා කරන්නේ කුමක්ද?***

***ටිල්වින් සහෝදරයා:-*** පැහැදිලිවම අධිරාජ්‍යවාදී මැදිහත්වීම් පැරදවීම සඳහා ඊට හැකියාව සහිත අධිරාජ්‍යවිරෝධී දේශපාලන ව්‍යාපාරයක් අවශ්‍ය වෙනවා. එය අප මුල සිටම දුටු දෙයක්. අප ඉදිරිපිට නව පන්නයේ ජාතික විමුක්ති අරගලයක් තිබෙන බව අප විශ්වාස කරනවා. අපේ උපායමාර්ගය වන්නේ, ජාතික විමුක්ති අරගලය හරහා සමාජවාදයට යාමයි. ඒ අනුවත් මේ මොහොතේ අධිරාජ්‍යවාදයේ බරපතළ මැදිහත්වීම අනුවත් පුළුල් අධිරාජ්‍යවිරෝධී පෙරමුණක් අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරයක් අවශ්‍ය වෙනවා. එවැනි පුළුල්තම අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරයක් ගොඩනැගීම තමයි අපේ අරමුණ.

***නියමුවා:-මෙම අධිරාජ්‍යවිරෝධී පෙරමුණේ සංයුතිය, එහි නායකත්වය එහි කාර්යභාරය වැනි කරුණු පිළිබඳව පැහැදිලි කිරීමක් කළොත්?***

***ටිල්වින් සහෝදරයා:-*** මේ යුගයේ ගොඩනැගෙන සැබෑ අධිරාජ්‍යවිරෝධී පෙරමුණක නායකත්වය අනිවාර්යයෙන්ම පැවරෙන්නේ වමේ ව්‍යාපාරයට. මේ යුගයේ අපේ රට වැනි පසුගාමී දුබල ධනපති රටවල අධිරාජ්‍ය විරෝධයත් ධනේශ්වර විරෝධයත් එකට ගැට ගැහිලා තියෙනවා. ඒ නිසාම සැබෑ අධිරාජ්‍යවිරෝධී පෙරමුණක නායකත්වය වමේ ව්‍යාපාරය ගත යුතු වෙනවා. ලංකාවේදී එහි වගකීම පැවරෙන්නේ ජ.වි.පෙ.ටයි.

වමේ නායකත්වය වටා සැබෑ අධිරාජ්‍යවිරෝධී, දේශප්‍රේමී, ප්‍රගතිශීලී බලවේග ඒකරාශී කළ යුතු වෙනවා. මෙහිදී දේශපාලන පක්ෂවල එකතුවකට වඩා සිදුවිය යුත්තේ ජනතා බලවේග යන්ගේ එකතුවකුයි. පවතින තත්වය තුළ සමාජ ආර්ථික දේශපාලන යන හැම අර්ථයෙන්ම අධිරාජ්‍යවාදයෙන් බැටකන හා අධිරාජ්‍යවාදයට එරෙහිව නොසැලී සටන් කිරීමේ හැකියාව ඇති බලවේගය වන්නේ වැඩකරන ජනතාවයි. එනම් කම්කරු පංතිය, ගොවි ජනතාව, ධීවර ජනතාව වැනි ආර්ථිකයට දායකවන වැඩකරන ජනතාවයි. එම නිසා අප ගොඩනගන අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරයේ පෙරමුණු කාර්යභාරය කම්කරු පංතිය ප්‍රමුඛ වැඩකරන ජනතා බලවේගයන්ට පැවරෙනවා. ඒ වගේම තරුණ පරපුර, කාන්තාවන්, ශිෂ්‍යයන් අධිරාජ්‍යවිරෝධී අරගලයේ සටන්කාමී කණ්ඩායම් වෙනවා. ඔවුනුත් බලවේගයක් ලෙස එක්විය යුතුයි. එහිදී සිංහල, දෙමළ. මුස්ලිම් හැම දෙනෙක්ම මෙම අරගලය තුළ පෙළගැස්විය යුතු වෙනවා. ඊට අමතරව උගතුන්, බුද්ධිමතුන්, මාධ්‍යවේදීන්, කලාකරුවන් පරිසරවේදීන් ආදී ස්ථර තුළ සිටින අධිරාජ්‍යවිරෝධී, දේශප්‍රේමී කොටස් හා පුද්ගලයන්ද රටට ආදරය කරන පුද්ගලයන්ද අධිරාජ්‍යවිරෝධී පෙරමුණක කොටස්කරුවන් බවට පත්වෙනවා. ඒ අනුව ඉහත සඳහන් සියලුම සංවිධාන පුද්ගලයන් හා සමාජ ක්‍රියාකාරීන් වමේ නායකත්වයෙන් ඒකාබද්ධ කරන පුළුල්තම අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරය අප ගොඩනැගිය යුතු වෙනවා. එය ලෝකය පුරා සිටි අධිරාජ්‍යවිරෝධී බලවේග සමග අත්වැල් බැඳග නිමින් අධිරාජ්‍යවාදයට එරෙහිව සටන්කරන හා ලංකාව තුළ පසුගාමී දුර්වල ධනවාදයට එරෙහිව සටන්කොට ලංකාව සැබෑ ලෙසම අධිරාජ්‍යවාදී මැදිහත්වීම්වලින් මුදවා නව සමාජවාදී පාලනයක් නිර්මාණය කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක විය යුතු වෙනවා.

***නියමුවා:-හොඳයි, අවසාන වශයෙන් මෙවැනි අධිරාජ්‍ය විරෝධී ජනතා ව්‍යාපාරයක් ගොඩනැ-ගීමට දැනට ගෙන ඇති පියවරයන් හා ඉදිරි ක්‍රියාමාර්ග මොනවාද?***

***ටිල්වින් සහෝදරයා:-*** මේ වන විටත් අපි විවිධ සංවිධාන එනම් වෘත්තීය සමිති ගොවි, ධීවර සංවිධාන හා අධිරාජ්‍යවිරෝධී බලවේග හා පුද්ගලයන් සමඟ සංවාදයක් ආරම්භ කර තිබෙනවා. එවැනි අයගේ දායකත්වයෙන් අපි රට තුළ සම්මන්ත්‍රණ මාලාවක් ආරම්භ කළා. ඉන් කිහිපයක් දැනටමත් පවත්වලා තිබෙනව. ඊට ජනතාවගේ හොඳ ප්‍රතිචාරයකුත් තිබෙනවා. අප තවත් විවිධ සංවිධාන හා කණ්ඩායම් සමඟ හා විශේෂ පුද්ගලයින් සමඟ සාකච්ඡා පවත්වමින් යනවා. එම සාකච්ඡා ඉතාම සාර්ථක තත්වයක තිබෙනවා. ඒ අනුව අපි ඉතාම ඉක්මනින් මෙම අධිරාජ්‍යවිරෝධී ජනතා ව්‍යාපාරය සංවිධානයක් ලෙස එළිදැක්වීමට බලාපොරොත්තු වෙනවා. ඉන්පසු එය දැවැන්ත බලවේගයක් ලෙස ගොඩනැ-ගීම හා ඒ මගින් අධිරාජ්‍යවිරෝධී සටනට ජනතාව ඒකරාශී කිරීම අපේ අරමුණ වෙනවා. මොනතරම් බාධක ආවත් අපි මේ කාර්යය අනිවාර්යයෙන්ම ඉටුකරනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල. දුර. 0112-785612 ෆැක්ස් - 0112-786050
Email: niyamuwanews@gmail.com web.- www.jvpsrilanka.com


## ආගම් අතර ගැටුමකට ඉඩ නොතබමු!

පසුගියදා දඹුල්ලේ දී ඇතිවූ ආගමික ස්ථාන මුල්කරගත් ගැටලුව හා ගැටුම තවමත් විසඳී නැති බව පෙනේ. මෙය වඩාම සාධාරණ ආකාරයකට විසඳ ගැනීමට අදාල පාර්ශවයන් උත්සාහ නොදරන්නේ නම් හා මෙය සාධාරණව විසඳාලීමට ආණ්ඩුව කටයුතු නොකරන්නේ නම් මෙම ප්‍රශ්නය තවත් අනාගත ව්‍යසනයක ආරම්භය බවට පත්වීමේ අනතුර තිබේ.

කිසියම් ඉදිකිරීමක ගැටලුවක් තිබේනම්, එකී ඉදිකිරීම් සිදුකොට ඇත්තේ නීතියට අනුකූලව නොවේ නම් එවැනි නෛතික ගැටලු විසඳ ගත යුත්තේ නීති මාර්ගයෙන් මිස නීතිය පසකලා විවිධ ආගමික කණ්ඩායම් අතර ගැටුම් නිර්මාණය වන ලෙස හැසිරීමෙන් නොවේ.

තමන් කැමති ආගමක් ඇදහීමට, ආගම් වැඩිදියුණු කරගැනීමට ඕනෑම කෙනෙකුට අයිතිය තිබේ. ඒ අතරම තමන්ගේ ආගම අදහන අතර අන්‍ය ආගම්වලට ගරු කිරීමටද ජනතාව පුරුදු විය යුතුව තිබේ. එසේ නොමැතිව ආගමික උන්මාදයන්ගෙන් කටයුතු කිරීම ශිෂ්ට සම්පන්න සමාජයකට ගැලපෙන්නේ නැත. ජනතාව අතර සාමය, සමගිය, සහයෝගය ගොඩ නැගීමට මුල්විය යුතු ආගමික සංස්ථාවන් ඒ වෙනුවට ජනතාව අතර ගැටුම් ඇතිකරීමට මුල් වන්නේනම් එය ඉතා හානිකර වනු ඇත.

''අනවසර ආගමික ස්ථාන ස්ථාන'' ඉවත් කිරීමේ ප්‍රකාශිත අරමුණෙන් දඹුල්ලේදී හදිසියේ මෙවැනි ගැටුමක් මතුවන්නේ ඇයිද යන්න ගැඹුරින් විමසා බැලිය යුතුය. මේ පිටුපස විවිධ පටු අරමුණු වෙනුවෙන් කටයුතු කරන පිරිස් හා පුද්ගලයින් සිටිය හැක. මෙහිදී වඩාත් බරපතළ වන්නේ ආණ්ඩුව මේ සම්බන්ධයෙන් හැසිරෙන ආකාරයයි. මේ ප්‍රශ්නයේදී ආණ්ඩුව තුළ එක මතයක් නැත. (සෑම ප්‍රශ්නයකදීමත් එලෙසය) එක් එක් ඇමතිවරු විවිධ පාර්ශව ගෙන ප්‍රකාශ නිකුත් කරති. විවිධ පාර්ශව වෙනුවෙන් කටයුතු කරති. එමගින් ඔවුන් වගකීමක් සහිතව මැදිහත්වී ගැටලුව විසඳනවා වෙනුවට 'ඇවිලෙන ගින්නට පිදුරු' දමති.

සැබැවින්ම මේ මොහොතේ මෙවැනි ආගමික ගැටුමක් අවශ්‍යව ඇත්තේ, ආණ්ඩුවටත් ආණ්ඩුව ඇතුලේ සිටින බංකොලොත් අන්තවාදී ඇමතිවරුන්ටත්ය. රටේ මතුවී ඇති සමාජ ආර්ථික දේශපාලන ප්‍රශ්නවලට පිළියම් නැති, ඒ නිසාම ජනතාවගේ විරෝධයට ලක්ව ඇති ආණ්ඩුවට එම විරෝධය වෙන පැත්තකට හැරවීම අවශ්‍යවී තිබේ; සමාජ ආර්ථික ප්‍රශ්නවලින් ජනතාවගේ අවධානය වෙනත් ගැටලුවලට යොමුකිරීමට වුවමනා තිබේ. කලක් ජාතිවාදය අවුළුවා තම ඡන්ද පදනම රැකගැනීමට කටයුතු කළ ධනපති පක්ෂ හා ආණ්ඩු දැන් ආගම් ප්‍රශ්න අවුළුවා ඒ මගින් තම ඡන්ද පදනම රැකගැනීමට උත්සාහ කරනවා විය හැක. ඒ අනුව ආණ්ඩුව දඹුල්ල සිදුවීම 'දඹුලුත් ගිහින් තලගොයිත් මරා ගැනීමේ ' වුවමනාවට යොදාගන්නා බව පැහැදිලිය.

ඉතිහාසය පුරා ජාතිවාදය අවුළුවා, ජාතිවාදී කෝලාහල අවුළුවා ජනතාව භේදකිරීමේ ප්‍රතිඵලය වුයේ වසර 30 ක් පුරා පැවති බෙදුම්වාදී යුද්ධයක් රට තුළ නිර්මාණය වීමය. එම බෙදුම්වාදී යුද්ධය මෙරටටත් ජනතාවටත් කළ විනාශය සුළුපටු නොවේ. ඉන් අහිමිවූ ජීවිත ප්‍රමාණය හා දේපළ ප්‍රමාණය මිල කළ නොහැකිය. එවැනි අති බිහිසුණු අත්දැකීමක් ලැබූ රටක් ඉන් පාඩම් ඉගෙන නොගන්නේනම්, තවත් එවැනිම වර්ගයේ ප්‍රතිඵල ගෙනදියහැකි ආගමික ගැටුමක් වැළැක්වීමට කටයුතු නොකරන්නේ නම් එය ඛේදවාචකයක්ම වනු ඇත.

බෙදුම්වාදී යුදධය මහා විනාශයකින් පසු අවසන්ව තිබුණත් එහි අතුරු ප්‍රතිඵල තවමත් අපේ රටට බලපාමින් තිබේ. මානව හිමිකම් දඩමීමා කරගෙන අධිරාජ්‍යවාදීන් ලංකාවට අත පොවමින් සිටින්නේ එහි අතුරු ප්‍රතිඵල නිසාය. මානව හිමිකම් අවියක් කරගනිමින් ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්නවලට අධිරාජ්‍යවාදීන් මැදිහත් වෙමින් සිටින වෙලාවක ආගම් අතර ගැටුමක් ඇතිවීම අධිරාජ්‍යවාදයට තවත් අවස්ථාවක් ලැබීමක් වනු ඇත. එබැවින් කුමන අරමුණකින් සිදුකළද මේ අවස්ථාවේ ආගමික ගැටුම් නිර්මාණය කරන්නන් ඉටු කරන්නේ අධිරාජ්‍යවාදයේ වුවමනාවන්ය; ප්‍රතිගාමිත්වයේ වුවමනාවන්ය. අප රටේ පොදු ජනතාව මෙවැනි ගැටුමකට ඉඩ නොතැබිය යුත්තේ ඒ නිසාය.

ආගම් අතර ගැටුම් අවුළුවා ඉන් නිර්මාණය වන ගැටුම්කාරී තත්වය තුළ බොරදියේ මාළු බෑමට ආණ්ඩුවත් ආගමික අන්තවාදය තම පැවැත්ම වෙනුවෙන් යොදාගන්නා විවිධ ආගම්වලට අයත් ඇමතිවරුන් ඇතුළු දේශපාලකයනුත් කැමති වනු ඇත. ඊළඟ මැතිවරණයකදී ආගම්වාදී රැළි මත පිහිනා දේශපාලනයෙන් ගොඩවීමට ඔවුන් කල්පනා කරනවා විය හැක. මෙවැනි හානිකර ආගමික ගැටුම් ඇති කිරීමට මෙන්ම එවා නොවිසඳා පවත්වාගෙන යාමට ඔවුන් දරන උත්සාහයෙන් එය පැහැදිලි වෙමින්ද තිබේ. එහෙත් ආගමික ගැටුම් ආණ්ඩුවට හා එහි සමහර කොටස්වලට තාවකාලික වාසි ගෙන දුන්නද රටටත් ජනතාවටත් ගෙන එන්නේ, තාවකාලිකව මෙන්ම දිගුකාලීනවද අර්බුදයන්ය; අනතුරුදායක තත්වයන්ය; ඛේදවාචකයන්ය. එබැවින් දඹුල්ලේදී සිදුවූ සිදුවීම් ආගම් අතර ගැටුමක් බවට පත්වීමට ඉඩනොදී එය වළක්වාලීමත් එවැනි ගැටුම් සඳහා ජන මනස උසිගන්වන වර්ගයේ හැඟීම් බර ප්‍රකාශයන්ට හසු නොවීමටත් රට තුළ සියලුම ජනතාවන් අතර සමගිය තහවුරු කිරීමටත් අවබෝධයෙන් මැදිහත්වීම සිංහල දෙමල මුස්ලිම් බර්ගර් මැලේ ආදී සියලුම ජනතාවගේ වගකීම බව අපි අවධාරණය කරමු.

## 41 fjkswfmaaúre iurefjka








ඉතාලියේ නාපෝලි නුවරදී..

## ආණ්ඩුව ජාතික ප්‍රශ්නය සමග සෙල්ලම් කිරීම නතර කළ යුතුයි!

### ජනතා විමුක්ති පෙරමුණ



ඉන්දියාවටත් බටහිර අධිරාජ්‍යවාදී රටවලටත් ජිනීවා මානව හිමිකම් කොමිසම වැනි ආයතනවලටත් ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්න දඩමීමා කර ගනිමින් බලපෑම් කිරීමට හැකිවූයේ ආණ්ඩුවේ දෙබිඩි පිළිවෙත හේතුවෙන් බව අවධාරණය කළ ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, ආණ්ඩුව තමන්ට බලපෑම් කරන විවිධ පුද්ගලයන් සහ සංවිධාන ඉදිරියේ යටත්වී මේ රටේ ජනතාවට සම්පූර්ණයෙන්ම වෙනස් දෙයක් කියමින් රවටන බව පෙන්වා දුන්නේය. කෙසේ වුවද ජාතික ප්‍රශ්නය සෙල්ලමක් නොවන බැවින් ජාතික ප්‍රශ්නය මුල්කරගෙන රට තුළ මතුවෙමින් තිබෙන තත්වය ඉතා බරපතළ බවට ජනතා විමුක්ති පෙරමුණ අනතුරු අඟවන්නේ යැයිද ඔහු ප්‍රකාශ කළේය.

ඔහු මේ බව පැවසුවේ පසුගිය 23වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය.

''ඉන්දීය පාර්ලිමේන්තුවේ විපක්ෂ නායිකාව ඇතුළු නියෝජිතයින් ලංකාවට අවුරුදු නෑගම් ආවේ නැහැ. මේ පැමිණීම ගැන ජනතා විමුක්ති පෙරමුණ විශේෂ කරුණු කිහිපයක් නිසා දැඩි අවධානයක් යොමු කර තියෙනවා. යුද්ධය අවසන්වීමෙන් පසුව උතුරේ අවතැන් කඳවුරුවලට ලංකාවේ ජනතාව නියෝජනය කරන මහජන නියෝජිතයින්ට හෝ යාමට අවස්ථාව නොදී ඉන්දීය විපක්ෂ නායිකාව ඇතුළු මහජන නියෝජිතයින්ට යාමේ අවස්ථාව ලබාදුන්නා. ආරක්ෂක ලේකම්වරයාගෙන් ලියාපදිංචි තැපෑලෙන් ලිඛිත ඉල්ලීම් කළත් අපිට ජනතාවගේ ප්‍රශ්න ගැන සොයාබැලීමට ඉඩ දුන්නේ නැහැ.


පසුගියදා දිවයිනට පැමිණි ඉන්දීය විදේශ කටයුතු ඇමති ක්‍රිෂ්ණා මහතා ලංකාවේ විදේශ ඇමති ජී.එල්.පීරිස් මහතා සමග එකට වාඩිවී 13 ප්ලස් දීමට ජනාධිපතිවරයා එකඟ වූ බව පැවසුවා. ඒ වගේම ඉන්දියාවේ මෙම මහජන නියෝජිතවරුන් බලය බෙදීමට ආණ්ඩුව එකඟ බව ප්‍රකාශ කළා. ක්‍රිෂ්ණා මහතා පැමිණි අවස්ථාවේ සේම මෙවරද ඉන්දීය නියෝජිතයින් නික්ම ගිය පසු ජනාධිපති මාධ්‍ය ප්‍රකාශක බන්දුල ජයසේකර මහතා එවැනි පොරොන්දුවක් නොදුන් බව ප්‍රකාශ කර තිබෙනවා.

උතුරේ අවතැන් කඳවුරුවල ප්‍රශ්න සියල්ල විසඳා ඇති බව ආණ්ඩුව ප්‍රකාශ කර තිබුණා. නමුත් ඉන්දීය නියෝජිතයින්ගේ සංචාරයෙන් අනතුරුව හෙළිවී තිබෙන්නේ, 6000කට අධික පිරිසක් තවමත් එම කඳවුරුවල සිටින බවයි. පසුගියදා ඇතිවූ සුළඟින් නිවාස එක්දහස් ගණනක් කැඩී බිඳී ගියා. ඒ ජනතාව ජීවත්වන අන්ත දුඃඛිත තත්වය තවදුරටත් වසන්කළ නොහැකියි. ඒ වගේම ඉන්දීය නියෝජිතයින් හමුවේ ඒ ජනතාව දහතුන්වෙනි සංශෝධනය හෝ එය ඉක්මවා ගිය බලයක් ඉල්ලුවේ නැහැ. හොඳ තත්වයේ පරිප්පු ටිකක් ලබාදෙන්න කියලයි ඉල්ලුවේ. ඒ වගේම තමන්ගේ මුල් ගම්බිම්වල පදිංචි කරන්න කියලයි කීවේ. යුද්ධය අවසන් වී සතියක් ඇතුලත ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට ඉදිරිපත් කළ යෝජනාවල මේ කරුණු ඇතුළත් කළා. සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිසමක් පිහිටුවන්න කීවා. ආණ්ඩුව ඒ කිසිවක් ගණන් ගත්තේ නැහැ. යුද්ධය අවසන්වී වසර 03කට පසු නැවත විවිධ ස්වරූපයෙන් මතුවෙන්නේ ඒ ජනතාවගේ ඇත්ත වේදනාවන්. ඉන්දියාව ඇතුළු විදේශ බලවේග සියල්ල ලංකාවේ ආර්ථික දේශපාලන ක්ෂේත්‍රවලට මැදිහත් වෙන්නේ, මානව අයිතිවාසිකම් ඇතුළු මේ ප්‍රශ්න දඩමීමා කරගෙනයි. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට දැඩිව බලකරන්නේ ජනතාවගේ මේ මූලික අයිතිවාසිකම් ප්‍රශ්න විසඳන්න කියලයි.''






## නියමුවා වෙතින් නව ප්‍රකාශන දෙකක්





කොළඹ 10, පංචිකාවත්ත පාරේ අංක 198/19 හි පදිංචි එම්. ටිල්වින් සිල්වා වන මා විසින් අංක 70 මිෂන් පාර, පිටකෝට්ටේ පිහිටි ආර්. සී. ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.